ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව

# වාර්ෂික වාර්තාව සහ ගිණුම්
# 2013

රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

## දැක්ම

ගංවතුරින් තොර පරිසර හිතකාමී
පරිසරයක් සහ දූෂණයෙන් තොර ජලාශ
ඇතිකිරීමේ සහ කළමනාකරණය
කිරීමේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර

ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ
නැංවීම සඳහා ඉහළ
කාර්යක්ෂමතාවයක් සහ අභිප්‍රේරණයක්
සහිත කාර්ය මණ්ඩලයක් මඟින් වැසි
ජල අපවහන,තෙත්බිම් කළමනාකරණ
සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා
ඉංජිනේරු සේවා සැපයීම.

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| ***සභාපතිතුමාගේ පණිවුඩය*** | **1** |
| සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය | **3** |
| සංයුක්ත තොරතුරු | **4** |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | **6** |
| සංවිධාන ව්‍යුහය | **7** |
| මෙහෙයුම් සමාලෝචනය | **8** |
| අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | **69** |
| විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය 2013 | **71** |
| සම අයිතියේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය | **72** |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය | **73** |
| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය | **75** |
| වැදගත් ගිණුම් ප්‍රතිපත්ති | **77** |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | **82** |
| මූල්‍යමය විශේෂතා | **94** |
| 2013 වර්ෂයේ විශේෂතා | **95** |
| ඒකාබද්ධ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | **97** |
| ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන | **98** |
| සම අයිතියේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය | **99** |
| ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහය | ***101*** |
| ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සඳහා සටහන් | **103** |

## සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකාව "ආසියාවේ ආශ්චර්යය" බවට පත් කිරීම සඳහා වන අතිගරු ජනාධිපතිතුමාගේ දර්ශනය යථාර්තයක් බවට පත් කිරීම සඳහා රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. සංස්ථාවේ මුල් අරමුණු කෙරෙන් වෙනස්ව යමින් ශ්‍රීලඉගොසසං වර්තමානයේදී ජලාශ, පාරිසරික උද්‍යාන, කුඹුරු වැනි දේ සෑදීම තුලින් නගර සඳහා නව මුහුණුවරක් ලබා දෙමින් පරිසර හිතකාමී වටපිටාවක් නිර්මාණය කිරීමේ යෙදී සිටී. දිවයිනෙහි ගංවතුරින් තොර පරිසරයක් පවත්වා ගනිමින්ම මෙම කාර්යයන් සිදු කරමින් පවතී.

රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් ලබා දෙන ලද අපරිමිත සහාය සමඟින් ශ්‍රීලඉගොසසං 2013 වර්ෂයේදී එහි අරමුණු සාක්ෂාත් කරගෙන ඇත. ඔහු විසින් ලබා දුන් දායකත්වය සිදුකරගෙන යනු ලබන කාර්යයන් පිළිබඳව සංස්ථාවට මඟපෙන්වීම පමණක් නොව අරමුදල්, මිනිස් බලය වැනි දේ ලබාගැනීම සම්බන්ධයෙන් කලින් කලට ඇති වන ගැටළු නිරාකරණය කරගැනීම සඳහා මැදිහත් වීමද තුලින්ද සිදු විය.

2014 වර්ෂයේදී සම්පූර්ණ කරනු ලබන මයුර පෙදෙස සහ සාලමුල්ල නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘති වල නිවාස ඒකක විශාල සංඛ්‍යාවක් ඉදිකිරීම් මෙහෙයවීම සඳහා සංස්ථාව රජයට සහාය දක්වමින් සිටී. සංස්ථාව මෙවැනි ව්‍යාපෘති සිදුකරන ලද ප්‍රථම වතාව මෙය වේ.

ප්‍රධාන වශයෙන් කොළඹ පුරවර ප්‍රදේශයහි ගංවතුර බලපෑම අඩු කිරීම සඳහා ලෝක බැංකු ආධාර ලැබූ කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (MCUD) හා සම්බන්ධ කාර්යයන් සංස්ථාව විසින් 2012 වර්ෂයේ අප්‍රේල් මාසයේදී ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ, සංස්ථාවට යන්ත්‍රසූත්‍ර සහ උපකරණ රාශියක් ලැබුනු අතර මෙම යන්ත්‍රසූත්‍ර වලින් උපරිම ප්‍රතිදානය ලබා ගැනීම සඳහා ඒ හා සම්බන්ධ තාක්ෂණික කාර්ය මණ්ඩලයට විදේශ පුහුණුවක් ලබා දෙන ලදී. රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් මෙම ව්‍යාපෘතිය කළමනාකරණය කරනු ලැබේ.

කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශ වල සීඝ්‍ර නාගරීකරණයට එදිරිව ස්වභාවික පාරිසරික පද්ධතියක් පවත්වා ගැනීමේ වැදගත්කම සළකමින් සංස්ථාව මහ කොළඹ ජලාධාර ප්‍රදේශයේ පවතින තෙත්බිම් සඳහා තෙත්බිම් කළමනාකරණ සැලැස්මක් සකස් කර ඇති අතර තලවතුගොඩ ජෛව විවිධත්ව උද්‍යානය ඉදිකිරීම 2013 වර්ෂයේදී ආරම්භ කර ඇත.

සංස්ථාව විසින් වේරැස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අදියර I හි ඉදිකිරීම් කාර්යයන් 2013 වර්ෂයේදී ආරම්භ කරන ලදී. නුගේගොඩ රත්තනපිටිය ප්‍රදේශයේ ආසන්න වශයෙන් මීටර් 3056 ක් දිග ඇළ මාර්ග කොටසක් පුනරුත්ථාපන කිරීම 2013 වර්ෂයේදී සම්පූර්ණ කර ඇත. සිදු කර ඇති කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 330 කි.

පසුගිය වර්ෂයේ පිරිවැටුම වූ රු.මි. 2173 ට එදිරිව 2013 වර්ෂයේදී සංස්ථාව විසින් සිදු කරන ලද කාර්යයන්හි මුළු පිරිවැටුම රු.මි. 1477 කි. මුහුදු වැලි තොග සංචිතයෙහි පවතින මුහුදු වැලි වල ක්ලෝරයිඩ් ප්‍රමාණය ඉහළ අගයක පැවතීම හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්ත සඳහා නුසුදුසු වීම නිසා සංස්ථාවට කිසිදු මුහුදු වැලි විකිණීමක් සිදු කිරීමට නොහැකි වීම 2013 වර්ෂයේ ලාභය අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම හේතුව නිසා පසුගිය වර්ෂය හා සැසඳීමේදී සංස්ථාවේ දළ ලාභය 41% කින් අඩු වී ඇත.

අවසන් වශයෙන්, අපගේ රේඛීය අමාත්‍යාංශයේ අමාත්‍ය අතිගරු ජනාධිපතිතුමාට සහ ඔහු නොසිටින්නට 2013 වර්ෂය සඳහා අප විසින් සැලසුම් කරන ලද කාර්යයන් මෙතරම් පහසුවෙන් සිදු කිරීමට නොහැකි විය හැකිව තිබූ රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතාට මාගේ ස්තුතිය පිරිනැමිය යුතු වේ. අමාත්‍යාංශ නිලධාරීන්, කළමනාකරණ මණ්ඩලය, සංස්ථාවේ කළමනාකාරීත්වය සහ කාර්ය මණ්ඩලය, ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය, අපගේ ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ඔවුන්ගේ සේවාවන් නියමිත වේලාවට ලබාදුන් කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් ගේ දායකත්වයද මම අගය කරමි.

**හර්ෂන් ද සිල්වා, ගෘහ නිර්මාණ ශිල්පී**
සභාපති
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය

# සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය

2013 වර්ෂය තුල සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රගතිය ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අධිකාරියේ ලේකම් ගරු ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නායකත්වය සහ මහපෙන්වීම සහ ශ්‍රී.ල.ඉ.ගො.ස.ස. වේ කාර්ය මණ්ඩලයේ කැපවීම හා වෙහෙස මහන්සි වී වැඩ කිරීමේ ප්‍රතිඵලයකි. එබැවින් සංස්ථාව රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සාර්ථක සහ ලාභ ලබන ආයතන වලින් එකක් බවට පත් වී ඇත.

2012 වර්ෂයේ මුළු පිරිවැටුම වන රු.මි. 2173 හා සැසඳීමේදී 2013 වර්ෂය තුල මුළු පිරිවැටුම රු.මි. 1477කි. 2012 වර්ෂයේ ලාභය වන රු.මි.32 හා සැසඳීමේදී 2013 වර්ෂයේ බදු පෙර ලාභය රු.මි. 118කි. ප්‍රධාන වශයෙන් මුහුදු වැලි විකිණීම පහළ යෑම හේතුවෙන් සමඟ 2012 වර්ෂයේ දළ ලාභය වන 22%ට එරෙහිව සංස්ථාවේ දළ ලාභය 21% දක්වා මදක් පහත වැටී ඇත.

2012 වර්ෂයේ අවසන් කාලසීමාවේදී සහ 2013 වර්ෂය ආරම්භයේදී අළුතින් පොම්ප කරන ලද මුහුදු වැලි තොගය අධික වර්ෂාවෙන් සේදී යෑමට ලක්වීම තුලින් අනුමත ක්ලෝරයිඩ් මට්ටමට ලඟාවීම සඳහා ගත වූ කාලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු සඳහා නිකුත් කිරීමට යෝග්‍ය නොවිණි. එබැවින් 2013 වර්ෂයේදී ප්‍රධාන වශයෙන් ගොඩකිරීම් කටයුතු සඳහා පමණක් මුහුදු වැලි අළෙවි කරන ලදී.

කෙසේවෙතත්, වර්තමානයේදී රු. 1,975,225,408 ක වටිනාකමකින් යුත් මුහුදු වැලි තොගය ඉදිකිරීම් කාර්යයන් සඳහා භාවිතා කල හැකි වේ. මෙම මුහුදු වැලි තොගය ඉදිරි අළෙවි කටයුතු සඳහා ප්‍රමාණවත් වේ.

කොළඹ නාගරික අලංකරණ වැඩසටහනේදී සංස්ථාව ඇළ සහ ඇළ මාර්ග සංවර්ධනය වැනි බොහොමයක් ක්ෂේත්‍ර වල ක්‍රියාකාරීව නිරත විය. කොළඹ නගරයෙහි නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා සාලමුල්ලෙහි සහ වැල්ලවත්ත මයුර පෙදෙසෙහි බහු මහල් ගොඩනැගිලි ඉදිකිරීම සංස්ථාව විසින් ආරම්භ කරන ලද වැදගත් ඉදිකිරීම වලින් සමහරකි. සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගනිමින් සංස්ථාව සියළුම ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්ගේ සමස්ත ඵලදායීතාවය, කාර්යක්ෂමතාවය සහ ලාභදායීභාවය වැඩි දියුණු කරගෙන ඇත.

කොළඹ පුරවර ප්‍රදේශයේ ගංවතුර හේතුවෙන් ඇතිවන භෞතික සහ සමාජ ආර්ථික බලපෑම් අවම කිරීම සහ ප්‍රමුඛ ප්‍රාදේශීය යටිතල පහසුකම් සහ සේවා වැඩිදියුණු කිරීම තුලින් ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරමින් පවතින නාගරික පුනරුත්ථාපන වැඩසටහන් වලට සහාය දැක්වීමේ අරමුණින් කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ එක් නියෝජිතායතනයක් ලෙස ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව පත් කර ඇත. මෙම ව්‍යාපෘතිය 2012 වර්ෂයේ අප්‍රේල් මස ආරම්භ කර ඇති අතර 2017 වර්ෂයේ ජූනි මස නිම කිරීමට සැලසුම් කර ඇත.රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘතිය කළමනාකරණය කරනු ලබන අතර ක්‍රියාවට නැංවීමේ වගකීම් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව ඇතුළු ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ නියෝජිතායතනය තුනකට පැවරී ඇත.

තවද රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ මහපෙන්වීම යටතේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව වේරුස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ නියෝජිතායතනය ලෙස ලත් කර ඇත. ගංවතුර වැළැක්වීමේ ප්‍රධාන අරමුණ සමඟින් සංස්ථාව වේරුස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සිදු කරන ලද අතර මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කර ඇති ක්‍රියාකාරකම් සමහරක් වන්නේ පවතින ඇළ මාර්ග පද්ධතිය පුළුල් කිරීම, ඉවුරු ආරක්ෂණය,ගංවතුර රැඳවීමේ ජලාශ වෙන් කිරීම, පවතින බෝක්කු සහ පාලම් වැඩිදියුණු කිරීම , නව ව්‍යුහ ඉදිකිරීම සහ අවට ප්‍රදේශ අලංකරණය කිරීම වේ.

සංස්ථාවේ ආචාර ධර්ම රාමුවට අනුකූලව ඉංජිනේරුම විශිෂ්ටත්වය සහ සම්පත් භාවිතා කරමින් තිරසාර යටිතල ව්‍යුහ සංවර්ධනය සහ පරිසර හිතකාමී පරිසර සඳහා උපායමාර්ගික සහකරු ලෙස සංස්ථාව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සැලකිය යුතු ලෙසින් දායකත්වය දක්වා ඇත.

අවසන් වශයෙන්, සමාලෝචිත වර්ෂය සාර්ථකත්වයට පත් කර ගැනීම සඳහා නන් අයුරින් සහාය ලබා දුන් රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා, සභාපතිතුමා, ශ්‍රී.ල.ඉ.ගො.ස.ස.වේ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ ශ්‍රී.ල.ඉ.ගො.ස.ස.වේ කාර්ය මණ්ඩලය, රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ යටතේ ඇති අනෙකුත් ආයතන වල නිලධාරීන්, ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය, අපගේ සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ අනෙකුත් සියළු උනන්දුවක් දක්වන්නන් හට මාගේ අවංක කෘතවේදීත්වය පලකිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

එම්.ඒ.එස්.එම්.කේ. සේනාධීර
සාමාන්‍යාධිකාරී
2014.02.27

# සංයුක්ත තොරතුරු

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| එල්.ඒ.පී. හර්ෂන් ද සිල්වා මයා | සභාපති<br>ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව |
| රොහාන් සෙනෙවිරත්න මයා | අධ්‍යක්ෂ<br>අතිරේක ලේකම්<br>රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය |
| නිමල් පෙරේරා මහතා | සභාපති<br>නාගරික සංවර්ධන අධිකාරිය<br>"සෙත්සිරිපාය"<br>බත්තරමුල්ල |
| ඉංජි. බද්‍රා කමලදාස මහත්මිය | අධ්‍යක්ෂ ජනරාල් - වාරිමාර්ග<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව<br>නිල බලයෙන් |
| මහින්ද සාලිය මයා | මහා භාණ්ඩාගාරයේ නියෝජිත<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ගිණුම්)<br>මහා භාණ්ඩාගාරය |
| ධම්මික අටිගල්ලේ මයා | අධ්‍යක්ෂ<br>සමූහ අධ්‍යක්ෂ – උපාලි සමූහ ව්‍යාපාරය |
| කොමදෝරු එච්.එස්. බාලසූරිය මයා | අධ්‍යක්ෂ<br>ජ්‍යෙෂ්ඨ නාවික සිවිල් ඉංජිනේරු නිලධාරි<br>(විශේෂ ව්‍යාපෘති)<br>ශ්‍රී ලංකා නාවික හමුදාව |
| සමන් ගලප්පත්ති මයා | අධ්‍යක්ෂ<br>නීතිඥ |

# සංයුක්ත තොරතුරු (ඉදිරියට.,)

**සංස්ථාවේ නෛතික තත්ත්වය**

කොළඹ දිස්ත්‍රික්කයේ පහත් බිම් ප්‍රදේශ ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය යනුවෙන් මීන් පෙර හඳුන්වනු ලැබූ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, 1968 අංක 15 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාගත කරන ලදී. 1976 අංක 27 දරන සංශෝධන පනතින් සංස්ථාවේ පරමාර්ථ පුළුල් කරන ලදී. 1982 අංක 52 දරන සංශෝධන පනතින් මණ්ඩලයේ නම ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනුවෙන් වෙනස් කොට එහි බල ප්‍රදේශයද මුළු දිවයිනම ආවරණය වන පරිදි පුළුල් කරන ලදී. 2006 අංක 35 දරන පනතින් ඉහත කී පනත තවදුරටත් සංශෝධනය කරන ලද අතර අනවසර ගොඩ කිරීම් සහ ජල මූලාශ්‍ර දූෂණය කිරීමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමේ බලය එමඟින් සංස්ථාව වෙත පවරා ඇත.

**ප්‍රධාන කාර්යාලය**

3, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

**විගණකවරු**

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
306/72, පොල්දූව පාර
බත්තරමුල්ල.

**නීති උපදේශක**

නීතිපති,
නීතිපති දෙපාර්තමේන්තුව,
අළුත්කඩේ,
කොළඹ 12.

**බැංකුකරුවෝ**

ලංකා බැංකුව
මහජන බැංකුව

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සාමාජිකයින්

| | | |
|---|---|---|
| ඉංජි.එම්.ඒ.එස්.එම්. කේ. සේනාධීර මිය | - | සාමාන්‍යාධිකාරී |
| ඉංජි.කේ. රාජපක්ෂ මයා | - | අතිරේක සාමාන්‍යාධිකාරී - (තාක්ෂණික) |
| බ්‍රිගේඩියර්. ඩබ්.එස්. ආරියසිංහ මයා | - | අතිරේක සාමාන්‍යාධිකාරී - (ක්‍රියාවට නැංවීම්) |
| ඉංජි.ඩබ්ලිව්.ආර්.සී. ප්‍රනාන්දු මයා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී |
| ඉංජි.ජී.එස්.එම්. අබේසේකර මයා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පිරියත හා උපකරණ) |
| ටී.බී.එම්. චන්ද්‍රසේකර මයා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් සංවර්ධන) |
| ආර්. අයි සිල්වා මිය | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) |
| පී. හේමලතා මිය | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉඩම් හා අළෙවි) |
| ඉංජි. සී.බී. අමරසිංහ මයා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පර්යේෂණ සහ සැලසුම්) |
| ඉංජි.එස්.පී. මුතුමාල මයා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ජලාපවහන සහ ගොඩකිරීම්) |
| ඉංජි.වයි.පී.සී. ද සිල්වා මයා | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉදිකිරීම්) |
| ඉංජි. ඒ.එච්. තුෂාරි මිය | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති) |
| ඉංජි. අචාර්ය එන්.එස්. විජේරත්න | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තෙත්බිම් කළමනාකරණ) |
| ජී.ටී.ඩී.ජේ. අමරසිංහ මිය | - | ප්‍රධාන නීති නිලධාරී |
| ජේ.ඒ.පී.කේ. ජයසිංහ මෙය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| ඉංජි. එල්.සී.ජී. සොයිසා මිය | - | සහකාර සාමාන්‍යාධිකාරී (පර්යේෂණ හා සැලසුම්) |
| ඉංජි. පී.එම්.පී. විජේරත්න මෙනෙවිය | - | සහකාර සාමාන්‍යාධිකාරී (සිවිල්) |
| ඉංජි. කේ.අයි. කහවිට මයා | - | සහකාර සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති) |
| ඉංජි. එස්.එන්. ගමගේ මිය | - | සහකාර සාමාන්‍යාධිකාරී (ජලාපවහන සහ ගොඩකිරීම්) |
| එස්.ඩී. ධර්මරත්න මයා | - | සහකාර සාමාන්‍යාධිකාරී (සැපයුම්) |
| කේ.ඩී. අන්ද්‍රා මයා | - | සහකාර සාමාන්‍යාධිකාරී (ඉඩම් හා අළෙවි) |
| එච්.ඒ. ලක්මාලි දිස්නා මිය | - | වැ.බ. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) |

# SRI LANKA LAND RECLAMATION & DEVELOPMENT CORPORATION

## *Organization Structure*



# ක්‍රියාකාරකම් සමාලෝචනය

## ජලාපවහන සහ ගොඩකිරීමේ අංශය

### ස්වකීය ව්‍යාපෘති

**1. <u>වෙරළට ඔබ්බෙන් වැලි පොම්ප කිරීමේ සහ විකිණීමේ ව්‍යාපෘතිය</u>**

විවෘත ආර්ථිකයේ ආගමනයත් සමඟින් එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයෙහි ඇති වූ පිබිදීම හේතුවෙන් නිවාස සංකීර්ණ, කර්මාන්තශාලා, නිදහස්ව වෙළඳ කලාප, අධිවේගී මාර්ග වැනි විශාල සංවර්ධන ක්‍රියාකාරකම් වල නැගී සිටීමක් ඇති විය. මෙවැනි සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වැලි ඉතා වැදගත් අවශ්‍යතාවයක් වීම හේතුවෙන් ගංගා වැලි සඳහා වන ඉල්ලුම වර්ෂයෙන් වර්ෂය සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත.

පාලනයකින් තොර හිතුමතයේ සිදු කරන ගංගා වැලි හැරීම හේතුවෙන් ඇති වූ විවිධ පාරිසරික ගැටළු හේතුවෙන් මේ වන විට ගංගා වැලි හැරීම විශාල වශයෙන් සීමා කර ඇති අතර මේ සම්බන්ධයෙන් නීති රෙගුලාසිද සම්පාදනය කර ඇත.

මෙම සීමා කිරීම් වල ප්‍රතිඵලයක් වශයෙන්, අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය ප්‍රමාණයෙන් වැලි ලබා ගැනීම ඉදිකිරීමේ කර්මාන්තයේ නිරතව සිටින්නන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි. මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් වෙරළට ඔබ්බෙන් ලබා ගත් වැලි වෙළඳපොළට නිකුත් කිරීම සඳහා අපගේ සංස්ථාව ව්‍යාපෘතියක් දියත් කර ඇත.

කෙළවරපිටිය සහ මුතුරාජවෙල සංචිත වලට වෙරළට ඔබ්බෙන් වැලි ඝ.මී. 3,000,000ක් හැරීම සහ පොම්ප කිරීම සඳහා 2011 වර්ෂයේ පෙබරවාරි මාසයේදී බෙල්ජියමේ ඩ්‍රෙජින් ඉන්ටර්නැෂනල් nv සමාගමට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලදී. මුළු කොන්ත්‍රාත් මුදල ඇ.ඩො. 19,860,000 වූ අතර ව්‍යවහාර මුදල් සහ ඉන්ධන මිළ ඉහළ යෑම හේතුවෙන් ගෙවා ඇති ගාස්තුව ඇ.ඩො. 1,411,456.80 කි. කාර්යය 2011 අප්‍රේල් මස ආරම්භ කර 2012 ජනවාරි මස වන විට නිම කර ඇත. ඉන් පසුව 2013 පෙබරවාරි මාසයේදී එම කොන්ත්‍රාත්කරු විසින්ම එම සංචිතයන්ටම අමතර මුහුදු වැලි ඝ.මී. 756,595 ක් පොම්ප කරන ලදී. අමතර වැලි තොගයෙහි කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො. 5,197,539 කි. (හිමිකම්පෑමද ඇතුලත්ව) 2013 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වැලි කියුබ 14,472 ක් වෙළඳපොළට සපයා ඇත.






## සේවාදායක ව්‍යාපෘති

### 1. මෝදරවිල ජල අපවහනය වැඩිදියුණු කිරීම පානදුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - අදියර I

ඉහත ව්‍යාපෘතිය රු.මි. 17.40 ක ඇස්තමේන්තුගත පිරිවැයකට කළුතර දිස්ත්‍රික් ලේකම්වරයා වෙනුවෙන් සිදු කරන ලදී. 2012 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කරන ලද ප්‍රධාන ඇළ මාර්ග පිරිසිදු කිරීම සහ හෑරීම, කළුගල් කාණු ඉදිකිරීම, බෝක්කු, හරස් ව්‍යුහ ඉදිකිරීම සහ ගේබියන් කාර්යයන්ගෙන් සමන්විත වන ව්‍යාපෘති කාර්යයන් 2013.01.10 වැනි දින සම්පූර්ණ කරන ලදී. සමාලෝචිත වර්ෂය තුල සිදු කරන ලද රු.මි. 2.18ක් වටිනා කාර්යයන්ද ඇතුලත්ව සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 16.75කි.

<u>ඇළ මාර්ග පිරිසිදු කිරීම සහ හෑරීම</u>







<u>හරස් ව්‍යුහ ඉදිකිරීම</u>



Crossing Structure – No. 02



Crossing Structure – No. 04



<u>හරස් ව්‍යුහ ඉදිකිරීම</u>




Crossing Structure – No. 08



Crossing Structure – No. 09



## 2. මෝදරවිල ජල අපවහනය වැඩිදියුණු කිරීම පානදුර ඒකාබද්ධ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II

මෙම ව්‍යාපෘතිය රු.මි. 44.14ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකට කළුතර දිස්ත්‍රික් ලේකම්වරයා වෙනුවෙන් සිදු කර ඇත. ප්‍රධාන ඇළ මාර්ග පිරිසිදු කිරීම සහ හැරීම, කළුගල් කාණු ඉදිකිරීම, බෝක්කු, හරස් ව්‍යුහ ඉදිකිරීම සහ ගේබියන් කාර්යයන්ගෙන් සමන්විත වන ව්‍යාපෘති කාර්යයන් 2013 වර්ෂයේ ජූනි මස ආරම්භ කරන ලද අතර මේ වන විටත් සිදු කරමින් පවතී. 2013 දෙසැම්බර් මාසය දක්වා නිම කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 25.29 කි.










## 3. දඩල්ල යෝජිත ක්‍රීඩා සංකීර්ණය - ගාල්ල - අදියර III

මෙම ව්‍යාපෘතිය රු.මි. 24.45 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකට නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් සිදු කර ඇත. ව්‍යාපෘති කාර්යයන්, උස් භූමිය කැපීම සහ මට්ටම් කිරීම, හියුම් පයිප්ප කාණු ඉදිකිරීම (විෂ්කම්භය මි.මී. 450) සහ පිට්ටනිය ප්‍රදේශයෙහි ප්‍රධාන ප්‍රවේශය සඳහා වැට, ගේට්ටු, තට්ටු සහ පඩි ඉදිකිරීම ආදියෙන් සමන්විත වේ. 2013.02.28 වැනි දින වැඩ ආරම්භ කර 2013.11.30 වැනි දින අවසන් කර ඇත. 2013 දෙසැම්බර් මාසය දක්වා නිම කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 23.93කි.








## 4. දෙනියාය ශ්‍රී පුෂ්පාරාම මහා විහාරය සඳහා යෝජිත ගේබියන් බැම්, හියුම් පයිප්ප බෝක්කු සහ ජල අපවහන පද්ධතියක් ඉදිකිරීම

මෙම ව්‍යාපෘතිය රු.මි. 12.87 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැයකට රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රදානය කර ඇත. ව්‍යාපෘති කාර්යයන්, මැටියෙන් සාදන ලද ඇළමාර්ග වැඩිදියුණු කිරීම (A-B & C-D), පවතින ඇළ මාර්ග ගොඩකිරීම A-F-D (දිග මීටර් 105), ගේබියන් බැම් සහ හියුම් පයිප්ප බෝක්කු ඉදිකිරීම සහ මාර්ගය පුනරුත්ථාපනය කිරීම ආදියෙන් සමන්විත වේ. 2013.04.08 වැනි දින වැඩ ආරම්භ කර 2013.12.13 වැනි දින අවසන් කර ඇත. 2013 දෙසැම්බර් මාසය දක්වා නිම කර ඇති කාර්යයන් වල සමුච්චිත වටිනාකම රු.මි. 11.99 කි.










## 5. මීගමුව කලපුව සිට මහඔය අන්තය දක්වා හැමිල්ටන් ඇළ පුනරුත්ථාපනය කිරීම අදියර II, 2012

මීගමුව කලපුව සිට මහඔය අන්තය දක්වා හැමිල්ටන් ඇළ පුනරුත්ථාපනය කිරීම අදියර II, 2012, JICA මූල්‍යාධාර ලබන සංචාරක සම්පත් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලැබේ.ඉහත ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 74.87 ක් වන අතර 2012 මැයි මාසයේදී වැඩ ආරම්භ කර ඇත. 2013 වර්ෂය සඳහා නිම කර ඇති කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 16.36 කි. ගේබියන් බැම් යොදා ඇළ මාර්ග ඉවුරු ආරක්ෂා කිරීම, රොන්මඩ හබක ඉදිකිරීම සහ අලංකරණ කාර්යයන් මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් වේ. 2013.03.30 වැනි දින මෙම කාර්යය නිම කර ඇත.




## 6. යෝජිත මල් අළෙවිසැල් ඉදිකිරීම අදියර – II – වෝටර්ස් එජ්

වෝටර්ස් එජ් පරිශ්‍රයෙහි සහ අවට මල් අළෙවිසැල් සහ ආහාර අළෙවිසැල් ඉදිකිරීම සඳහා භූමිය වැඩිදියුණු කිරීමේ කාර්යයන් සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් සංස්ථාවට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලදී. 2012 ඔක්තෝබර් මාසයේදී වැඩ ආරම්භ කර 2013 මැයි මාසයේදී අවසන් කර ඇත.සිදු කර ඇති කාර්යයන් වල වටිනාකම රු.මි. 88.52 කි.





# භාණ්ඩාගාර අරමුදල් ලබන ව්‍යාපෘති

## ගංවතුර වැළැක්වීමේ විශේෂ ව්‍යාපෘති

ජල අපවහන පද්ධතියේ පවතින විවිධ අඩුපාඩු හේතුවෙන් කොළඹ පුරවර ප්‍රදේශයේ ස්ථාන කීපයක් වැසි කාලයේදී ජලයෙන් යටවීම සිදු වේ. 2010 වර්ෂයේ නොවැම්බර් මාසයේදී මහජනතාව විශාල අසීරුතාවයකට පත් කරමින් සහ මහත් දේපල විනාශයක් සිදු කරමින් විශාලතම විනාශකාරී ගංවතුර තත්ත්වයක් ඇති විය. රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ මඟපෙන්වීම මත අපගේ සංස්ථාව විසින් පහත් බිම් හෑරීම, ජල රැඳවුම් වැව් ඉදිකිරීම සහ අවිධිමත් පහත් බිම් ගොඩකිරීම පාලනය කිරීම ආදී ගංවතුර වැළැක්වීමේ කඩිනම් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

2013 වර්ෂය සඳහා ඉහත කාර්යයට වෙන් කර ඇති මුදල රු.මි. 1000 ක් වන අතර ගංවතුර වැළැක්වීමේ විශේෂ ව්‍යාපෘති යටතේ අපගේ සංස්ථාව විසින් පහත ජල අපවහන ව්‍යාපෘති සිදු කර ඇත.

### 1 පාගොඩ දෙබෙදුම් ස්ථානයේ සිට පාර්ලිමේන්තු පාර පාලම දක්වා කෝට්ටේ ඇළමාර්ග රක්ෂිතය ඔස්සේ ජල අපවහනය වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ අනවසර ඉඩම් අත්පත් කර ගැනීම් වලින් ජල රැඳවුම් ප්‍රදේශ ආරක්ෂා කර ගැනීමයි. පහත් බිම් ජල රැඳවුම් ප්‍රදේශ ලෙස ක්‍රියා කරන අතර අධික වර්ෂාව සහිත අවස්ථාවලදී ගංවතුර මට්ටම අඩු කිරීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ. එබැවින්, ක්‍රීඩා, විනෝදාත්මක ක්‍රියාකාරකම් වැනි සමාජීය ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා සහාය දක්වන පරිසර හිතකාමී ක්‍රියාකාරකම් මෙම ප්‍රදේශ වලට හඳුන්වාදීමට සහ මහජනතාවට පාරිසරික අධ්‍යාපනය ලබා දීමටද අපට අවශ්‍ය වේ. මංතීරු, මල් වෙළඳසැල්, බෝට්ටු සවාරි සහ මඟී ප්‍රවාහන බෝට්ටු ක්‍රියාවට නංවා ඇති ක්‍රියාකාරකම් සමහරකි. මෙම ව්‍යාපෘතිය ආර්ථිකව සාධ්‍ය කර ගැනීම සඳහා සාධාරණ සුළු ගාස්තුවක් අය කරනු ලැබේ.

මෙම කාර්යයේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 300 කි. භූමිය ශුද්ධ පවිත්‍ර කිරීම, ඇළ මාර්ගය හෑරීම සහ යෝජිත ප්‍රවේශය යටින් නිදහස් ගලනයට පහසුකම් සැපයීම සඳහා බොරුපා මත නඩත්තු මාර්ගයක් සෑදීම සහ ප්‍රදේශයේ සොබාසිරි වැඩිදියුණු කිරීම සඳහා අවට භූමිය සකස් කිරීම මෙම පිරිවැය යටතට ගැනේ.

2013 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මි. 304.78 කි.

ප්‍රධාන ව්‍යාපෘති ප්‍රදේශය තුල සහ අවට ශ්‍රීලඉගොභාසංස විසින් හඳුනාගෙන ඇති උප කාර්යයන් පහත පරිදි වේ.

- වෝටර්ස්-එජ් හී ජල රැඳවුම් වැව සහ එහි අවට සංවර්ධනය කිරීම (අදියර II)
- දියවන්නා ඔය සහ එහි අවට සංවර්ධනය කිරීම
- කෝට්ටේ ඇළ මාර්ගය ඔස්සේ සහ එහි අවට ඇළ මාර්ග රක්ෂිතය වැඩිදියුණු කිරීම සහ භූමිය සකස් කිරීම
- වෝටර්ස්-එජ් හි යෝජිත නව වාහන අංගනය සහ ජල අපවහන පද්ධතිය
- කිඹුලාවල යෝජිත වාහන අංගනය සහ ජල අපවහන පද්ධතිය

<u>වෝටර්ස්-එජ් හි ජල රැඳවුම් වැව සහ එහි අවට සංවර්ධනය කිරීම (අදියර II)</u>






<u>වෝටර්ස්-එජ් හි යෝජිත වාහන අංගනය සහ ජල අපවහන පද්ධතිය</u>






<u>කිඹුලාවල යෝජිත වාහන අංගනය සහ ජල අපවහන පද්ධතිය</u>






## 2 මාදිවෙල මාර්ගය ඔස්සේ පාර්ලිමේන්තු අන්තය ආසන්නයේ සහ එහි අවට ඇළ මාර්ග කොටස සංවර්ධනය කිරීම සහ භූමිය සැකසීම

දිනක් හෝ දින දෙකක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන බොහොමයක් රාජ්‍යතාන්ත්‍රිකයින් හට අනුරාධපුරය, සීගිරිය හෝ වෙනත් දුරබැහැර ප්‍රදේශවල අසිරිය නැරඹීමට යෑමට කාල වේලාවක් නොමැත. ඔවුන් හට අගනුවරට තරමක් නුදුරින් පිහිටි ස්ථානයන් අවශ්‍ය වේ. පාර්ලිමේන්තුව ආසන්නයේ මාදිවෙල මාර්ගය ප්‍රදේශයේ භූමි සැකසීම සහ හැරීමේ කාර්යයන් සිදු කරන ප්‍රදේශය බොහොමයක් විදේශීය අමුත්තන්ගේ අවධානය දිනා ගනු ඇත. “මහින්ද චින්තන” සංකල්පය යටතේ පාරම්පරික වප් මඟුල් උත්සව පැවැත්වීම සඳහා ස්ථානයක් සකස් කිරීම තුලින් මෙම ප්‍රදේශය සංචාරකයින් සඳහා විකල්පයක් වනු ඇති අතරම ශ්‍රී ලංකාවේ අනුගමනය කරන ලද පාරම්පරික වගා කිරීමේ ක්‍රමවේද පිළිබඳව අපගේ අනාගත පරම්පරාව දැනුවත් කිරීමටද හේතු වනු ඇත.

ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි. 50.0 ක් වන අතර 2013 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 229.02 කි.

ප්‍රධාන ව්‍යාපෘති ප්‍රදේශය තුල සහ අවට ශ්‍රීලංඉගොසසංස විසින් හඳුනාගන්නා ලද උප කාර්යයන් පහත පරිදි වේ.

- වී වගා කර ඇති ප්‍රදේශය වටා වැව් සහ ඇළ මාර්ග සෑදීම
- කිඹුලාවල නව මාර්ගය ඔස්සේ ඉඩම් තීරුව වැඩි දියුණු කිරීම
- කිඹුලාවල ඇළ මාර්ග සඳහා වාන් මඟ සකස් කිරීම
- බැම්ම, දිය මංකඩ, වාන් මඟ, සොරොව් ගේට්ටු, මංතීරු, පැති අපවහන සහ බෝක්කු ඉදිකිරීම
- කිඹුලාවල නව මාර්ගය ඔස්සේ ඉඩම් තීරුව වැඩිදියුණු කිරීම – II










### 3 යටි-ගඟ අපවහනය වැඩිදියුණු කිරීමද ඇතුලත්ව හීන් ඇළ වගුරු ප්‍රදේශය සංවර්ධනය කිරීම

ගංවතුර රැඳවීමේ කාර්යය සඳහා ශ්‍රීලඉගොහාසසං විසින් හීන් ඇළ වගුර අත්පත් කරගෙන ඇත.ශ්‍රී ජයවර්ධනපුර මාවත ඔස්සේ පර්යන්ත ඇළ මාර්ගයක් සෑදීමෙන් සහ ඇළ මාර්ගය ඔස්සේ මෙහෙයුම් සහ නඩත්තු මාර්ගයක් තැනීමෙන් අනවසර සංවර්ධනය කිරීම වලින් මෙම ප්‍රදේශය ආරක්ෂා කර ගත යුතු වේ. තවද, ඇළ මාර්ග ඉවුර ඔස්සේ මාර්ගයක් සම්බන්ධ කිරීමෙන් කිරිමණ්ඩල මාවතේ වාහන තදබදය විශාල ප්‍රමාණයකින් අඩු කල හැකි වේ.

ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි. 200.0 ක් වන අතර 2013 වර්ෂය සඳහා නිම කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 210.13 කි.

ප්‍රධාන ව්‍යාපෘති ප්‍රදේශය තුල සහ අවට ශ්‍රීලංඉගොහාසසං විසින් හඳුනාගන්නා ලද උප කාර්යයන් පහත පරිදි වේ.

- නාවල ප්‍රදේශයේදී හින් ඇළ සංවර්ධනය කිරිම
- නුගේගොඩ නාගරික තෙත්බිම් උද්‍යානය සංවර්ධනය කිරිම
- පාගොඩ ඇළ මාර්ගයට යාබද නාගරික තෙත්බිම් උද්‍යානයේ ඇළ මාර්ග ඉවුරු සංවර්ධනය කිරීම
- හීන් ඇළ වගුර ප්‍රදේශය සහ එහි අවට සංවර්ධනය කිරීම
- හීන් ඇළෙහි යටි-ගඟ අපවහනය වැඩිදියුණු කිරීම
- GCFC & EIP ව්‍යාපෘතියෙහි අත්පත් කරගත් මායිම් තුල අනවසර ඉඩම් වල මායිම් ලකුණු කිරිම









## 4 පාර්ලිමේන්තු උඩු-ගහ වගුරු ප්‍රදේශය සංවර්ධනය කිරීම සහ බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත ඔස්සේ භූමිය සැකසීම

බොහොමයක් රාජ්‍ය ආයතන බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත වෙත ගෙනවිත් ඇත. එබැවින්, එම ඉඩම් තීරුව ඔස්සේ භූමිය සැකසීම සිදු කලහොත් එය ඇසට ප්‍රියමනාප දර්ශයක් වනු ඇත. මෙම ඉඩම ශ්‍රීලඉගොහාසසං විසින් අත්පත් කර ගන්නා ලද පාර්ලිමේන්තු ඉහළ ජල රැඳවුම් ප්‍රදේශයේ කොටසක් වන බැවින් පාර්ලිමේන්තු ප්‍රදේශයේ ගංවතුර පාලනය කිරීම සඳහා එහි ජල අපවහනයද වැඩිදියුණු කරනු ඇත.

මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 275.0 ක් වන අතර 2013 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන් වල වටිනාකම රු.මි. 212.93 කි.

ප්‍රධාන ව්‍යාපෘති ප්‍රදේශය තුල සහ අවට ශ්‍රීලංඉගොහාසසං විසින් හඳුනාගන්නා ලද උප කාර්යයන් පහත පරිදි වේ.

- තලවතුගොඩ වැව හැරීම (වැව අන්තය) අදියර II
- කුරුළු උයන - මාදිවෙල ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය
- කිඹුලාවල යෝජිත වැව හැරීම සහ භූමිසැකසීම සංවර්ධනය කිරීම
- පාර්ලිමේන්තු උඩු ගහ ප්‍රදේශයේ වැව සහ එහි අවට සංවර්ධනය කිරීම
- පාර්ලිමේන්තු උඩු ගහ වගුරු ප්‍රදේශය සහ එහි අවට සංවර්ධනය කිරීම
- පාර්ලිමේන්තු ජලාශයෙහි උඩු ගහ භූමි සැකසීමේ කාර්යයන් සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම
- පාර්ලිමේන්තු උඩු ගහ ප්‍රදේශයේ භූමිය සැකසීම සහ මට්ටම් කිරීම සංවර්ධනය කිරීම
- තලවතුගොඩ වැව සහ එහි අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම
- රම්පලාවත්ත වැව සහ එහි අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම
- දියවන්නා ජලාශයෙහි නාගහමුල්ල උඩු ගහෙහි වැව හැරීම සහ භූමිය සැකසීම
- තලවතුගොඩ යෝජිත සංවර්ධන ප්‍රදේශය ඔස්සේ ඇළ මාර්ගය හැරීම
- කිරි ඇළ හැරීම
- විදේශ කටයුතු අමාත්‍යාංශය සඳහා යෝජිත ගොඩනැගිලි සංකීර්ණයෙහි ජල අපවහනය වැඩිදියුණු කිරීම

<u>කිඹුලාවල යෝජිත වැව හැරීම සහ භූමිසැකසීම වැඩිදියුණු කිරීම</u>






## 5 කැළණිය සහ පෑලියගොඩ ප්‍රදේශයේ මුදුන් ඇළ හැරීම ද ඇතුලත්ව ජල අපවහනය වැඩිදියුණු කිරීමේ සහ ඇළ මාර්ග නඩත්තු කිරීමේ කාර්යයන්

වසර ගණනක සිට අධික වර්ෂා කාලවලදී කැළණිය සහ පෑලියගොඩ ප්‍රදේශයේ මුදුන් ඇළ වැසි ජලයෙන් පිටාර ගලයි. කොළඹ සහ අවට ප්‍රදේශයේ සිදු වූ සීඝ්‍ර සංවර්ධනය සමඟින් වසර ගණනාවක සිට සිදු කරන ලද අවිධිමත් සංවර්ධන කටයුතු මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. කොළඹට මෙන්ම කටුනායක අන්තර්ජාතික ගුවන්තොටුපල ආසන්නයේ පැවතීම හේතුවෙන් මෙම ප්‍රදේශය ඉහළ වාණිජ වටිනාකමකින් යුක්ත වේ. එවැවින්, මෙම ප්‍රදේශ සඳහා ජල අපවහනය වැඩිදියුණු කිරීම් ක්‍රියාවට නැංවීමෙන් ඉඩම් බොහොමයක් සංවර්ධනය කල හැකි වේ.

මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 50.0 ත් වන අතර 2013 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 120.63 කි.

ප්‍රධාන ව්‍යාපෘති ප්‍රදේශය තුල සහ අවට ශ්‍රීලංඉගොහාසසං විසින් හඳුනාගන්නා ලද උප කාර්යයන් පහත පරිදි වේ.

- හේනමුල්ල නිවාස සංකීර්ණය පිටුපස ඇළ මාර්ගය හැරීම
- කැළණිය, බියගම, මානෙල්වත්ත බොල්ලෑගල විහාරය ආසන්නයේ පවතින වැව වැඩිදියුණු කිරීමේ කාර්යයන්
- මට්ටක්කුලිය කිඹුලා ඇළ හැරීම
- කැළණිය වෙදමුල්ල වැව හැරීම
- කොළඹ කටුනායක අධිවේගී මාර්ගය අසල පෑලියගොඩ වැව සංවර්ධනය කිරීම
- කැළණිය සහ පෑලියගොඩ ප්‍රදේශවල මුදුන් ඇළෙහි භූමිසැකසුම් කාර්යයන් වැඩිදියුණු කිරීම සහ ඇළ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම
- හෙයියන්තුඩුව දකුණ වැව හැරීම

<u>මට්ටක්කුලියේදී කිඹුලා ඇළ හැරීම</u>






<u>කැළණිය, වැල්ලම්බඩම වැව හෑරීම</u>

<u>හෙයියන්තුඩුව දකුණ වැව හෑරීම</u>









**6 කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨ පරිශ්‍රයෙහි පිහිටි වැවෙහි කඳවල ප්‍රදේශයෙහි ජල රැඳවුම් ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා හෑරීම සහ පිරිසිදු කිරීම**

මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන අරමුණ වන්නේ ප්‍රදේශයේ ජල රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීම සහ ජලයෙන් යටවීම අඩු කිරීම මෙන්ම පරිසර හිතකාමී වටපිටාවක් සකස් කිරීම වේ.

මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 20.0 ත් වන අතර 2013 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 53.44 කි.

ප්‍රධාන ව්‍යාපෘති ප්‍රදේශය තුල සහ අවට ශ්‍රීලංඉගොහාසසං විසින් හඳුනාගන්නා ලද උප කාර්යයන් පහත පරිදි වේ.

- කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨ පරිශ්‍රයෙහි පිහිටි වැවෙහි කඳවල ප්‍රදේශයෙහි ජල රැඳවුම් ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා හෑරීම සහ පිරිසිදු කිරීම
- කඳවල ප්‍රදේශයේ භූමිසැකසුම් කාර්යයන් වැඩිදියුණු කිරීම සහ ඇළ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීම.





**7 අකුරගොඩ ආරක්ෂක මූලස්ථානයට යෝජිත ප්‍රවේශ මාර්ගය ඔස්සේ ජල රැඳවුම් ධාරිතාවයට පහසුකම් සැපයීම සඳහා පාර්ලිමේන්තු ඉහළ ජලාධාර ප්‍රදේශයේ ජල අපවහනය වැඩිදියුණු කිරීම**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු මාර්ගයේ සිට අකුරගොඩ දක්වා වගුරු බිම ඔස්සේ ප්‍රවේශ මාර්ගය තැනීම හේතුවෙන් සිදු වූ ජල රැඳවුම් ධාරිතාවය අඩුවීම යථා තත්ත්වයට පත් කරමින් සහ එමගින් ජලයෙන් යටවීම වළක්වමින් හැරීම මගින් ජලාශ 03ක් සෑදීම වේ.

මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 105.0 ත් වන අතර 2013 වර්ෂය සඳහා සිදු කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 34.95 කි.

## භාණ්ඩාගාර අරමුදල් ලබන ව්‍යාපෘති

### ඇළ මාර්ග නඩත්තු කිරීම

1. **කොළඹ සහ තදාසන්න ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග නඩත්තු කිරීම**
2. **මුතුරාජවෙල හැමිල්ටන් ඇළෙහි නඩත්තු කටයුතු**
3. **ජල රැඳවුම් ප්‍රදේශ නඩත්තුව සහ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම**

වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නඩත්තු කරන ලද දිගින් කි.මී. 45 ක් වන ප්‍රධාන ඇළ මාර්ග පද්ධතිය 1979 වසරේදී සංස්ථාව වෙත පවරා දෙන ලද අතර මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අදියර 1 යටතේ පුනරුත්ථාපනය කෙරිණි. 1980 දී දියවන්නා ඔය ජලාශයක් බවට පත් කිරීමත් සමඟම එහි නඩත්තු කටයුතු ද සංස්ථාව වෙත පැවරිණි

මීට අමතරව ආසන්න වශයෙන් සම්පූර්ණ දිග කි.මී.20 ක් පමණ වන කොළඹ අවට පිහිටි කුඩා ඇළ මාර්ග නඩත්තු කිරීමේ කටයුතු ද 2001 වර්ෂයේ සිට සංස්ථාව වෙත පැවරිණි.

කැළණි ගඟේ සිට මීගමු කලපුව දක්වා වූ හැමිල්ටන් ඇළෙහි (කි.මී 14.5 ක්) නඩත්තු කටයුතු සිදු කරන ලදී.

ඇළ මතුපිට ශුද්ධ පවිත්‍ර කිරීම, ඇළ මාර්ග හැරීම, ගේබියන් යොදා ඇළ ඉවුරු ආරක්ෂා කිරීම මේ යටතේ සිදු කෙරෙන ප්‍රධාන කාර්යය වේ.

ඉහත කාර්යයන් සඳහා භාණ්ඩාගාරය විසින් 2013 වර්ෂය සඳහා රු.මි.200 ක ප්‍රතිපාදන වෙන් කර ඇත. නිම කරන ලද මුළු කාර්යයෙහි සමුච්චිත වටිනාකම රු.මි. 208.74 කි.

**1. කොළඹ සහ තදාසන්න ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග නඩත්තු කිරීම**

**i. උතුරු කොළඹ ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග නඩත්තු කිරීම**

මහවත්ත ඇළ මාර්ගය



ශාන්ත සෙබස්තියන් නැගෙනහිර ඇළ මාර්ගය



ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය



දෙමටගොඩ ඇළ මාර්ගය



උත්තරානන්ද මාවත ඇළ මාර්ගය



ප්‍රධාන කාණුව



**ii. කොළඹ දකුණ ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග නඩත්තු කිරීම**

දෙහිවල ඇළ මාර්ගය



දෙහිවල මෝය



වැල්ලවත්ත ඇළ මාර්ගය



වැල්ලවත්ත මෝය



බොල්ගොඩ ඇළ මාර්ගය



කිරුළපන ඇළ මාර්ගය



**ලුනාව ජලාශය සහ ඇළ මාර්ග නඩත්තු කිරීම**

2013 වර්ෂය සඳහා ලුනාව ජලාශය සහ ඇළ මාර්ග නඩත්තු කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 12.6 කි. සිදු කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මි. 5.04 කි.









අත්තිඩිය ප්‍රදේශයෙහි සහ අවට ජලාශ සහ ඇළ මාර්ග හැරීම





**iii** නැගෙනහිර කොළඹ ප්‍රධාන සහ කුඩා ඇළ මාර්ග නඩත්තු කිරීම

කොලොන්නාව ඇළ මාර්ගය



හීන් ඇළ මාර්ගය



කිරුළපන ඇළ මාර්ගය



කෝට්ටේ ඇළ මාර්ගය



ටොරින්ටන් ඇළ මාර්ගය



**2.** මුතුරාජවෙල හැමිල්ටන් ඇළ නඩත්තු කිරීම

2013 වර්ෂය සඳහා මුතුරාජවෙල හැමිල්ටන් ඇළ නඩත්තු කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 60.08 ක් වන අතර සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 25.55 කි.





## 3. අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් ඉවත් කිරීම

කොළඹ නගරයේ බොහොමයක් ඇළ මාර්ග රක්ෂිත සහ ජල රැඳවුම් ප්‍රදේශ ජනතාව විසින් බලහත්කාරයෙන් අත්පත් කරගෙන ඇති බැවින් එය විධිමත් ජල අපවහනයක් සඳහා ඍජුවම බලපෑම් එල්ල කර ඇත. එබැවින් මෙම අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් ඉවත් කිරීම සඳහා අප ව්‍යාපෘතියක් දියත් කර ඇත.

මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 50.0 ත් වන අතර සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 52.38 කි.








## 2013 වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ දායකත්වය

කොළඹ නගරයේ සහ අවට ඇති වූ තදබල ගංවතුර තත්ත්වයන් පාලනය කිරීමේ කාර්යයන් සඳහා පසුගිය වර්ෂ වලදී අපගේ සංස්ථාව ශ්‍රී ලංකා නාවික හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වැනි ආරක්ෂක හමුදා සමඟ කටයුතු කර ඇත.

අමාත්‍යාංශයෙන් ලබා දෙන ලද උපදෙස් අනුව කලින් කලට ආරක්ෂක හමුදා අපගේ ව්‍යාපෘති සඳහා සහභාගී වී ඇති අතර විශේෂ අවස්ථාවන් වලදී පහත සඳහන් කාර්යයන් සඳහා දායක වී ඇත.

- ශ්‍රී ලංකා නාවික හමුදාම ඔවුන්ගේ ජීවිතාරක්ෂක කාර්ය මණ්ඩලය සමඟින් කොළඹ ඇළ මාර්ගයන්හි ප්‍රවාහන පහසුකම් සැපයීමේ නිරත විය.
- අමාත්‍යාංශය යටතේ විශේෂ කාර්යයන්, විශේෂයෙන් අවසන් කිරීමේ කටයුතු සහ අපගේ ව්‍යාපෘති යටතේ සංවර්ධිත නාගරික ස්ථාන විධිමත්ව පවත්වා ගැනීම සඳහා සහාය දැක්වීමෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව ඉලක්ක සපුරා ගැනීම සඳහා සහභාගී වී ඇත.
- ගෙවීමේ පදනම යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 2011 වර්ෂයේ සිට ඔවුන්ගේ බලකාය සමඟින් උතුරු කොළඹ ඇළ මාර්ග නඩත්තු කටයුතු සඳහා සහභාගී වී ඇති අතර ඔවුන් විසින් සම්පූර්ණ කරන ලද කාර්යයන් වෙන්වෙන් සිදු කරන ලද සත්‍ය කාර්යය පදනම් කර ගනිමින් සියළු මාස සඳහා ඔවුන්ගේ ගෙවීම් ලබා දී ඇත.

# පර්යේෂණ සහ සැලසුම් අංශය

## උපදේශන සේවාවන්

සංස්ථාව විසින් වැසි ජල අපවහන සැලසුම් පිළිබඳව උපදේශන කටයුතු, වැසි ජල අපවහනය පිළිබඳ ප්‍රධාන සැලසුම් පිළියෙල කිරීම, ගොඩනැගිලි හා පාලම් පිළිබඳව ව්‍යුහාත්මක සැලසුම් නිර්මාණය කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශ වෙනුවෙන් පාරිසරික බලපෑම් තක්සේරු (EIA), මූලික පාරිසරික පරීක්ෂණ (IEE) වාර්තා සකස් කිරීම භාරගනු ලැබේ.

### ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණාගාරය

සංස්ථාවේ ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණාගාරය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශවල ආයතන වෙනුවෙන් භූ-තාක්ෂණ පර්යේෂණ, ජල තත්ත්වය, පස් සහ කොන්ක්‍රීට් බ්ලොක් පරීක්ෂා කිරීම, ඉදි කිරීම් වැඩ බිම්වලින් තෙතමනය ඉවත් කිරීම ආදිය සිදු කරනු ලැබේ. 2013 වර්ෂයේ නිම කරන ලද කාර්යයන්හි මුළු වටිනාකම රු.මි. 16 කි.

### ව්‍යුහාත්මක සැලසුම් හා ඉදිකිරීම් අධීක්ෂණය

ගොඩනැගිලි, නිවාස සංකීර්ණ, පාලම්, බෝක්කු ආදියෙහි ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම සහ ඒවායේ ඉදිකිරීම් අධීක්ෂණය සංස්ථාව විසින් භාර ගනු ලැබේ.

**අඩු ආදායම්ලාභීන් සඳහා වූ සාලමුල්ල නිවාස ව්‍යාපෘතිය -** *නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙනි*




අඩු ආදායම්ලාභී නිවාස ඉවත් කිරීම සඳහා වූ රජයේ ව්‍යාපෘතියට අනුව යමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉහත ටර්න්කී (turnkey) ව්‍යාපෘතිය දියත් කර ඇත. අඩු ආදායම්ලාභී පවුල් නැවත පදිංචි කිරීම සඳහා යටිතල පහසුකම්වලින් යුත් නිවාස ඒකක ඉදි කිරීම සඳහා වූ ව්‍යාපෘතියකි. මහල් 12 කින් යුත්, එක් මහලක නිවාස ඒකක 18ක ගොඩනැගිල්ලක් (Aකොටස) හා එක් මහලක නිවාස ඒකක 33 ක ගොඩනැගිලි 2 කින් (B සහ C කොටස්) සමන්විත මෙම ව්‍යාපෘතියෙහි සැලසුම් හා ඉදිකිරීම් මෙයට අයත් වේ. මුළු නිවාස ඒකක ගණන 1008 කි.

ගෘහනිර්මාණ සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම පර්යේෂණ සහ සැලසුම් අංශය විසින් සිදු කර ඇත.

**ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සඳහා නව කොටසක් ඉදිකිරීම**

සංස්ථාව එහි ප්‍රධාන ගොඩනැගිල්ලට නව කොටසක් එක් කිරීමට අදහස් කර ඇත. ගෘහ නිර්මාණාත්මක සැලසුම් ව්‍යුහාත්මක සැළසුම් සහ සේවා ඇදීම් සහ ඉදි කිරීම් අධීක්ෂණය පර්යේෂණ හා සැලසුම් අංශයට භාර දී ඇත. 2008 වර්ෂයේදී වැඩ ආරම්භ කර ඇත. උපදේශන කාර්යය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 5.30 කි. 2014 මාර්තු මස වන විට මෙම ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිතය.



**විනාශකාරී නොවන පරීක්ෂණ සඳහා ජාතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම - පරමාණුක බලශක්ති අධිකාරිය වෙනුවෙනි**




මෙය එක් සිව් මහල් ගොඩනැගිල්ලකින් (A කොටස), තනි මහල් පරීක්ෂණාගාරයකින් (B කොටස) සහ තෙමහල් ගොඩනැගිල්ලකින් (C කොටස) සමන්විත වන ටර්න්කී ව්‍යාපෘතියකි. A කොටසෙහි ගෘහනිර්මාණාත්මක සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා අපගේ උපදේශන සේවා ගාස්තුව රු.මි. 12 කි. A කොටසෙහි උපරි ව්‍යුහය සැලසුම් සකස් කිරීම නිම කරීමට ආසන්නව ඇත. සේවාදායකයාගේ ඉල්ලීමකට අනුව B කොටසෙහි සැලසුම් කාර්යයන් තාවකාලිකව නවතා ඇත.

<u>**විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සඳහා හම්බන්තොට ප්‍රදේශයේ ගොඩනැගිලක් ඉදිකිරීම**</u>





මෙම ගොඩනැගිල්ලෙහි උපදේශකයින් වශයෙන් සංස්ථාව පත් කර ඇත. එය මහල් හතකින් සමන්විත වන ව්‍යුහයක් වන අතර ව්‍යාපෘති පිරිවැය රු.මි. 2,379කි. ගෘහනිර්මාණාත්මක සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම නිම කර ඇති අතර ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කර ඇත. 2013 වර්ෂය සඳහා උපදේශන ගාස්තුව රු.මි. 30 කි.

- <u>**බෙලිඅත්තෙහි පොදු පහසුකම් ගොඩනැගිල්ල**</u>



**මෙම ව්‍යාපෘතිය ගොඩනැගිලි සමූහයක මාදිලියෙන් ප්‍රදානය කර ඇත. එය මහල් හතරකින් යුත් ගොඩනැගිල්ලකි. සේවාදායකයා බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව වන නමුත් ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයනු ලබන්නේ පළාත් පාලන අමාත්‍යාංශය මඟිනි. ව්‍යාපෘති පිරිවැය රු.මි. 570 ක් වන අතර 2013 වර්ෂය සඳහා අපගේ උපදේශන ගාස්තුව රු.මි.8 කි. ගෘහනිර්මාණාත්මක සහ ව්‍යුහාත්මක සැලසුම් සකස් කිරීම බොහෝදුරට අවසන් කර ඇත.**

## අපවහන සැලසුම්

**කින්නියා නගරසභා සීමාවේ වැසි ජල අපවහන සැලසුම් සකස් කිරීම – කින්නියා නගර සභාව**

රු.මි. 2.36 ක උපදේශන ගාස්තුවකට ඉහත ව්‍යාපෘතිය සංස්ථාවට ප්‍රදානය කර ඇත. සැලසුම් සකස් කිරීම බොහෝදුරට අවසන් කර ඇත.

**ඉමදූව නගර සංවර්ධනය සඳහා අපවහන සැලසුම – UDA**

රු.මි. 0.483 ක උපදේශන ගාස්තුවකට ඉහත ව්‍යාපෘතිය සංස්ථාවට ප්‍රදානය කර ඇත. සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත.

**මහනුවර විලියම් ගොපල්ලව මාවත වැඩිදියුණු කිරීම- RDA**

උපදේශන ගාස්තුව රු.මි. 0.65 කි. සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත.

**මාකුඹුර ඉඩම් සංවර්ධන කාර්යයන්, දක්ෂිණ අධිවේගී මාර්ගයේ සහ කොළඹ වටරවුම් මාර්ගයේ හෝමාගම හුවමාරුව – RDA**

ඉහත ව්‍යාපෘතියේ ජලවිද්‍යාත්මක සහ ද්‍රාව ප්‍රමාණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා සංස්ථාවට බාර දී ඇත.අපගේ උපදේශන ගාස්තුව රු.මි. 0.71 ක් වූ අතර සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත.

**බත්තරමුල්ල රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය සඳහා ඉඩමක් සංවර්ධනය කිරීම**

ඉහත ව්‍යාපෘතිය සඳහා අපගේ උපදේශන ගාස්තුව රු.මි. 0.5 ක් වූ අතර සැලසුම් සකස් කිරීම අවසන් කර ඇත.

## භාණ්ඩාගාර අරමුදල් ලබන ව්‍යාපෘති

**තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම**

බස්නාහිර, දකුණ සහ මධ්‍යම පළාත් වල තෙත්බිම් ගැසට් කර සංස්ථා පනත යටතේ ප්‍රකාශයට පත් කර ඇත.උතුරුමැද, ඌව, සබරගමුව සහ වයඹ තෙත්බිම් හඳුනාගෙන ඇති අතර ගැසට් කිරීම සඳහා සකස් කරමින් පවතී. උතුරු සහ නැගෙනහිර පළාත් වල තෙත් බිම් හඳුනාගනිමින් පවතී.2013 වර්ෂය සඳහා භාණ්ඩාගාර වෙන්කිරීම රු.මි. 0.5 කි.

**කළු ඔය ද්‍රෝණිය සඳහා ජල මට්ටම් සහ මුදා හැරීමේ මිනුම්**

දත්ත සමුදායක් (data base) සකස් කිරීම සඳහා ජල මට්ටම් සහ මුදා හැරීමේ මිනුම් ලබා ගනු ලැබේ. මෙම දත්ත වර්තමාන අපවහන අධ්‍යයන සඳහා යොදා ගන්නා අතර වැසි ජල අපවහනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමේ අවස්ථාවකදී යොදාගත හැකි වේ.

**වේරස් ගංගා ද්‍රෝණිය සඳහා ජල මට්ටම් සහ මුදා හැරීමේ මිනුම්**

වේරස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද අකෘතිය පරීක්ෂා කිරීම සඳහා ජල මට්ටම් සහ මුදා හැරීමේ මිනුම් ලබා ගනු ලැබේ.

**විවිධ අපවහන සැලසුම්**

අපවහන සහ ගොඩකිරීමේ අංශය විසින් හසුරුවන ලද වෝටර්ස්-එජ් සහ කිඹුලාවල භාණ්ඩාගාර අරමුදල් ලැබූ සියළු කාර්යයන් සඳහා අපවහන සැලසුම් පර්යේෂණ සහ සැලසුම් අංශය විසින් සකස් කරන ලදී.

## විශේෂ ව්‍යාපෘති අංශය

2013 වර්ෂය සඳහා ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂ ව්‍යාපෘති අංශය විශාල දායකත්වයන් ලබා දී ඇත. විවිධ ව්‍යාපෘති වලට අමතරව විශේෂ ව්‍යාපෘති අංශය විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ;

- ගංවතුර වැළැක්වීම හා සම්බන්ධ විශේෂ ව්‍යාපෘති සිදු කරගෙන යෑම.
- ජල විද්‍යාව පදනම් කරගත් ඉඩම් සංවර්ධන යෝජනා සැපයීම.
- අනවසර ගොඩකිරීම් පාලනය කිරීම.

ඉහත ක්‍රියාකාරකම් තුලින් ප්‍රාදේශීය ප්‍රජාවට බොහෝ ප්‍රතිලාභ අත්පත් කර දී ඇත. කෙසේවෙතත් වර්තමානය වන තෙක් තෙත්බිම් ආරක්ෂා කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවයට ප්‍රමුඛත්වය ලබා දී නොතිබිණි. ගංවතුර වැළැක්වීම, ජල තත්ත්වය වැඩිදියුණු කිරීම, ජෛව විවිධත්වය ආදිය කෙරෙහි තෙත්බිම් ලබා දෙන වැදගත් දායකත්වය සංස්ථාව මේ වන විට අවබෝධ කරගෙන ඇත. සංස්ථාව තුල නව තෙත්බිම් කළමනාකරණ අංශයක් ස්ථාපිත කර ඇත.

#### විශේෂ ව්‍යාපෘති

වේරැස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ලෙසින් ප්‍රධාන ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘති දෙකක් 2011 වර්ෂයේදී ආරම්භ විය. 2013 වර්ෂය තුලද එම ව්‍යාපෘති නොකඩවා සිදු කරගෙන ගොස් ඇත.

#### වේරැස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල සිදු වන සීඝ්‍ර නාගරීකරණය සැලසුම් නොකල ඉඩම් ගොඩකිරීම් සඳහා හේතු වී ඇත. වර්තමානයේදී වර්ෂා කාල වලදී විශාල ගංවතුර තත්ත්වයන් ඇති වූ අතර මෙම තත්ත්වය වසරින් වසර බරපතල වී ඇත. ශ්‍රීලඉගොහාසසං සහ JICA කණ්ඩායමේ සහාය ඇතිව කොළඹ පුරවර කලාපය සඳහා විස්තීර්ණ ප්‍රධාන අපවහන සැලැස්මක් සකස් කරන ලදී. මෙම අපවහන සැලැසුම් අධ්‍යයනයෙහි ශක්‍යතා අධ්‍යයනය පිළිබඳව සිදු කරන ලද වැඩිපුර අධ්‍යයන වලින් ගංවතුර වැළැක්වීම සඳහා බොල්ගොඩ උප ජලාධාරයක් වන වේරැස් ගංගා ද්‍රෝණිය සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් අවශ්‍ය බව අනාවරණය වී ඇත. එබැවින් ඉහත ව්‍යාපෘතිය 2011 දී දියත් කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ ගංවතුර වැළැක්වීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරගෙන යනු ලබන ක්‍රියාකාරකම් වන්නේ;

- පවතින ඇළ මාර්ග පද්ධතිය පුළුල් කිරීම,
- ඉවුරු ආරක්ෂණය,
- ගංවතුර රැඳවීමේ ජලාශ වෙන් කිරීම,
- පවතින බෝක්කු සහ පාලම් වැඩිදියුණු කිරිම සහ
- නව ව්‍යුහ ඉදිකිරීම.

මුළු ව්‍යාපෘතිය අදියර කිහිපයකට බෙදදා ඇති අතර නුගේගොඩ රත්තනපිටිය ඇළ මාර්ගය, බොරලැස්ගමුව උතුර සහ දකුණ ඇළ මාර්ග, මහ ඇළ සහ බොල්ගොඩ ඇළ වැඩිදියුණු කිරීම සහ වේරැස් ගඟ හැරීම අදියර I ට ඇතුලත් වේ. රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ නියෝජිතායතනය ශ්‍රීලඉගොහාසසං වේ.

මුළු ව්‍යාපෘති වටිනාකම රු.මි.14,227 ක් වන අතර භාණ්ඩාගාර අනුදැනුම මත ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් ණයක් වශයෙන් අරමුදල් ලබා ගැනීමට බලාපොරොත්තු වේ.කෙසේවෙතත් 2013 වර්ෂයේදී ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා භාණ්ඩාගාර අරමුදලක් වශයෙන් රු.මි. 400 ක් ලබා දී ඇත. මෙයට ඉඩම්

අත්පත් කර ගැනීම ද (රු.මි. 1400) ඇතුලත් වේ. බලපෑමට ලක් වූ සියළු පාර්ශවයන්ට සහන සැලසීම සඳහා විශේෂ වන්දිගෙවීමේ පැකේජයක් සකස් කර ඇත. ව්‍යාපාතිය ක්‍රියාවට නැංවීම සඳහා මෙන්ම වන්දි ගෙවීම සඳහාද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. ව්‍යාපෘති ප්‍රදේශයේ භූතාක්ෂණික විමර්ෂනය 2012 වර්ෂයේදී සිදු කර ඇත.

අවශ්‍ය සියළු අනුමැතීන් ලබාගැනීමෙන් පසුව අදියර I 2013 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

ඉදිකිරීම් සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමට තරඟකාරී ලංසු 2013 වර්ෂයේදී කැඳවන ලදී. මුලින්ම මීටර් 3056 ක් දිග නුගේගොඩ රත්තනපිටිය ඇළ මාර්ගය වැඩිදියුණු කිරීම 2013 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර මේ වන විටත් සිදු කරමින් පවතී. 2013 වර්ෂයේ දෙසැම්බර් මස අවසානය වන විට දිගින් 12% ක ප්‍රමාණයක් නිම කර ඇත. මෙයට ඇළ හෑරීම සහ ගේබියන් බැමි ඉදිකිරීම ඇතුලත් වේ. 2013 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානය දක්වා කරන ලද කාර්යයන් වල සමුච්චිත වටිනාකම රු.මි. 330 කි.

**නුගේගොඩ ඔස්සේ O&M මාර්ගයේ ගේබියන් ඉදිකිරීම – රත්තනපිටිය ඇළ මාර්ගය, නුගේගොඩ**





ගංවතුර වැළැක්වීමට අමතරව, විනෝදාත්මක ක්‍රියාකාරකම්, අත්තිඩිය කුරුළු පාරාදීසිය පුනරුත්ථාපනය කිරීම සහ ජලයෙන් ඇති වන රෝග වලින් වැළකීම වැනි වෙනත් අමතර ප්‍රතිලාභ ද අපේක්ෂා කෙරේ. සම්පූර්ණ ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව අවට ප්‍රදේශයේ ඉඩම් වටිනාකම ඉහළ යන බව ශක්‍යතා අධ්‍යයනයෙන් අනාවරණය වී ඇත.





බොරලැස්ගමුව වගුරු ප්‍රදේශයේ වැව හෑරීම

අදියර I වසර තුනහමාරකින් නිම කිරීමට සැලසුම් කර ඇති අතර මාදිවෙල දකුණ හැරවුම, රත්මලාන සහ මොරටුව වැඩිදියුණු කිරීම වැනි වෙනත් වැඩිදියුණු කිරීම් පසුව සිදු කරනු ඇත.

# වෙනත් විවිධ ව්‍යාපෘති

## කොලොන්නාව වැසි ජල අපවහන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම

කෙලොන්නාව කැළණි ගඟ පිටාර ගැලීමෙන් ආරක්ෂා නොවූ ප්‍රදේශයකි. නමුත් වර්තමාන තත්ත්වයට අනුව නීතිවිරෝධී ගොඩකිරීම සහ බලහත්කාරයෙන් පදිංචි වීම හේතුවෙන් පවතින ඇළ මාර්ග පද්ධතියේ අක්‍රමිකතා විශාල ගණනක් පවතී. කැළණි ගඟෙහි අඩු ජල මට්ටම් වලදී පවා සුළු වර්ෂාවකදී වුවද අපවහන පද්ධතියක් නොමැති විම හේතුවෙන් සමහර ප්‍රදේශ ජලයෙන් යටවේ. මේ සම්බන්ධයෙන් විස්තීර්ණ අපවහන අධ්‍යයනයක් සිදු කර ඇති අතර මෙම තත්ත්වයෙන් මැඩපැවැත්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග යෝජනා කරනු ඇත.




සැලසුම් නොකළ නගර සංවර්ධනය




නීතිවිරෝධී ගොඩකිරීම්






වර්ෂා කාලයේදී ඇතිවන ගංවතුර

කැළණි ගඟෙහි අවම ජල මට්ටම සැලකිල්ලට ගනිමින් වසර 10ක කාලපරිච්ඡේදයක් සඳහා ඉදිරි වර්ෂාපතනය සැලකිල්ලට ගනිමින් විධිමත් අපවහන පද්ධතියක් සැලසුම් කරනු ලැබේ. ඇළ මාර්ග ධාරිතා වැඩිදියුණු කිරිම, බොක්කු සහ පාලම් වැඩිදියුණු කිරිම, ඇළ මාර්ග සිමාවන් පිහිටුවිම සහ ජල රැඳවුම් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම මඟින් අපවහන වැඩිදියුණු කිරිම සිදු කරනු ඇත. කැළණි ගඟෙහි ඉහළ ගංවතුර මට්ටම්වල පොම්පාගාරයක් ස්ථාපිත කිරීමේ ශක්‍යතාවයද එමඟින් හඳුනාගනු ඇත.

අධ්‍යයන ප්‍රදේශයේ ජලාධාරය කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇතුලත්ව වන හෙක්ටයාර 1412 කින් සමන්විත වේ. හඳුනාගන්නා ලද ඇළ මාර්ග පද්ධතිය දිගින් කි.මී. 12 ක් වන ප්‍රධාන ඇළ මාර්ග වලින් සහ දිගින් කි.මී. 14 කින් යුත් පර්යන්ත ඇළ මාර්ග වලින් සමන්විත වේ.

මූලික කාර්යයන් 2012 වර්ෂයේ සැප්තැම්බර් මස සිට 2012 දෙසැම්බර් මස දක්වා වූ කාලය තුල සම්පූර්ණ කර ඇති අතර ඇළ මාර්ග පද්ධතියේ මිණුම් කටයුතු 2012 වර්ෂයේ අගොස්තු මාසයේදී නිම වීමට ආසන්නව පැවතිණි. 2013 වර්ෂයේ ජූලි මස සිට අපවහන සැලසුම් කාර්යයන් සිදු කරන ලද අතර එය 2014 වර්ෂයේ අගෝස්තු මස නිම කරනු ඇත. MIKE11 භාවිතා කරමින් ගංවතුර ආකෘතියක් සකස් කිරීම, සහ ඇළ මාර්ග පද්ධතිය සැලසුම් කිරීම මෙම සැලසුම් කිරීමේ කාර්යයට ඇතුලත් වේ. සැලසුම් කාර්යයන් නිම වීමෙන් පසු 2016 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.



මිණුම් ලකුණු පරීක්ෂා කිරීම



වැඩබිමෙහි ලකුණු කර ඇති මිණුම් මට්ටම

මිණුම් කාර්යයන් සහ පාංශු විමර්ශන ඇතුලත්ව සවිස්තර සැලසුමෙහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 112 කි. ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැයට අමතරව සිවිල් කාර්යයන් සඳහා වන ව්‍යාපෘති පිරිවැය රු.මි. 4500 ක් වනු ඇත. ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 1000 කි. මෙම ප්‍රදේශයේ පැතිර පවතින ගංවතුර තත්ත්වය හේතුවෙන් මතුපිට ශුද්ධ පවිත්‍ර කිරීම සහ පවතින ඇළ මාර්ග පද්ධතිය හැරීම සඳහා අවශ්‍ය වන නඩත්තු කාර්යයන් මෙම වර්ෂය සහ ඉදිරි වර්ෂය තුල සිදු කරනු ඇත. නඩත්තු කාර්යයන් සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 200 කි. ඉදිරි වර්ෂය සඳහා ව්‍යාපෘතියෙහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 5612 කි.

2013 වර්ෂය තුලදී සිදු කරනු ලැබූ මට්ටම් මිණුම් කාර්යයන්හි වටිනාකම රු.මි. 1,973 කි, වැඩබිමෙහි මිණුම් මට්ටම් ලකුණු කිරීමේ පිරිවැය රු.මි. 0.043 කි, අකෘති සැලසුම් කාර්යයන් වල පිරිවැය රු.මි. 1.456 ක් සහ මිණුම් ලකුණු පරීක්ෂා කිරීම සහ වැඩබිම නිරීක්ෂණ චාරිකා වල පිරිවැය රු.මි. 0.638 කි. 2013 වර්ෂය තුල සිදු කරන ලද සමුච්චිත කාර්යයන් වල වටිනාකම රු.මි. 4,110 කි.

## ඉංජිනේරු ජල විද්‍යාව පදනම් කර ගනිමින් ඉඩම් සංවර්ධන යෝජනා ලබා දීම

වර්තමානයේ නාගරික ප්‍රදේශවල ජීවත් වන මනුෂ්‍ය ප්‍රජාවෙන් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයක් විධිමත් ජල අපවහන පද්ධතියකින් තොර අවසර නොලත් ඉදිකිරීම් තුල පදිංචි වී සිටී. මෙම තත්ත්වය හේතුවෙන් විශේෂයෙන් පහත් බිම් ප්‍රදේශ වල නිරන්තර ගංවතුර ඇති වේ. එබැවින් ඉංජිනේරු ජල විද්‍යාවට අනුව විධිමත් අපවහන පද්ධතියක් සැපයීම ඉතා වැදගත් වේ.

සැලසුම් කමිටුව විසින් අනුමත කරන ලද ජල අපවහන තත්ත්වයන් ක්‍රියාවට නැංවීමට යටත්ව ජල අපවහන යෝජනා ලබාදීම සහ පහත්බිම් සංවර්ධනය සඳහා අනුමැතිය ලබා දීම තුලින් විශේෂ ව්‍යාපෘති අංශය මෙම කාර්යය සිදු කරමින් සිටී. 2013 වර්ෂයේදී ඉඩම් නිරවුල් කිරීම තුලින් රු.මි. 5.3 ක් උපයා ගැනීමට මෙම අංශයට හැකි වී ඇත.

ලිපි ගොනුවක් විවෘත කර ඉඩම් සංවර්ධනය කිරීම සඳහා සංස්ථාවේ පවතින නීති සහ රෙගුලාසි සමඟ කටයුතු කරගෙන යෑම සඳහා කැමැත්ත ලබා දෙනලද කෘෂිකර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ලිපියක් ඉදිරිපත් කිරීමෙන් කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීම සඳහා සළකා බැලිය හැකි වේ. කුඹුරු ඉඩම් නොවන ඉඩම් සඳහා ඉල්ලුම්කරුටම (පෞද්ගලික දේපල) ලිපිගොනු විවෘත කර ගත හැකි අතර සැලසුම් කමිටු තීරණය අදාල ඉල්ලුම්කරු වෙත යවනු ලැබේ. සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා දීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අව්‍යශ අවසරය සහ අනුමැතිය ලබා දිය යුතු වේ.

## කොළඹ සහ වෙනත් උප නාගරික ප්‍රදේශවල තෙත්බිම් කළමනාකරණය



තලවතුගොඩ වගුරු බිම

තෙත්බිම්, විවිධාකාරයේ භාණ්ඩ සහ සේවාවන් සමූහයක් සපයාදීම මඟින් මනුෂ්‍ය ජීවිත සහ ජීවනෝපාය තිරසාර කිරීම සඳහා සහාය දක්වන වඩාත් වැදගත් පරිසර පද්ධතියකි. කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශ වල සිදු වන සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් තෙත්බිම් තුල සහ අවට ප්‍රදේශ සැලකිය යුතු ලෙසින් සංවර්ධනය වෙමින් පවතී. එවැබින් ජාතියේ සංවර්ධනයත් සමඟින් ඉහත අහිතකර නැඹුරුතාවය ආපසු හැරවීම ඉතා වැදගත් වේ. තෙත් බිම් වලින් උත්පාදනය කරනු ලබන ආර්ථික ප්‍රතිලාභ බොහෝවිට පාරම්පරික ව්‍යාපෘති සහ ප්‍රතිපත්ති වල පරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණ වල නොසලකාහැර හෝ අඩු තක්සේරුවකට ලක් කර ඇත.

මුලින් මහ කොළඹ ජලාධාර ප්‍රදේශය සඳහා තෙත්බිම් කළමනාකරණ සැලසුමක් සකස් කිරීමට නියමිතය.




තිරසාර විකල්පයක් හඳුනාගැනීම සඳහා ජෛව විවිධත්වය සහ ප්‍රාදේශීය ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය යන මැයෙන් කොළඹ ප්‍රදේශයේ තෙත් බිම් පිළිබඳව කඩිනම් අධ්‍යයනයක් සිදු කල යුතු වේ.

මුලින් මහකොළඹ ප්‍රදේශය හෙක්ටයාර 380 කින් සමන්විත වුවද එම ප්‍රමාණය මේ වනවිට හෙක්ටයාර 287 දක්වා අඩු වී ඇත.

කොලොන්නාව වගුර, කෝට්ටේ වගුර සහ හීන් ඇළ වගුර කොළඹ පුරවර නාගරික තෙත්බිම් ලෙස හඳුනාගෙන ඇත. මෙම වගුරු බිම් සඳහා තෙත්බිම් කළමනාකරණ සැලසුම් සකස් කිරීමට පෙර ( මාදින්නාගොඩ වගුර සහ යක්බැද්ද වගුර ද ඇතුලත්ව) පරිසර පද්ධති සහ ජෛව-විවිධත්වය පිළිබඳ විස්තීර්ණ අධ්‍යයනයක් සිදු කරනු ලැබේ. තෙත්බිම් කළමනාකරණය පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වීමටද සැලසුම් කර ඇත.

තෙත්බිම් කළමනාකරණයෙහි නියමු ව්‍යාපෘතියක් ලෙස තලවතුගොඩ ජෛව-විවිධත්ව උද්‍යානය ඉදිකිරීම ආරම්භ කර ඇති අතර එය ජෛව-විවිධත්වය අධ්‍යයනය කිරීමේ මධ්‍යස්ථානයකින්, කුරුල්ලන් නැරඹීමේ කුළුණු වලින්, ජලයේ තත්ත්වය පරීක්ෂා කිරීමේ ස්ථාන වලින් (ඒකදේශීය ශාක සහ ජලජ විශේෂ ඇතුලත් වන ජල රැඳවුම් ජලාශ) , බෝට්ටු ජැටි සහ පාලම් ආදියෙන් සමන්විත වේ.

තලවතුගොඩ ජෛව-විවිධත්ව උද්‍යානය




ජෛව-විවිධත්ව උද්‍යානයේ වින්‍යාස සැලැස්ම



ජෛව-විවිධත්ව උද්‍යානය අවට පක්ෂීන්ගේ එක්රැස් වීම



ජලයේ තත්ත්වය පරික්ෂා කිරීම සඳහා ස්ථිර ළිඳක් ස්ථාපිත කිරීම

පන් සංරක්ෂණ වැඩසටහන



**මායිම් නැවත විවෘත කිරිමේ වැඩසටහන**

අත්පත් කරගත් රැඳවුම් ප්‍රදේශ කල් ගතවීමේදී ජනතාව විසින් ඔවුන්ගේ ජීවිත කාලය පුරා අනවසරයෙන් අත්පත් කරගෙන ඇත. එබැවින් මායිම් නැවත විවෘත කිරීම සඳහා මිණුම් කාර්යයන් 2013 වර්ෂයේදී ආරම්භ කර ඇත.

## කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ කොළඹ පුරවර ප්‍රදේශයේ ගංවතුර හේතුවෙන් ඇතිවන භෞතික සහ සමාජ ආර්ථික බලපෑම් අවම කරමින් ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරමින් පවතින නාගරික පුනරුත්ථාපන වැඩසටහන් වලට ඌනපූරණයක් ලෙස ප්‍රමුඛ ප්‍රාදේශීය යටිතල පහසුකම් සහ සේවා වැඩිදියුණු කිරීමයි. ව්‍යාපෘති ප්‍රදේශය පළාත් නාගරික අධිකාරී හතරකින් සමන්විත වේ:කොළඹ මහ නගර සභාව (CMC), දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව (DMMC), ශ්‍රී ජයවර්ධනපුර-කෝට්ටේ මහ නගර සභාව (SJ-KMC), කොලොන්නාව නගර සභාව (KUC). ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇ.ඩො.මි. 233 කි. ලෝක බැංකුවේ පුනරුත්ථාපනය සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව සහ ශ්‍රී ලංකා රජය විසින් ඒකාබද්ධව අරමුදල් සපයනු ලැබේ. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ව්‍යාපෘතිය කළමනාකරණය කරනු ලබන අතර ක්‍රියාවට නැංවීමේ වගකීම් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේ නියෝජිතායතනය තුනකට එනම් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය සහ කොළඹ නගර සභාවට පවරා ඇත. ව්‍යාපෘතිය 2012 වර්ෂයේ අප්‍රේල් මස ආරම්භ කර ඇති අතර 2017 වර්ෂයේ ජූනි මස නිම කිරීමට සැලසුම් කර ඇත.

කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රධාන සංරචක තුනකින් සමන්විත වේ. පළමු සංරචකය ගංවතුර සහ ජල අපවහන කළමනාකරණය පිළිබඳව අවධානය යොමු කරන අතර ඉහළ සමාජ ආර්ථික පිරිවැයක් සමඟින් කොළඹ පුරවර කලාපයේ ආර්ථිකය නිරන්තරයෙන් අඩපන කරනු ලබන ගංවතුර ගැටළුව සඳහා ඉක්මන් විසඳුම් සෙවීමට කටයුතු කරනු ලැබේ. දෙවැනි සංරචකය ව්‍යාපෘති ක්‍රියාත්මක බල ප්‍රදේශ වල නාගරික සංවර්ධනය සහ යටිතල පහසුකම් පුනරුත්ථාපනය සඳහා අවධානය යොමු කරනු ලැබේ. තුන්වෙනි සංරචකය ව්‍යාපෘතිය ක්‍රියාවට නංවන නියෝජිතායතනයන් සඳහා ක්‍රියාවට නැංවීමේ සහායෙන් සමන්විත වේ.

### 1 වැනි සංරචකය: ගංවතුර සහ ජල අපවහන කළමනාකරණය

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් සභාපතීත්වය දරන අන්තර්-නියෝජිතායතන ගංවතුර වැළැක්වීමේ කාර්ය බලකාය මඟින් ප්‍රමුඛතා ලෙස හඳුනාගත් ප්‍රමුඛත්ව ගංවතුර සහ ජල අපවහන කළමනාකරණය යටිතල පහසුකම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීමට මෙම සංරචකය මඟින් සහාය ලබා දේ. කොළඹ ජල ද්‍රෝණියෙහි පෝෂක ප්‍රදේශයේ අනාගත ගංවතුර බලපෑම් අවම කිරීම සඳහා මෙම සංරචකය යටතේ ආයෝජන පැකේජ අත්‍යවශය සහ තීරණාත්මක වේ. ප්‍රාථමික සහ ද්විතීයික ඇළ මාර්ග පද්ධතිය, රැඳවුම් ප්‍රදේශ සහ සහ කොළඹ ජල ද්‍රෝණියෙහි ජල අපවහනය වැඩිදියුණු කිරීම බොහොමයක් ව්‍යුහාත්මක ආයෝජන වල ඉලක්කය වේ. ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම සහ ජලාශයන්හි ආර්ථික වටිනාකම සහ සෞන්දර්යාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සිදු කරනු ලබන මැදිහත්වීම් සඳහාද සහාය දක්වනු ලැබේ.

ප්‍රාථමික සහ ද්විතියික ඇළ මාර්ග සහ වැව් වැඩිදියුණු කිරීමට මෙන්ම ගංවතුර සහ ජල අපවහන කළමනාකරණ උප සංරචක සඳහා ධාරිතාවය ඉහළ නැංවීමට ශ්‍රීලඉගොහාසසස වගකීම දරනු ලැබේ. මෙම උප සංරචක දෙක සඳහා පිරිවැය වෙන්කිරීම ඇ.ඩො.මි. 107.9 කි.

අධික වර්ෂාව සහ ප්‍රමාණවත් නොවන ගබඩා කිරීමේ, ගෙනයෑමේ සහ පිටතට ගලායෑමේ ධාරිතාවයක් සහිත මහා පරිමාණ ජල අපවහන පද්ධතිය හේතුවෙන් කොළඹ ගංවතුර ඇති වේ. අනවසර ගොඩකිරීම් සහ ගංවතුර තැන්නෙහි සිදු කර ඇති නීතිවිරෝධී පදිංචිවීම් හේතුවෙන් පසුගිය දශකයේදී ද්‍රෝණියෙහි ධාරිතාවය 30% කින් අඩු වී ඇත. ඝන අපද්‍රව්‍ය, පාවෙන සුන්බුන් සහ ඇළ මාර්ග අවහිරතා හේතුවෙන් ගලායෑමේ ධාරිතාවය සීමාසහිත වී ඇත. අධික වර්ෂාව හේතුවෙන් කැළණි ගඟේ ජල මට්ටම ඉහළ යෑම නිසා කැළණි ගඟට ජලය බැස යෑම තවදුරටත් සීමා වේ. මෙම සියළු බලපෑම් කාලගුණික විපර්යාස හේතුවෙන් අනාගතයේදී වඩාත් අයහපත් විය හැක. වර්ෂාපතන නැඹුරුතා විශාල ජල ප්‍රමාණයක් පද්ධතිය එක් වීමක් පෙන්නුම් කරන අතර මුහුදු මට්ටම ඉහළ යෑම හේතුවෙන් ගුරුත්ව ජල බැස්මට බාධා ඇති වේ.

ඉහත බාධාවන් පදනම් කර ගනිමින් ඵලදායී ගංවතුර කළමනාකරණයක් සඳහා පහත සඳහන් ගංවතුර වැළැක්වීමේ ක්‍රියාමාර්ග 18 ක් මෙම උප සංරචක යටතේ දක්වා ඇත. ක්‍රියාවට නැංවීමේ ප්‍රමුඛත්වය අනුව මෙම උප ව්‍යාපෘති වල සාරාංශයක් පහත දක්වා ඇත.

| අංකය | පැකේජයේ නම | පැකේජ අංකය | සටහන |
|---|---|---|---|
| 1 | දෙහිවල ඇළ පුනරුත්ථාපනය කිරීම | SLLRDC/W/01 | ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ අවධියේ පසුවේ |
| 2 | ප්‍රධාන අපවාන, අළුත් මාවත බෝක්කුව, මෝදර හතරැස් අපවාන, උමං පිවිසුම සහ පිටවාන පුනරුත්ථාපනය කිරීම | SLLRDC/W/02 | ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ අවධියේ පසුවේ |
| 3 | වැල්ලවත්ත ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම සහ ගාලු පාර පාලම අසලදී වැල්ලවත්ත ඇළ මාර්ගයෙහි ගලා බැසීම වැඩි දියුණු කිරීම | *SLLRDC/W/07/A* | සැලසුම් - නිම කිරීමට ආසන්න වී ඇත. කාර්යය පැකේජයක් ලෙස ටෙන්ඩර් කිරීමට තීරණය කර ඇති අතර ප්‍රසම්පාදන ලියවිලි සකස් කල යුතුව පවතී. |
| 4 | ශාන්ත සෙබස්තියන් දකුණ ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | *SLLRDC/W/03/A* | සැලසුම් - 100% සම්පූර්ණ කර ඇත. ප්‍රසම්පාදන ලියවිලි - 100% සම්පූර්ණ කර ඇත<br>නැවත පදිංචි කිරීම නිම වන තුරු සිටී. |
| 5 | මෝදර නව උමඟක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම | *SLLRDC/W/14* | මූලික අධ්‍යයන - 100% සම්පූර්ණ කර ඇත. සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා පෙර-සුදුසුකම් ලියවිලි සකස් කරමින් පවතී. |
| 6 | ටොරින්ටන් උමඟ සැලසුම් කිරීම සහ ඉදිකිරීම | *SLLRDC/W/17* | මූලික අධ්‍යයන - 100% සම්පූර්ණ කර ඇත. සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්රාත්කරුවන් සඳහා පෙර-සුදුසුකම් ලියවිලි සකස් කරමින් පවතී. |
| 7 | මාදිවෙල නැගෙනහිර හැරවුම් කාර්යය ක්‍රමය සඳහා වැඩිදියුණු කිරීම් : අදියර - I | *SLLRDC/W/05* | සැලසුම් - 50% සම්පූර්ණ කර ඇත. |
| 8 | ශාන්ත සෙබස්තියන් නව දකුණ හැරවුම ඉදිකිරීම | *SLLRDC/W/13* | සැලසුම් - 25% සම්පූර්ණ කර ඇත. හැරවුම් මඟ තීරණය කිරීම අවසන් කල යුතුව ඇත. |
| 9 | ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | *SLLRDC/W/09* | සැලසුම් - 95% සම්පූර්ණ කර ඇත. ප්‍රසම්පාදන ලියවිලි - 60% සම්පූර්ණ කර ඇත.<br>LA සිදු කරමින් පවතී<br>2013 දෙසැම්බර් මස නැවත පදිංචි කිරීම් සිදු වන බව අපේක්ෂාවෙන් සිටී |
| 10 | වැව් නිර්මාණය කිරීම (අංක 06 සහ 07) | *SLLRDC/W/06* | සැලසුම් - 95% සම්පූර්ණ කර ඇත.<br>EIA හෝ IEE සිදු කල යුතුව පවතී. |
| 11 | මාදිවෙල නැගෙනහිර හැරවුම සඳහා වැඩිදියුණු කිරීම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම : අදියර II | *SLLRDC/W/11* | මූලික සැලසුම් උපදේශන සඳහා RFP නිශ්චය කරමින් පවතී. |
| 12 | ශාන්ත සෙබස්තියන් උතුරු දියගුලු දොරවල් සහ පොම්පාගාරයක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම | *SLLRDC/W/12* | මූලික සැලසුම් උපදේශන සඳහා RFP නිශ්චය කරමින් පවතී. |
| 13 | දෙමටගොඩ ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | *SLLRDC/W/03/B* | සැලසුම් - 40% සම්පූර්ණ කර ඇත.<br>LA සහ නැවත පදිංචි කිරීම් සිදු කල යුතුව ඇත. |
| 14 | කොලොන්නාව ඇළ හැරවුම සහ ගොතටුව පොම්පාගාරය සැලසුම් කිරීම සහ ඉදිකිරීම | *SLLRDC/W/16* | සංකල්පීය සැලසුම් කාර්යයන් සම්පූර්ණ කර ඇත.<br>සැලසුම් සකස් කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| 15 | සරණ මාවත ඇළ මාර්ගය සහ සෙත්සිරිපාය ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | *SLLRDC/W/04* | සැලසුම් සැකසීම නිම වීමට ආසන්නව පවතී. අරමුදල් පැවතීම සළකා බැලිය යුතුව පවතී. |
| 16 | පූර්වාරාම සහ ශ්‍රී වික්‍රම ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීම | *SLLRDC/W/07/ B* | සැලසුම් සකස් කල යුතුව පවතී. අරමුදල් පැවතීම සළකා බැලිය යුතුව පවතී. |
| 17 | අපවහන පද්ධති කළමනාකරණ වැඩිදියුණු කිරීම්, තටාකාංගන, සපත්තු පාලම් ආදිය. | *SLLRDC/W/08* | පසුව තීරණය කරනු ලැබේ. |
| 18 | අංක 08 වැව නිර්මාණය කිරීම | *SLLRDC/W/10* | පසුව තීරණය කරනු ලැබේ. |

**ගංවතුර සහ ජල අපවහන කළමනාකරණය සඳහා ධාරිතා වර්ධනය**

මෙම උපසංරචකය, ව්‍යාපෘති ආයෝජනයන්හි තිරසාරකත්වය සහතික කිරීම සඳහා මහ කොළඹ ජල ද්‍රෝණිය සඳහා සමස්ථ ජල අපවහන පද්ධති කළමනාකරණය වැඩිදියුණු කිරීම ඉලක්ක කරගනු ලබනවා ඇත. එය;

i. ඇළ මාර්ග ඔස්සේ තෝරාගත් භූමිසැකසුම් සඳහා ආයෝජන සිදු කිරීම සහ ප්‍රධාන ඇළ මාර්ග පොදු ප්‍රවාහනය යොදාගත හැකි බව පෙන්වීම සඳහා සිදු කරනු ලබන ජලය පදනම් කරගත් නියමු ප්‍රවාහන පද්ධතියකට සහාය දැක්වීම

ii. ඇළ මාර්ග නඩත්තු යන්ත්‍රසූත්‍ර මිලදී ගැනීම

iii. කොළඹ ජල ද්‍රෝණිය සඳහා ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියක් සකස් කිරීම

යන අංශ වලින් සමන්විත වේ. ඒකාබද්ධ ගංවතුර කළමනාකරණ පද්ධතියට, ජල රැඳවුම්/තෙත්බිම් ප්‍රදේශ අධීක්ෂණය සහ කළමනාකරණය කිරීම, තෙත්බිම්, ඇළ මාර්ග, අපවහන පද්ධති සඳහා මෙහෙයුම් සහ නඩත්තු පද්ධති ඇති කිරීම, ඉඩම් භාවිතය අධික්ෂණය සහ බලාත්මක කිරීම, ගංවතුර මැඩපැවැත්විය හැකි වන අයුරින් ද්‍රෝණියෙහි ධාරිතාවය ආරක්ෂා කිරීම සඳහා සැලසුම් කිරීම සහ ගිවිසුම් සහ යාන්ත්‍රණ වල ඒකාබද්ධ සම්බන්ධීකරණය ඇතුලත් වේ.

**2013 දෙසැම්බර් 31 වැනි දිනට ප්‍රගතිය**

### *1.* දෙහිවල ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම - කාර්යය පැකේජය *SLLRDC/W/01*

2013.05.20 වැනි දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රු.මි. 193.85 ක් වන අතර ව්‍යාපෘති කාලය මාස 12 කි. සමුච්චිත භෞතික ප්‍රගතිය 42% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය රු.මි. 57.31 කි.

නව ගේබියන් බැම් ඉදිකරමින් පවතී. සැලසුම්ගත ප්‍රමාණය ස.මී.4,275.00 ක් වන අතර 2013 දෙසැම්බර් මස 31 වැනි දිනට නිම කරන ලද ප්‍රමාණය ස.මී. 2,226 කි.





### 2. අළුත් මාවත බෝක්කුව, මෝදර හතරැස් අපවාන, මෝදර උමං මනුබිල, මෝදර මෝයෙහි ඉවුරු වැඩිදියුණු කිරීම සහ ප්‍රධාන කාණුවෙහි ඉවුරු ආරක්ෂණ - කාර්යය පැකේජය SLLRDC/W/02

2012.11.27 වැනි දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. ඇස්තමේන්තුගත ව්‍යාපෘති පිරිවැය රු.මි. 409.97 ක් වන අතර ව්‍යාපෘති කාලසීමාව මාස 18 කි. සමුච්චිත භෞතික ප්‍රගතිය 67% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය රු.මි. 21.50 කි.

ප්‍රධාන අපවාන, අළුත් මාවත බෝක්කුව, මෝදර හතරැස් අපවාන, උමං පිවිසුම සහ පිටවාන පුනරුත්ථාපනය කිරීමේ කාර්යයන්, සිදු කරමින් පවතී.



අළුත් මාවත බෝක්කුව ඉදිකිරීම




මෝදර මෝයෙහි වැඩිදියුණු කිරීම්

කොන්ක්‍රීට් දියලිය ඉදිකිරීම නිම කර ඇති අතර අපවහන වැඩිදියුණුකිරීම් ඉදිකරමින් පවතී.




ක්‍රියාවට නැංවීමට පෙර තත්ත්වය




ක්‍රියාවට නැංවීමෙන් පසු තත්ත්වය

3. **ඇළ ඉවුරු ආරක්ෂණ කාර්යයන්**

නව ගේබියන් බැමි ඉදිකිරීම - සැලසුම්ගත ප්‍රමාණය ස.මී.8,694.00 ක් වන අතර 2013 දෙසැම්බර් මස 31 වැනි දිනට නිම කරන ලද ප්‍රමාණය ස.මී. 5,870.0 කි.

පවතින ගේබියන් බැමි පුනරුත්ථාපනය කිරීම- සැලසුම්ගත ප්‍රමාණය ස.මී.1,052.0 ක් වන අතර 2013 දෙසැම්බර් මස 31 වැනි දිනට නිම කරන ලද ප්‍රමාණය ස.මී. 668.0 කි.








MIKE 11 එන්ටර්ප්‍රයිස් මෘදුකාංගය මඟින් කොළඹ පුරවර කලාපය සඳහා ජලවිද්‍යාත්මක ආකෘතිය ගොඩනංවා ක්‍රමාංකනය කර සහ තහවුරු කර ඇත. වසර 50 ක ඉලක්කගත ඉදිරි කාලයක් සඳහා කොළඹ ප්‍රදේශය ගංවතුරින් ආරක්ෂා කිරීම සඳහා මැදිහත්වීම් 16ක් යෝජනා කර ඇත. එක් එක් සහ සියළු වැඩිදියුණු කිරීමකම මෙන්ම විවිධ සංයෝජනයන්ගේ ඵලදායීතාවය ආකෘතිය මඟින් පරීක්ෂා කරන ලදී.

2013.12.31 වැනි දිනට ප්‍රගතිය පහත වගුවෙහි දක්වා ඇත.

| පැකේජ අංකය | ව්‍යාපෘතිය | ව්‍යාපෘති අදියර සඳහා සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රගතියෙහි % | | සටහන් |
|---|---|---|---|---|
| | | සැලසුම | ඉදිකිරීම | |
| SLLRDC/W/07/A | වැල්ලවත්ත ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | 90% | 10% | කාර්යය පැකේජ ලෙස ටෙන්ඩර් කිරීමට තීරණය කර ඇති අතර ප්‍රසම්පාදන ලියවිලි සකස් කරමින් පවතී. |
| SLLRDC/W/03/A | ශාන්ත සෙබස්තියන් දකුණ ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | 100% | 50% | ටෙන්ඩර් කිරීමට ප්‍රසම්පාදන ලියවිලි සූදානම් කර ඇත.<br>මෙම වැඩිදියුණු කිරීම හේතුවෙන් බලපෑමට ලක් වන ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2014 ජනවාරි මස 16 සහ 17 දිනයන්හි පැවැත්වීමට නියමිතය.<br>ස්ථිර වශයෙන් නැවත පදිංචි කරවීම 2014 ඔක්තෝබර් මස සිදු කිරීමට අපේක්ෂිතය |
| SLLRDC/W/14 | මෝදර නව උමඟක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම | 90% | 10% | මූලික අධ්‍යයන - 100% සම්පූර්ණ කර ඇත.<br>CEA නිශ්කාෂණය - 75% සම්පූර්ණ කර ඇත.<br>පෙරසුදුසුකම් ලේඛන, සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් ලේඛන සකස් කරමින් පවතී. සැලසුම් සහ ඉදිකිරීම් ලේඛන සඳහා ඇදීම් සකස් කරමින් පවතින අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් මිහිවිදුමන් (borehole) විස්තර ලැබෙන තෙක් සිටී. |
| SLLRDC/W/17 | ටොරින්ටන් උමඟ සැලසුම් කිරීම සහ ඉදිකිරීම | 65% | | ප්‍රධාන උමඟ සැලසුම් නිම කර ඇත.ප්‍රධාන උමඟ සඳහා අවගාර මිහිවිදීම (auger boring) තාක්ෂණය භාවිතයෙන් පාර්ශවික සම්බන්ධතා ලබා දීම පිළිබඳව අධ්‍යයනය කරමින් පවතී. පෙරසුදුසුකම් ලේඛන, සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් ලේඛන සකස් කරමින් පවතී. සැලසුම් සහ ඉදිකිරීම් ලේඛන සඳහා ඇදීම් සකස් කරමින් පවතින අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් මිහිවිදුමන් (borehole) විස්තර ලැබෙන තෙක් සිටී. |
| SLLRDC/W/05 | මාදිවෙල නැගෙනහිර හැරවුම් කාර්යය ක්‍රමය සඳහා වැඩිදියුණු කිරීම්: අදියර -I | 70% | | තලංගම වැව පිළිබඳ අවසන් යෝජනාව සම්බන්ධයෙන් ඔවුන්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව සමඟ රැස්වීමක් පැවැත්වීමට නියමිතය.<br>ඉවුරු ආරක්ෂණය සඳහා ව්‍යුහාත්මක සහ භූතාක්ෂණික සැලසුම් සකස් කරමින් පවතී. |
| SLLRDC/W/13 | ශාන්ත සෙබස්තියන් නව දකුණ හැරවුම ඉදිකිරීම | 30% | | විකල්ප කිහිපයක් සළකා බැලීමෙන් යෝජිත හැරවුම් මඟ තීරණය කරන ලදී.<br>උපයෝගිතා මාර්ග මාරු කිරීම සිදු කල යුතුව ඇත.<br>ව්‍යුහාත්මක සහ භූතාක්ෂණික සැලසුම් සකස් කල යුතුව පවතී. |

| පැකේජ අංකය | ව්‍යාපෘතිය | ව්‍යාපෘති අදියර සඳහා සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රගතියෙහි % | | සටහන් |
|---|---|---|---|---|
| | | සැලැස්ම | ප්‍රසම්පාදනය | |
| SLLRDC/W/09 | ශාන්ත සෙබස්තියන් උතුරු ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | 95% | 40% | අවසන් කිරීමට සහ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සමඟ ටෙන්ඩර් කිරීමට නියමිතය.<br>ස්ථිර නැවත පදිංචි කිරීම 2015 අප්‍රේල් මස වන විට සිදු කිරීමට අපේක්ෂා කෙරේ. |
| SLLRDC/W/06 | වැව් නිර්මාණය කිරීම (අංක 06 සහ 07) | 70% | | සංකල්පීය ඇඳීම් අවශ්‍ය ඇතුලත් කිරීම් සිදු කිරීම පිණිස තෙත්බිම් පිළිබඳ විශේෂඥවරයෙකු වන අචාර්ය මැතිව්ස් මහතා වෙත යවා ඇත. සවිස්තර ඇඳීම් සිදු කරමින් පවතී. ඔවුන්ගේ එකඟතාවය ලබා ගැනීම සඳහා අදාල ලේඛන මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත් කර ඇත. |
| SLLRDC/W/11 | මාදිවෙල නැගෙනහිර හැරවුම සඳහා වැඩිදියුණු කිරීම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම : අදියර II | 25% | | අළුතින් පත්කල උපදේශකවරයා සමඟ මූලික සැලසුම් සකස් කිරීමට නියමිතය. 2013.12.19 වැනි දින තෝරාගත් උපදේශකවරයා වෙත ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කර ඇත. |
| SLLRDC/W/12 | ශාන්ත සෙබස්තියන් උතුරු දියගුලු දොරවල් සහ පොම්පාගාරයක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම | 40% | | අළුතින් පත්කල උපදේශකවරයා සමඟ මූලික සැලසුම් සකස් කිරීමට නියමිතය. 2013.12.19 වැනි දින තෝරාගත් උපදේශකවරයා වෙත ප්‍රදානය කිරීමේ ලිපිය නිකුත් කර ඇත. |
| SLLRDC/W/03/B | දෙමටගොඩ ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | 40% | | ඉඩම් අත්පත් කර ගැනිම සහ නැවත පදිංචි කිරීම සිදු කල යුතුව ඇත. |
| SLLRDC/W/16 | ගොතටුව පොම්පාගාරය සැලසුම් කිරිම සහ ඉදිකිරීම | 25% | | ප්‍රධාන ආකෘතිය සමඟින් අකෘති ආභාසනයන් (simulations) සිදු කර ඇති අතර අනාරක්ෂිත කලාපය තුල පවතින අපවහන පද්ධතිය සමඟ ඒකාබද්ධ වෙමින් වෙනත් ආකෘතියක් සකස් කර ඇත.<br>යෝජිත හැරවුම් සඳහා ද්‍රාව (Hydraulic) සැලසුම් සකස් කරමින් පවතී. |
| SLLRDC/W/04 | සරණ මාවත ඇළ මාර්ගය සහ සෙත්සිරිපාය ඇළ මාර්ගය පුනරුත්ථාපනය කිරීම | 90% | | සරණ මාවත මුල් ප්‍රදේශයෙන් කොටසක් පමණක් ක්‍රියාවට නැංවීම සඳහා සළකා බැලීමට නියමිතය |
| SLLRDC/W/07/B | පූර්වාරාම සහ ශ්‍රී වික්‍රම ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීම | 5% | | සැලසුම් සකස් කල යුතුව පවතී.<br>අරමුදල් පැවතීම සළකා බැලිය යුතුව පවතී. |
| SLLRDC/W/08 | අපවහන පද්ධති කළමනාකරණ වැඩිදියුණු කිරීම්, තටාකාංගන, සපත්තු පාලම් ආදිය. | - | | පසුව තීරණය කරනු ලැබේ. |
| SLLRDC/W/10 | අංක 08 වැව නිර්මාණය කිරීම | - | | පසුව තීරණය කරනු ලැබේ. |

4. **නඩත්තු කාර්යයන් සඳහා ඉදිකිරීම් යන්ත්‍රසූත්‍ර සහ පරිගණක මෘදුකාංග සහ දෘඩාංග මිලදී ගැනීම**

- භාණ්ඩ පැකේජය – I {SLLRDC/G/01 - යන්ත්‍රසූත්‍ර සහ හැරීමේ උපකරණ}
  2013 වර්ෂයේ අගෝස්තු මස 23 වැනි දින භාණ්ඩ භාර දී ඇත.

| අංකය | යන්ත්‍රසූත්‍රයෙහි විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| A-1 | ඇම්පිබියස් සොෆ්ට් ටෙරීන් එක්ස්කැවේටරය (බකට්ටු ධාරිතාවය ඝ.මී. 0.8) | 2 |
| A-2 | ඇම්පිබියස් සොෆ්ට් ටෙරීන් එක්ස්කැවේටරය (බකට්ටු ධාරිතාවය ඝ.මී. 0.4) | 2 |
| A-3 | ඇම්පිබියස් සොෆ්ට් ටෙරීන් එක්ස්කැවේටරය (බකට්ටු ධාරිතාවය ඝ.මී. 0.25) | 1 |
| A-4.1 | ක්‍රොවුලර් එක්ස්කැවේටරය (බකට්ටු ධාරිතාවය ඝ.මී. 0.9) | 10 |
| A-4.2 | ක්‍රොවුලර් එක්ස්කැවේටරය සඳහා ලෝන්ග් ආර්ම් කට්ටල (බකට්ටු ධාරිතාවය ඝ.මී. 0.5) | 4 |
| A-5 | ක්‍රොවුලර් එක්ස්කැවේටරය (බකට්ටු ධාරිතාවය ඝ.මී. 0.4) | 4 |
| A-6 | ලෝන්ග් ආර්ම් ක්‍රොවුලර් එක්ස්කැවේටරය (බකට්ටු ධාරිතාවය ඝ.මී. 0.5, මීටර් 15 වඩා ලඟා විය හැක) | 6 |
| A-7 | ඩෝසර් තලය සහිත කුඩා එක්ස්කැවේටරය (බකට්ටු ධාරිතාවය ඝ.මී. 0.10m$^3$) | 2 |
| A-8 | බෝට්ටු | 4 |
| A-9 | වැඩ වේදිකා කැබලි (මීටර් 1.0*0.5*0.5) | 100 |





- භාණ්ඩ පැකේජය – II {SLLRDC/G/02- ප්‍රවාහන සහ උපයෝගිතා වාහන}
  මිලදී ගැනීමේ ඇනවුම් ලබා දී ඇත.

| අංකය | යන්ත්‍රසූත්‍රයෙහි විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| B-1 | ටිපර් ට්‍රක් රථය - ටොන් 15 රෝද10 | 14 |
| B-2 | ටිපර් ට්‍රක් රථය - ටොන් 10 රෝද 06 | 6 |
| B-3 | ජල බවුසරය – ලීටර් 7000 | 2 |
| B-4 | ටේලරය සහිත ට්‍රැක්ටරය – ටොන් 2.5 | 10 |
| B-5 | උපයෝගිතා වාහන - 4WD | 2 |
| B-6 | ඩබල් කැබ් රථය – 4WD | 10 |
| B-7 | බස් රථය (ආසන 30) | 1 |

- භාණ්ඩ පැකේජය III- {SLLRDC/G/03- පරීක්ෂණාගාර උපකරණ සහ මෙවලම් මිලදී ගැනීම} ලේඛන සකස් කරමින් පවතී

| අංකය | උපකරණය | ප්‍රමාණය | ඒකකය |
|---|---|---|---|
| D.1 | නියැදි 36 ක් සඳහා ඉන්කියුබේටරය සහිත රෙස්පිරෝමෙට්රික් BOD ඒකක 36 | 1 | අදාල නොවේ |
| D.2 | අතේ ගෙන යා හැකි ජල තත්ත්වය පරීක්ෂා කිරීමේ උපකරණය | 1 | අදාල නොවේ |
| D.3 | දියවී ඇති ඔක්සිජන් ප්‍රමාණය මැනීමේ මාපකය | 1 | අදාල නොවේ |
| D.4 | pH මාපකය | 1 | අදාල නොවේ |
| D.5 | පරීක්ෂණ පෙරහන් කට්ටල | 1 | කට්ටල |
| D.6 | පරිගණකගත ත්‍රි-අක්ෂීය පරීක්ෂණ යන්ත්‍රය | 1 | අදාල නොවේ |
| D.7 | CBR උපාංග | 1 | කට්ටල |
| D.8 | වීදුරු බඩු සහ වෙනත් උපාංග | 1 | කට්ටල |
| D.9 | ස්වයංක්‍රීය වර්ෂා මානය | 6 | අදාල නොවේ |
| D.10 | ස්වයංක්‍රීය ජල මට්ටම් මානය | 6 | අදාල නොවේ |
| D.11 | තථ්‍ය කාල කයින්මැටික් GPS උපකරණය | 2 | අදාල නොවේ |
| D.12 | ටෝටල් ස්ටේෂන් (Robotic) | 2 | අදාල නොවේ |
| D.13 | පරමාණුක අවශෝෂණ ස්පෙක්ට්‍රොමීටරය | 1 | අදාල නොවේ |
| D.14 | පරීක්ෂණාගාර ඩිජිටල් ටර්බිඩිටි මීටරය | 1 | අදාල නොවේ |
| D.15 | කොන්ක්‍රීට් පරීක්ෂා කිරීමේ මිටි කට්ටලය | 1 | අදාල නොවේ |
| D.16 | තුලා | 1 | කට්ටල |
| D.17 | වියලන යන්ත්‍ර | 1 | අදාල නොවේ |
| D.18 | ඇලුමිනියම් මිශ්‍රලෝහ තෙතමන ප්‍රමාණ භාජන | 1 | කට්ටල |
| D.19 | නියැදි බන්දේසි | 1 | කට්ටල |
| D.20 | රයිෆල් පෙට්ටි (නියැදුම් වෙන්කරණය) | 1 | කට්ටල |
| D.21 | මිට සහිත මළ නොබැදෙන වානේ ඉස්කෝප්ප | 1 | කට්ටල |
| D.22 | බර වැඩ තහඩු කියත | 1 | අදාල නොවේ |
| D.23 | දියමන්ති එබ්බවූ ද්විත්ව නළ විදින කටු සෙ.මී. 65 | 50 | අදාල නොවේ |
| D.24 | NW දියමන්ති ආවරණ උපාහනය (casing shoe) | 30 | අදාල නොවේ |
| D.25 | NW TC ආවරණ උපාහනය | 30 | අදාල නොවේ |
| D.26 | NX ද්විත්ව නළ හර බටය සඳහා රයිමර කොපුව | 30 | අදාල නොවේ |
| D.27 | NW දියමන්ති එබ්බවූ ආවරණ කටුව | 30 | අදාල නොවේ |
| D.28 | HW දියමන්ති එබ්බවූ ආවරණ කටුව | 20 | අදාල නොවේ |
| D.29 | HW දියමන්ති ආවරණ උපාහනය | 20 | අදාල නොවේ |

| අංකය | උපකරණය | ප්‍රමාණය | ඒකකය |
|---|---|---|---|
| D.30 | NMLC හර බටය 1.5 | 5 | අදාල නොවේ |
| D.31 | AW ජල වටනය | 10 | අදාල නොවේ |
| D.32 | ද්විත්ව නළ හර බටය NX මීටර් 1.5 AW දණ්ඩ සබැඳුම | 10 | අදාල නොවේ |
| D.33 | AW දණ්ඩ පෙට්ටිය සහිත NW හරස් ෂොපින් කටුව | 15 | අදාල නොවේ |
| D.34 | NMLC රයිමර කොපුව | 12 | අදාල නොවේ |
| D.35 | NMLC එබ්බවූ හර කටුව සෙ.මී. 65 | 20 | අදාල නොවේ |
| D.36 | කැපුම් තල TC අංශු මඟින් වැර ගන්වන ලද 3.5' වින්ග් ඩ්‍රැග් කටු xAW දණ්ඩ සබැඳුම | 20 | අදාල නොවේ |
| D.37 | NX හර කපනය | 20 | අදාල නොවේ |
| D.38 | 0.5 m AW විදින දඬු | 5 | අදාල නොවේ |
| D.39 | 0.3 m NW කොපුව | 5 | අදාල නොවේ |

- භාණ්ඩ පැකේජය – IV{SLLRDC/G/04- ඉදිකිරීම් උපකරණ මිලදී ගැනීම }

  ලේඛනය තාක්ෂණ ඇගයීම කමිටුව විසින් ඇගයීමට කරමින් පවතී.

| අංකය | යන්ත්‍රසූත්‍රයෙහි විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| D-1 | ෆරන්ට් එන්ඩ් වීල් ලෝඩරය (බකට්ටු ධාරිතාවය ඝ.මී. 2.0) | 1 |
| D-2 | බැකෝ ලෝඩරය | 5 |
| D-3 | වීල් එක්ස්කැවේටරය (බකට්ටුව කියුබික් මී. 0.4 සහ ළඟා විය හැකි දුර මී. 7) | 4 |
| D-4 | රෆ් ටෙරීන් ක්‍රේන් යන්ත්‍රය ටොන් 45 | 1 |
| D-5 | ස්කිඩ් ස්ටියර් ලෝඩරය | 3 |
| D-6 | සක්ෂන් ඇන්ඩ් ජෙටින් වාහනය (රොන්මඩ ටැංකිය ඝ.මී. 5, පිරිසිදු ජල ටැංකිය ඝ.මී. 3) | 1 |
| D-7 | බූම් ට්‍රක් රථය (ක්‍රේන් ටොන් 2, බර ධාරිතාවය ටොන් 17 ) | 2 |
| D-8 | ලෝ බෙඩ් ටේලරය සහිත ප්‍රයිම් මූවර් යන්ත්‍රය (ටොන් 40 ) | 1 |
| D-9 | ක්‍රොව්ලර් ට්‍රැක්ටරය (ඩෝසරය) 85 HP | 1 |
| D-10 | පාවෙන ඩෝසරය (ටොන් 15) | 1 |
| D-11 | මෝටර් ග්‍රේඩරය (තලය අඩි 12) | 1 |
| | මුල් උදුරන යන්ත්‍රය | |
| | ගලි සකරය | |
| | කෘෂ කැබ් රථය | |

- භාණ්ඩ පැකේජය V- { ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම}

| අංකය | උපකරණය | ප්‍රමාණය |
|---|---|---|
| E-1 | රොන්මඩ පොම්පල විශ්කම්භය අඟල් 6 | 2 |
| E-2 | රොන්මඩ පොම්පල විශ්කම්භය අඟල් 4 | 4 |
| E-3 | ශබ්ද රෝධක විදුලි ජනක යන්ත්‍රය 250 KVA | 1 |
| E-4 | ශබ්ද රෝධක විදුලි ජනක යන්ත්‍රය 27 KVA | 2 |
| E-5 | පැන්නුම් සහිත වායු සම්පීඩක යන්ත්‍රය | 2 |
| E-6 | අශ්ව බල 40 පිටත එන්ජිම සහ කෙටි අවරක් සහිත තන්තු වීදුරු බෝට්ටුව | 4 |
| E-7 | කම්පන රෝලරය ටොන් 5 | 1 |
| E-8 | කම්පන රෝලරය ටොන් 2 | 2 |
| E-9 | සයිලන්ට් පයිලරය ටොන් 5 | 1 |

- පරිගණක මෘදුකාංග

  ද්‍රාව අකෘති සඳහා MIKE 11 එන්ටප්‍රයිස් මෘදුකාංගය සහ ARC GIS *මේ වන විට මිලදී ගෙන භාවිතා කර ඇත.*

**5. "කොළඹ පුරවරය ගංවතුර සුනැම් නාගරික පරිසරයක් කරා" ව්‍යාපෘතිය දියත් කරමින්. 2103 ඔක්තෝබර් මස 28 දින පැවති ජපාන ප්‍රතිපත්ති සහ මානව සම්පත් සංවර්ධන තාක්ෂණික සහාය වැඩසටහන යටතේ වන ව්‍යාපෘතියකි.**

මෙම ව්‍යාපෘතිය යටතේ බාහිර උපදේශකවරුන් මඟින් සවිස්තර ගංවතුර අවදානම් ඇගයීමක්, ගංවතුර අවදානම අවම කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක්, තෙත්බිම් සඳහා ප්‍රධාන සැලැස්මක් සහ කොළඹ පුරවර ප්‍රදේශය තුල පවතින අභ්‍යන්තර ජලාශයන්හි ජලයෙහි තත්ත්වය ඇගයීමක් සකස් කිරීමට සැලසුම් කර ඇත.





# ඉදිකිරීම් අංශය

## සේවාදායකයින්ගේ ව්‍යාපෘති

### මයුර පෙදෙස නිවාස සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම (අදියර I සහ II)

*නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙනි*



නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතිය - කොළඹ නගරය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. ඉදිකිරීම් කාර්යයන් සිදු කිරීම සංස්ථාව භාරගෙන ඇත.

රු.මි. 434.29 ක මුළු පිරිවැයක් දරමින් නිවාස 120 කින් සමන්විත මහල් 12 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතියට අයත් වේ. එක් නිවාසයක්, නිදන කාමර දෙකකින්, මුළුතැන්ගෙයකින්, විසිත්ත කාමරයකින්, නාන කාමරකින් සහ සදළු තලයකින් සමන්විත වේ.

රු.මි. 217.0 ක පිරිවැයකින් අදියර I හි ව්‍යුහාත්මක කාර්යයන් මේ වන විට සම්පූර්ණ කර ඇති අතර අදියර I I හි නිම කිරීමේ කාර්යයන් රු.මි. 217.29 ක පිරිවැයකින් මෙ වනවිට සිදු කරමින් පවතී. ව්‍යාපෘතියේ සියළු කාර්යයන් 2014 වර්ෂයේ පෙබරවාරි මස නිම කිරීමට නියමිතය.

2013 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 90.59 ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 248.63 කි.





## 2. සාලමුල්ලෙහි නිවාස ඒකක 1008 ක් ඉදිකිරීම-(A, B , සහ C කාණ්ඩ)
*කොළඹ නගරයේ නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතිය වෙනුවෙනි*

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික පුනරුත්ථාපන ව්‍යාපෘතිය-කොළඹ නගරය යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. සැලසුම් සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු සහ උපදේශකවරයා වන්නේ සංස්ථාවයි. A, B සහ C වශයෙන් ගොඩනැගිලි කාණ්ඩ ත්‍රිත්වයක් ඉදිකිරීම මෙයට අයත් වේ. මෙම ගොඩනැගිලි ත්‍රිත්වයම මහල් 12 කින් සමන්විත වේ. A කොටසෙහි එක් මහලක් නිවාස ඒකක දහඅටකින්ද B සහ C කොටස් වල එක් මහලක් නිවාස ඒකක තිස්තුනකින් ද සමන්විත වේ.

නිවාස ඒකක 1008 ක් ඉදිකිරීම සඳහා පයිල් කිරීමේ කටයුතුද ඇතුලත්ව මුළු ව්‍යාපෘති ඇස්තමේන්තුව රු.මි. 2726.56 කි. එක් නිවාසයක්, නිදන කාමර දෙකකින්, විසිත්ත කාමරයකින්, මුළුතැන්ගෙයකින්, පැන්ට්‍රියකින්,නාන කාමරකින් සහ සදළු තලයකින් සමන්විත වේ.

2011 වර්ෂයේ අප්‍රේල් මස ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර 2015 වර්ෂයේදී නිම කිරීමට අපේක්ෂිතය. A කොටස ඉදිකිරීමේ කටයුතු සහ B සහ C කොටස් වල උප ව්‍යූහය ඉදිකිරීමේ කාර්යයන් සිදු කරමින් පවතී. 2013 වර්ෂය තුල සිදු කරන ලද කාර්යයන් වල වටිනාකම රු.මි. 178.36 ක් සහ රු.මි. 26.12 ක් වන අතර සිදු කරන ලද කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 319.10 කි. A කොටස ඉදිකිරීමේ කාර්යයන් සහ B සහ C කොටස් වල පයිල් කිරීමේ කාර්යයන් වල වටිනාකම රු.මි. 222.07 කි.





**A** කොටසෙහි ඉදිකිරීම් කාර්යයන් සිදු කරමින්



**B** සහ **C** කොටස් වන උප ව්‍යූහ කාර්යයන් සිදු කරමින්

**3. පරමාණුක බලශක්ති අධිකාරියෙහි විනාශකාරී නොවන පරීක්ෂණ සඳහා යෝජිත ජාතික මධ්‍යස්ථානය ඉදිකිරීම වෙදමුල්ල, කැලණිය ( A - කොටස)**



පරමාණුක බලශක්ති අධිකාරියෙහි විනාශකාරී නොවන පරීක්ෂණ (NCNDT) වෙනුවෙන් ජාතික මධ්‍යස්ථානයක් සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කෙරේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 309 කි. ව්‍යාපෘතිය 2013 වර්ෂයේ ජූනි මස ආරම්භ කර ඇති අතර 2014 වර්ෂයේ ජූනි මස නිම කිරීමට නියමිතය.

2013 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 110.29 ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 163.83 කි.

**4. හම්බන්තොට, සූරියවැව නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය යටතේ යෝජිත දෙමහල් නිවාස** ***අරමුදල් සැපයීම - හම්බන්තොට සංවර්ධන අරමුදල***

මෙම ව්‍යාපෘතිය නිවාස 15 කින් සමන්විත වේ. එක් නිවසක් විසිත්ත කාමරයකින්, පවුලේ කාමරයකින්, නිදන කාමර 03කින්, ගරාජයකින්, සඳළුතලයකින්, මුළුතැන්ගෙයකින් සහ නාන කාමර 02කින් යුක්ත වේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 117.69 කි. ව්‍යාපෘතිය 2012 අප්‍රේල් මස ආරම්භ කර ඇති අතර 2014 ජනවාරි මස වන විට නිම කිරීමට නියමිතය.

2013 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 61.10 ක් වන අතර සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 73.80 කි.





**ඉදිකිරීම් කාර්යයන් සිදු කරමින්**

## 5. බත්තරමුල්ල සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශ කාර්යාලයෙහි අභ්‍යන්තර කාර්යයන්

ඇලුමිනියම් සහ දැව භාවිතා කරමින් බෙදා වෙන්කිරීමෙන් කාර්යාල පරිශ්‍රය ඉදිකිරීම, බුමුතුරුණු යෙදීම, වයිනයිල් යොදා බිම සකස් කිරීම, පැන්ට්‍රි රාක්ක සවිකිරීම, ඇලුමිනියම් සහ දැව දොරවල් සවිකිරීම, පිළිගැනීමේ කවුළු සකස් කිරීම, තිරරෙදි සවිකිරීම (වර්ටිකල් බ්ලයින්ඩ්) සහ නව වැසිකිලියක් සෑදීම මෙම ව්‍යාපෘතියට අයත් වේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 33.65 කි. ව්‍යාපෘතිය 2013 මාර්තු මස ආරම්භ කර ඇති අතර 2013 ඔක්තෝබර් මස අවසන් කර ඇත.

2013 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 24.30කි.









**6. බත්තරමුල්ල, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ කාර්යාලය සඳහා අභ්‍යන්තර කාර්යයන්**

ඇලුමිනියම් භාවිතා කරමින් බෙදා වෙන් කිරිමේ කාර්යයන්, බිම බුමුතුරුණු යෙදීම, දොරවල් සපයා සවිකිරිම සහ පිළිගැනීමේ මේසයක් පිරිසකසා ස්ථාපිත කිරීම මෙම ව්‍යාපෘතිය යටතට අයත් වේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 14.56 කි. ව්‍යාපෘතිය 2013 ඔක්තෝබර් මස ආරම්භ කර ඇති අතර 2013 දෙසැම්බර් මස අවසන් කර ඇත.

2013 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 10.58 කි.





**7. පාදුක්ක පොළ ඉඩමෙහි යෝජිත ඇළ මාර්ග පද්ධතිය**

***(i). පාදුක්ක පොළ ඉඩමෙහි යෝජිත ඇළ මාර්ගය සහ අඩි පාලම ඉදිකිරිම***

පාදුක්ක පොළ ඉඩමෙහි මීටර් 72 ක් දිග ඇළ මාර්ගයක් සහ මීටර් 1ක් පළල අඩි පාලමක් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය යටතට ගැනේ.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 5.13 කි. ව්‍යාපෘතිය 2013 ජුනි මස ආරම්භ කර ඇති අතර 2013 ඔක්තෝබර් මස අවසන් කර ඇත.

2013 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 4.82 කි.





***(ii) පාදුක්ක පොළ භූමියෙහි පවතින ඇළ මාර්ගය ප්‍රතිසංවර්ධනය කිරීම (අදියර I)***

පාදුක්ක පොළ ඉඩමෙහි මීටර් 155ක් දිගින් යුතු ගේබියන් රැඳවුම් බැම් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලදී.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 13.53 කි. ව්‍යාපෘතිය 2013 සැප්තැම්බර් මස ආරම්භ කර ඇති අතර 2014 ජනවාරි මස අවසන් කර ඇත.

2013 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 12.07 කි.




**ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණ සිදු කරමින්**

***(iii) පාදුක්ක පොළ භූමියෙහි පවතින ඇළ මාර්ගය ප්‍රතිසංවර්ධනය කිරීම (අදියර II)***

පාදුක්ක පොළ ඉඩමෙහි මීටර් 66 ක් දිගින් යුතු ගේබියන් රැඳවුම් බැම් ඉදිකිරීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලදී.

ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 10.18 කි. ව්‍යාපෘතිය 2013 ඔක්තෝබර් මස ආරම්භ කර ඇති අතර 2014 ජනවාරි මස අවසන් කර ඇත.

2013 වර්ෂය තුල සිදු කර ඇති කාර්යයන්හි වටිනාකම රු.මි. 5.37 කි.



## <u>ස්වයං ආධාර ව්‍යාපෘති</u>

**ශ්‍රීලඉගොහාසසං සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

මෙම ගොඩනැගිල්ල G+4+ වහලයකින් සමන්විත වන අතර වාහන අංගනයකින්, කාර්යාල පරිශ්‍ර 02කින්, ආපනශාලාවකින් සහ සම්මන්ත්‍රණ ශාලාවකින් යුක්ත වේ. මෙම ගොඩනැගිල්ලේ මුළු වර්ග ප්‍රමාණය වර්ග අඩි 20710 ක් වන අතර ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 110කි. ව්‍යුහාත්මක සහ සේවා ඇඳීම් සකස් කිරීම පර්යේෂණ සහ සැලසුම් අංශයටත් ඉදිකිරීම් කාර්යයන් ඉදිකිරීම් අංශයටත් පවරා ඇත.

2013 වර්ෂය තුළ කරන ලද කාර්යයන්හි වටිනාකම රු.මි. 46.83 කි. සිදු කර ඇති කාර්යයන්හි සමුච්චිත වටිනාකම රු.මි. 95.5 කි.

ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ජනවාරි මස අවසන් කිරීමට නියමිතය.



## පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය

සංස්ථාවට අයත් සියළු යන්ත්‍රසූත්‍ර සහ යන්ත්‍රෝපකරණ වල හිමිකාරීත්වය, ක්‍රියාකාරීත්වය සහ නඩත්තුව සම්බන්ධයෙන් පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය වගකීම දරණු ලැබේ.

මෙම අංශය විසින් සිදු කරනු ලබන අනෙකුත් කාර්යයන් වන්නේ, විශාල පිරිසැකසුම් කාර්යයන් භාරගැනීම, සේවාදායක සඳහා හැරීමේ ව්‍යාපෘති භාර ගැනීම, පිරියත සහ යන්ත්‍රෝපකරණ කුලියට ලබාදීම ආදියයි.

2013 වර්ෂය තුලදී ශ්‍රීලඉගොහාසසං වේ පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය හැරීමේ සහ බර පිරිසැකසුම් කාර්යයන් බොහොමයක් සාර්ථකව නිම කර ඇත.

1. මත්තල ගුවන් තොටුපල අලංකරණය කිරීමේ ජලාශ සෑදීම.
2. වෝටර්ස්-එජ් හි අඩි පාලම් සෑදීම.
3. වේරුස් ගඟ සහ කිඹුලාවල ජලාශ.
4. අධිවේගී මාර්ගයේ එක් පැත්තක මුතුරාජවෙල ඇළ මාර්ග.

2013 වර්ෂයේ අගෝස්තු මාසයේදී ලෝක බැංකුව විසින් මූල්‍යාධාර සපයනු ලැබූ කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතියෙන් බරවැඩ යන්ත්‍රසූත්‍ර සහ හැරීමේ උපකරණ රාශියක් සංස්ථාවට ලැබිණි.

ලැබුනු යන්ත්‍රසූත්‍ර වල වටිනාකම ආසන්න වශයෙන් රු.මි. 454 කි. මෙම යන්ත්‍රසූත්‍ර යොදා ගැනීමෙන් බාහිර සැපයුම්කරුවන්ගෙන් යන්ත්‍රසූත්‍ර කුලියට ලබා ගැනීම සම්පූර්ණයෙන් නවතා දැමීමට සංස්ථාවට හැකි විය.



MCUDP යටතේ මිලදී ගත් යන්ත්‍රසූත්‍ර



ගාලු මුවදොර පැවති යන්ත්‍රසූත්‍ර භාර දීමේ උත්සවය

නව යන්ත්‍රසූත්‍ර නඩත්තු කිරීම සඳහා පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය විසින් නව වැඩපොළක් ඉදිකරන ලදී.



මාදිවෙල පිහිටි වැව හෑරීම සංස්ථාව විසින් සම්පූර්ණ කරන ලද ප්‍රධාන ව්‍යාපෘතියකි. පස් ඉවත් කිරීම සඳහා ''කටර් සක්ෂන් ඩ්‍රෙජර්'' යන්ත්‍රය සහ ''ඇම්ෆිබියස් ඩ්‍රෙජර්'' යන්ත්‍ර භාවිතා කරන ලදී. ශ්‍රී ජයවර්ධනපුර රෝහල අලස ඉඩමක් ගොඩකර බස් රථ නැවතීමේ අංගනයක් සකස් කිරීම සඳහා මෙම ස්ථානයෙන් ඉවත් කරන ලද ද්‍රව්‍ය යොදා ගන්නා ලදී.



කිඹුලාවල ජලාශයෙහි කාර්යයෙහි නියුතු කටර් සක්ෂන් ඩ්‍රෙජර් යන්ත්‍රය

වේරැස්ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරිමේ ව්‍යාපෘතියෙහි අදියර I යටතේ බෙල්ලන්විල වගුරෙහි ඇළ හෑරිම 2013 වර්ෂයේදී ආරම්භ කරන ලදී. හෑරීමේ කාර්යයන් වැඩපොළ පරිශ්‍රයේදී මේ වනවිටත් සිදු කරමින් පවතී.



වේරැස්ගංගා ව්‍යාපෘතියෙහි කාර්යයයේ නියුතු සංස්ථාවේ යන්ත්‍රසූත්‍ර



වේරැස් ගඟ ව්‍යාපෘතියේ හැරීමේ කාර්යයන් වල යෙදී සිටින ඇම්ෆිබියස් එක්ස්කැවේටර යන්ත්‍රය සහ ලෝන්ග් රීච් එක්ස්කැව්ටර යන්ත්‍රය



CHOGM 2013 සඳහා බත්තරමුල්ල පැවති ප්‍රදර්ශනය සඳහා භූමිය සකස් කරන ෂෝට් ආර්ම් එක්ස්කැවේටර් යන්ත්‍රය



කිඹුලාවල කුඹුරු වටා ඉවුර සකස් කරන නව කුඩා ඇම්ෆිබියස් එක්ස්කැවේටර යන්ත්‍රය



**ශ්‍රීලඉගොහාසසං** වේ පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශයෙහි වැඩපොළ සතුව බර යකඩ පිරිසැකසුම් සහ යන්ත්‍රසූත්‍ර කාර්යයන් සිදු කිරීමේ පහසුකම් පවතී. මෙය අපගේ වැඩපොළ පරිශ්‍රයේදී පිරිසකසන ලද දියත උයනෙහි ඇති පාවෙන අඩි පාලමකි.



හම්බන්තොට මත්තල ගුවන් තොටුපල පරිශ්‍රයේ සකසන ලද පොකුණු

## ඉඩම් සහ අළෙවි අංශය

කොළඹ සහ සහ අවට ප්‍රදේශ ගංවතුරින් තොර වඩාත් දැකුම්කළු පරිසරයක් ලෙස සංවර්ධනය කිරීමේ රජයේ උත්සාහයට සහාය දැක්වීමක් වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරිමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙත  වගකීම් රාශියක් පවරා ඇත. ඉහත කාරණය සාක්ෂාත් කර ගැනීමේදී, සංස්ථාවේ එක් ප්‍රධාන ක්‍රියාකාරී අංශයක් ලෙස ඉඩම් සහ අළෙවි අංශය අපගේ ස්වයං ව්‍යාපෘති සඳහා සහ භාණ්ඩාගාරය හෝ වෙනත් අරමුදල් සපයන ආයතන විසින් අරමුදල් ලබා දෙන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමෙන්, දිවයිනෙහි තෙත් බිම් ප්‍රකාශයට පත් කිරීමෙන් සහ අළෙවියෙන් සහ කල්බදු වලින් ආදායම් උත්පාදනය කිරීමෙන් සහාය දක්වනු ලැබේ.

**ස්වයං ව්‍යාපෘති සහ වේරැස් ගංගා ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම :**

මුදුන් ඇළ, කැළණිය සහ රාගම ප්‍රදේශ වල ස්වයං සංවර්ධන වභාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට අමතරව ඉඩම් සහ අළෙවි අංශය පාර්ලිමේන්තු ඉහළ රුඳවුම් ප්‍රදේශය, මාදිවෙල දකුණ සහ වේරැස් ගංගා වැසි ජල අපවහන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාල අත්පත්කර ගැනීම් ඇතුලත් වන මහ කොළඹ ගංවතුර පාලන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ අත්පත් කර ගැනීමේ කාර්යයන් සම්බන්ධයෙන්ද කටයුතු කරනු ලැබේ. අභිනවයෙන් සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 5 ක් එනම් ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ, කැස්බෑව, රත්මලාන, මහරගම සහ දෙහිවල - ගල්කිස්ස ආවරණය කිරිමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතිය යටතේ, ආසන්න වශයෙන් ඉඩම් හෙක්ටයාර 372 ක් අත්පත් කර ගනිමින් පවතී. මේ වන විට බොහොමයක් ඉඩම් සඳහා ඉඩම් අත්පත් කර ගැනීම යටතේ වන ඡේද. 38 (අ) ප්‍රසිද්ධියට පත් කර ඇත.

**තෙත් බිම් ප්‍රකාශයට පත් කිරීම** :

සංශෝධිත පනතෙහි ඡේද අංක 2 (ආ) සහ 4 අ (1) යටතේ සිදු කරන ලද ප්‍රකාශයට පත්කිරීම් වලට අනුව, ඉඩම් සහ අළෙවි අංශය දිවයිනෙහි තෙත්බිම් සහ ඇළ මාර්ග රක්ෂිත ප්‍රකාශයට පත් කිරීමේ යෙදී සිටී. මධ්‍යම පළාත සඳහා ප්‍රසිද්ධියට පත් කරන ලද ප්‍රකාශයට පත්කිරීමේ නිවේදනයක් පහත දක්වා ඇත.



2A PART I : SEC. (I) - GAZETTE EXTRAORDINARY OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA - 08.05.2013

SRI LANKA LAND RECLAMATION AND DEVELOPMENT CORPORATION ACT, No. 15 OF 1968 AS AMENDED BY SRI LANKA LAND RECLAMATION AND DEVELOPMENT CORPORATION (AMENDED) ACT, No. 35 OF 2006 ACT, No. 52 OF 1982 AND ACT, No. 27 OF 1976

Order under Section 2(b) 1

BY virtue of the powers vested on me in terms of Section 2(b) 1 of the Sri Lanka Land Reclamation and Development Corporation Act, No. 15 of 1968 as amended by Sri Lanka Land Reclamation and Development Corporation (Amended) Act, No. 35 of 2006 and Act, No. 52 of 1982 and Act, No. 27 of 1976, I, Mahinda Rajapaksa, Minister of Defence and Urban Development through this Order determined and declare, with the concurrence of the subject Minister of Land that, areas described in schedule Ka$_1$, Ka$_3$ - Ka$_8$ and Ka$_{13}$ - Ka$_{18}$ situated in Kandy District of the Central Province to be an area of low Lands, Marshes, Barren or Muddy Lands for the purpose of this Act. Below mentioned terms and conditions prescribed by the Sri Lanka Land Reclamation and Development Corporation have to be adhered to in carrying out any activity in this area.

MAHINDA RAJAPAKSA,
Minister of Defence and Urban Development.

Ministry of Defence and Urban Development.
No. 15/5,
Baladaksha Mawatha,
Colombo 03,
24th April, 2013.

Kandy District

| *Code Number* | *Description* |
|---|---|
| KA2 | This has not been declared as relevant lands are not available in the area for declaration |
| KA9 | do. |
| KA10 | do. |
| KA11 | do. |
| KA12 | do. |

**Terms and Conditions**

1. The written approval of the Sri Lanka Land Reclamation and Development Corporation shall be obtained for filling or developing a portion of land located within any of these declared areas through a request made, using an application issued by the Corporation for that purpose.

2. The approval would be granted in terms of the Terms and Conditions recommended by the Planning Committee comprising the Officers of the Urban Development Authority, Central Environment, Authority, Department of Agrarian Services and following Officers of the Sri Lanka Land Reclamation and Development Corporation ; Chief Executive Officer/ General Manager, Additional General Manager, Deputy General Manager (Special Projects), Deputy General Manager (Land/ Marketing), Deputy General Manager (Research and Designs), Deputy General Manager (Drainage and Reclamation) and Chief Legal Officer. (An Officer of the respective Local Authority, of which the land located, will be called where necessary.)

3. Accordingly in case where such approval is granted under any terms and conditions made by the Sri Lanka Land Reclamation and Development Corporation the Sri Lanka Land Reclamation and Development Corporation, every individual who defalut to adhere such terms and conditions could be convicted guilty under the provisions of this Corporation Act.

4. In case where the land proposed for development is a paddy land, the approval to be sought in terms of the formal plans and recommendations issued by the Sri Lanka Land Reclamation and Development Corporation on the request of the Commissioner of Agrarian Services.

බස්නාහිර, දකුණ සහ මධ්‍යම පළාත්වල තෙත්බිම් ප්‍රකාශයට පත් කිරීම මේ වන විට සම්පූර්ණ කර ඇත. වයඹ පළාතේ සහ සබරගමුව පළාත් වල ප්‍රකාශයට පත් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. මේ සඳහා සංස්ථාවට අදාල දිස්ත්‍රික්ක වල පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආදියෙන් අනුමැතිය ලබා ගත යුතු වන අතර එම අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම තෙත්බිම් ගැසට් කිරීමට බලපෑම් එල්ල කර ඇත. සංස්ථාව විසින් මෙම ප්‍රකාශයට පත් කිරීම් සිදු කලද ශ්‍රීලඉගොහාසසං ට පමණක් මෙය සිදු කල නොහැකි අතර මෙවැනි අනවසර සංවර්ධනය කිරීම් අවම කිරීම සඳහා සහ පරිසරය සංරක්ෂණය කිරීම සඳහා සියළු පළාත් / ප්‍රදේශීය අධිකාරී වල සහයෝගය ලැබිය යුතු වේ.

**ඉඩම් විකිණීම් සහ කල්බදු :**

මෙම අංශයෙහි තවත් කාර්යයක් වන්නේ ඉඩම් විකිණීම සහ කල්බදු දීම තුලින් ආදායම් ඉපයීම වේ. අවහිරතාවලින් තොර ඉඩම් වර්තමානයේ ඉතා සීමාසහිත වී ඇත. විවිධ හේතුන් වල බලපෑමෙන් ඉඩම් සංවර්ධනය කිරීමේ කාර්යයන්ද සීමාසහිත වී ඇත. එබැවින් බැහැර දීමේ ඉඩම් තොගය අවම වී ඇත. බොහොමයක් සීමාවන් නොසළකමින්, ඉඩම් සහ අළෙවි අංශය ඉඩම් අළෙවියෙන් සහ කල්බදු දිම තුලින් ආසන්න වශයෙන් රු.මි.180 ක අරමුදල් රැස් කර ගැනීමට සමත් වී ඇත.




මහ කොළඹ ගංවතුර පාලන සහ පාරිසරික වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල රැඳවුම් අවශ්‍යතාවයන් සඳහා ආසන්න වශයෙන් අක්කර 1000 ක වගුරු බිම් ප්‍රදේශයක් සංස්ථාව විසින් නඩත්තු කරනු ලැබේ. නීති සහ ආරක්ෂක වැනි වෙනත් අංශවල සහාය ඇතිව මෙම ඉඩම්, ඉඩම් සහ අළෙවි අංශය විසින් කළමනාකරණය කරනු ලැබේ. අනවසර සංවර්ධනය කිරීම් වැළැක්වීම සඳහා නැවත පදිංචි කල පවුල් සඳහා ඔප්පු ලබා දීම, නීතිමය කාරණා, විමර්ෂණ වෙනුවෙන් පෙනී සිටීම වැනි කටයුතු නිරන්තරයෙන් සිදු කල යුතු වේ. බොහොමයක් අමතර කාර්යයන් පැවරුනද මෙම සියළු වැඩ කටයුතු ඉතා සීමිත කාර්ය මණ්ඩලයකින් සහ අවම පිරිවැයකින් ඉටු කිරීමට සමත් වී ඇති අතර සංස්ථාවේ සමස්ථ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉඩම් සහ අළෙවි අංශය තවදුරටත් කැප වී සිටී.

## මානව සම්පත් සංවර්ධනය

2013 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන අංශය විසින් යොදා ගන්නා ලද සංකල්පීය ආකෘතිය සංක්ෂිප්තව පහත විස්තර කර ඇත.

### පුහුණු සහ සංවර්ධනය

පුහුණුව යනු සංස්ථාවේ මානව සම්පත වැඩිදියුණු වූ ඒකාබද්ධ කාර්ය සාධනයක් ප්‍රතිඵල වශයෙන් ලබාදෙන උපදෙස් සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් දැනුම අත්පත් කර ගන්නා සහ කුසලතා සංවර්ධනය කර ගන්නා ක්‍රමානුකූල ක්‍රියාවලියකි.

පුහුණුව කෙටිකාලීන, සේවකයින් සඳහා ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාලව ආකල්පමය වෙනසක්, විශේෂිත ක්ෂේත්‍රයක කුසලතා සහ දැනුමක් සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය දිශානත සහ ඉලක්කගත වූවකි.සංස්ථාවේ සියළු අංශයන්හි සේවකයින් දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් වලින් පුහුණුව සහ අධ්‍යාපනය ලබා ගැනීම සඳහා තෝරා ගනු ලැබේ. මෙය සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වන ජීවිත කාලීන සහ දීර්ඝ කාලීන ආයෝජනයකි.

### පුහුණු සහ සංවර්ධන සාරාංශය

**පුහුණු වැඩසටහන් සඳහා වාර්ෂික ප්‍රතිපාදනය**




**සේවකයින් ඔවුන්ගේ වර්තමාන කාර්ය පරිසරයෙහි වැඩි දියුණුවට පත් කිරීම සඳහා සහ ඔවුන්ගේ නිපුණත්වය සහ ආයතනික කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වන දැනුම සහ කුසලතා නොකඩවා ලබා දීම සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කර ඇත. 2013 වර්ෂය සඳහා එක් එක් අංශයට වෙන් කරන ලද මුදල පහත පරිදි වේ.**




සේවක ගුණාත්මකභාවය සහ අභිප්‍රේරණය ඉහළ නැංවීම තුලින් සංස්ථාවේ ඵලදායීතාවය වැඩිදියුණු කිරිම සහ අනාගත අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම පුහුණුව සහ සංවර්ධනයෙහි අභිමතාර්ථය වේ.

## විදේශ පුහුණුවීම්

2013 වර්ෂයේදී විදේශ පුහුණුවීම් සඳහා දරන ලද සත්‍ය වියදම පහත පරිදි වේ;

| අනු. අං. | වැඩසටහන | රට | පැවති කාලය 2013 වර්ෂය | සහභාගීවුවන් ගණන | වෙන් කල ප්‍රතිපාදන ඇ.ඩො. |
|---|---|---|---|---|---|
| 01. | අපජල කළමනාකරණය පිළිබඳ පුහුණුව | පිලිපීනය | ජන 28 - පෙබ 01 | 01 | 150 |
| 02. | පාරිසරික ආරක්ෂාව සහ කළමනාකරණය පිළිබඳ පුහුණුව | දෝහා කටාර් | මාර්තු 26 - මාර්තු 30 | 01 | 2227 |
| 03. | නාගරික සංවර්ධන කළමනාකරණ දැනුම හුවමාරු කරගැනීමේ අධ්‍යයනය | දකුණු කොරියාව | අප්‍රේල් 28 - මැයි 05 | 05 | 5320 |
| 04. | ජල කළමනාකරණයේ උපායමාර්ගික භාවිතයන් | සිංගප්පූරුව | මැයි 27 - මැයි 31 | 01 | 1087 |
| 05. | ගංවතුර අවදානම් කළමනාකරණය | ද. කොරියාව | මැයි 27 - මැයි 30 | 01 | 9000 |
| 06. | යන්ත්‍රසූත්‍ර පිළිබඳ පුහුණුව | ද. කොරියාව | සැප්.08 - සැප්.14 | 09 | 9552 |
| 07. | UNESCO,පෝලන්ත සම-අනුග්‍රහයෙන් ලබා දෙන ශිෂ්‍යත්ව | පෝලන්තය | 2013 ඔක්. 01 - 2014 මාර්තු | 01 | 900 |
| 08. | පෝලන්ත වීසා ලබාගැනීම, ඉන්දියානු සංචාරය | ඉන්දියාව | සැප්.13 - සැප්.16 | 01 | රු. 80,000/- ඇ.ඩො. 616 |
| 09. | ගංවතුර ව්‍යසන අවම කිරීම | ජපානය | 2013 ඔක්. 01 - 2014 සැප්. | 01 | 900 |
| 10. | යන්ත්‍රසූත්‍ර පිළිබඳ පුහුණුව | මැලේසියාව | නොවැ.19 - නොවැ.23 | 08 | 4000 |
| **එකතුව** | | | | | **33,752** |

***දකුණු කොරියාවේ පැවති යන්ත්‍රසූත්‍ර පිළිබඳ පුහුණුවේ දර්ශන***










**2012/2013 වර්ෂය සඳහා ජපානයේ පැවති ගංවතුර ව්‍යසන අවම කිරීමේ එක් අවුරුදු වැඩසටහනෙහි දර්ශන**








## බඳවාගැනීම සහ තෝරාගැනීම

2013 නොවැම්බර් මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නව බඳවාගැනීමේ පටිපාටියට අනුමැතිය ලබා දී ඇත.සංස්ථාවේ සේවා අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 හි පූර්ව අනුමැතියන්ට අනුව අනුමත කාර්ය මණ්ඩලයේ විවිධ තනතුරු සඳහා බඳවාගැනීම් සිදු කර ඇත.

ඒ අනුව 2013 වර්ෂයේදී පහත තනතුරු සඳහා බඳවාගැනීම් සිදු කර ඇත.




## විනය කළමනාකරණය

සංස්ථාවේ විනය විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද "විනය කාර්ය පටිපාටිය" 2013 ජුනි මස 21 වැනි දින සිට ක්‍රියාවට නංවා ඇත.

ඒ අනුව, විනය කඩ කිරීම පිළිබඳව වාර්තාවීමත් සමගම පවත්වන ලද මූලික පරීක්ෂණ වලට පසුව හෙළිදරව් වූ කරුණු මත පදනම්ව සේවකයින් 16 දෙනෙකුට එරෙහිව චෝදනා පත්‍ර නිකුත් කර ඇත. විනය පරීක්ෂණ වලින් පසුව, සේවකයින් 05 දෙනෙකු සේවයෙන් පහ කරන ලද අතර දැඩි දඬුවම් සමඟින් සේවකයින් 04 දෙනෙකු නැවත සේවයේ පිහිටුවීමට පියවර ගෙන ඇත.

## කාර්ය සාධන කළමනාකරණය

මානව සම්පත් කළමනාකරණයෙහි පැනනඟින ගැටළු නිරාකරණය කර ගැනීමට හැකිවන නීති සහ රෙගුලාසි වලින් සමන්විත වන "පරිපාලන පටිපාටිය" සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

## ශ්‍රම බලකාය

2013 දෙසැම්බර් මස 31 වැනි දිනට ස්ථිර සේවකයින් 1213 ක් සහ කොන්ත්‍රාත් පදනම් යටතේ සිටින සේවකයින් 102 ක්ද ඇතුලත්ව සංස්ථාවේ ශ්‍රම බලකාය සේවකයින් 1315 කින් සමන්විත වේ.

## සැපයුම් අංශය

ශ්‍රීලඉගොසසං වේ සැපයුම් අංශය 2013 වර්ෂයේ සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපරිමිත දායකත්වයක් ලබා දී ඇත. භාණ්ඩ හා සේවවාන් ප්‍රශස්ත මිලකට නියමිත වේලාවට ප්‍රසම්පාදන කිරීම බොහොමයක් ව්‍යාපෘති නියමිත වේලාවට සම්පූර්ණ කිරීම උදෙසා දායකත්වය ලබා දී ඇත.ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා පහත සඳහන් වැඩිදියුණු කිරීම් සිදු කර ඇත.

- ප්‍රසම්පාදන දත්ත සමුදායක් (data base) ස්ථාපිත කිරීම එවැනි එක් ක්‍රියාවක් වන අතර එය සියළු අංශ වලින් සිදු කරන ලද එක් එක් මිලදීගැනීමේ ඉල්ලීම් පිළිබඳ විස්තීර්ණ විස්තර වලින් සමන්විත වේ. මිලදී ගැනීමට ගතවන කාලය අඩු කිරීමට සහ ඵලදායීතාවය ඉහළ නැංවීමට දත්ත සමුදාය දායකත්වය ලබා දී ඇත.
- සංස්ථාවේ අනෙකුත් අංශයන් සමඟ විධිමත් සන්නිවේදන මාර්ගයන් ගොඩ නංවා ගන්නා ලද අතර ක්‍රියාවලිය නවකරණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් මධ්‍යම ගබඩාව, වැඩපොළ, ප්‍රවාහන අංශය සහ සැපයුම් අංශයට අදාල ක්‍රියාවලීන් සමකාලික කරන ලදී. ක්‍රියාවලි ඒකාබද්ධ කිරීම සහ පවතින අවහිරතාවයන් මඟහරවා ගැනීම සඳහා අංශ අතර ප්‍රගති සමාලෝචන රැස්වීම් වැදගත් වන ලදී.
- හඳුනාගන්නා ලද ව්‍යාපෘති වල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම සඳහා සැපයුම් අංශයෙහි නියෝජිතයෙකු පත් කරන ලදී.
- මිලදී ගැනීමට ගතවන අනවශ්‍ය කාලය සහ අනෙකුත් බඩුභාණ්ඩ සම්බන්ධිත පිරිවැය අවම කිරීම සඳහා FMCG වැනි නිරන්තරයෙන් මිලදී ගන්නා අයිතම සඳහා "මිළ ගණන් අනුමැතීන්" හඳුන්වාදෙන ලදී.

ප්‍රධාන කාර්යයෙන් බැහැරව මෙම අංශය විසින් සංස්ථාවට වටිනාකම් එක්කල සේවවාන් හා ක්‍රියාකාරකම් බොහොයමයක් අන්තර්ගත කර සහ හඳුන්වා දී ඇත.

- ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන මාර්ගෝපදේශ හා අනුගත වෙමින් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කරගැනීම සඳහා ශ්‍රීලඉගොසසං පරිපාලිත සමාගම් සමඟ සැපයුම් අංශයේ විශේෂඥ දැනුම හුවමාරු කරගන්නා ලදී.
- මෙම කාලය තුල ශ්‍රී ලංකාවේ පවත්වන ලද අග්‍රගණ්‍ය ක්‍රියාකාරකම් වලින් එකක් වන CHOGM 13'ප්‍රදර්ශනයෙහි ප්‍රදර්ශන කුටියක් නියෝජනය කිරිම සඳහා මෙම අංශයේ සාමාජිකයින් 03 දෙනෙකු තෝරා ගන්නා ලදී.

- මෙම අංශයෙහි සාමාජිකයින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සංවර්ධන කාර්යාංශය නියෝජනය කරන අතර එහිදී ඔවුන් ශ්‍රීලඉගොසසං වේ ක්‍රියාවලින් සිරස් අනුකලනය කිරීම සඳහා ප්‍රශස්ත විසඳුමක් ලෙස “කිරිමණ්ඩල මාවත ඉන්ධන පිරවුම් හලක්” පිහිටුවීමේ ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරීව නියැලිණි.

# නීති අංශය

1968 අංක 15 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (ශ්‍රීලඉගොසසං) පනත හා එහි සංශෝධනයන් මගින් පවරා ඇති බලතල ප්‍රකාරව නීති අංශය ක්‍රියාත්මක වේ.

**නීතිමය කාර්යයන්:**

1. ඉඩම් අත්පත් කර ගැනීම්, සංවර්ධනය කිරීම්, පදිංචි කිරීම් හා සිය කැමැත්තෙන් නොවන නැවත පදිංචි කිරීම් සඳහා.

2. මහජන උපයෝගීතා (විශේෂයෙන් ජල පහසුකම්, සනීපාරක්ෂක සහ නගර යටිතල පහසුකම්).

3. ඉඩම් සංවර්ධන කටයුතු සඳහා අදාළ නීති කෙටුම්පත් ලියවිලි සකස් කිරීම, නැවත පදිංචි කිරීම, ප්‍රජා උපදේශන හා අඩු ආදායම්ලාභී පවුල් පදිංචි ප්‍රදේශවල ජනතාව සඳහා නීතිමය ආධාර සැපයීම.

4. සංස්ථාව මගින් හා සංස්ථාවට විරුද්ධ නඩු හබ ආදියේදී අධිකරණයේදී සංස්ථාව වෙනුවෙන් පෙනී සිටීම හා ආරක්ෂා කිරීම.

5. සංස්ථාවේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් වූ සියලු කාරණා සම්බන්ධයෙන් උපදෙස් සැපයීම.

6. සියලු ආකාරයේ අනවසර ගොඩ කිරීම්වලට එරෙහිව, ජල අපවහන සැලසුම්වල සඳහන් කොන්දේසි කඩ කරන්නන්ට එරෙහිව, ඇළ මාර්ග රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන් සහ 2006 අංක 35 දරණ ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා පනත හා එහි සංශෝධනයන් මගින් ප්‍රකාශිත ප්‍රදේශයන්හි පිහිටි ඇළ මාර්ග දූෂණය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා සංස්ථාව බලාත්මක වී ඇත.

7. සියලු අවබෝධතා ගිවිසුම් සැකසීම හා සහතික කිරීම, අළෙවි ගිවිසුම්, කොන්ත්‍රාත්/ උපදේශන ගිවිසුම්, දිගු කාලීන බදු දීම්, වාර්ෂික බදු දීම්, කෙටි කාලීන බදු දීම්, ඔප්පු පවරා දීම්, අදාළ නීතිමය ලියකියවිලි, විදේශ රැකියා පොරොන්දු පත්‍ර (වැටුප් සහිත/ රහිත), මෝටර් රථ ණය ගිවිසුම්, ඇටෝර්නි බලපත්‍ර සහ ඉඩම් නිරවුල් සහතික පත් සඳහා ඉඩම් හිමිකම් වාර්තාවන්හි අයිතිය.

8. සංශෝධන සහිත වර්තමාන පනත ප්‍රමාණවත් නොමැති බව පෙනී ගොස් ඇති බැවින් වර්තමාන පනත නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත සංශෝධනය කිරීම අවශ්‍යයෙන් කළ යුතුව ඇත. කෙටුම්පත් කල නව පනත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත

# අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

2013 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වාර්තාව හා සංස්ථාවේ ගිණුම් සතුටින් ඉදිරිපත් කරයි.

**මූලික කාර්යයන්**

සංස්ථාවේ මූලික කාර්යයන් මෙහෙයුම් සමාලෝචනයේ (පිටු අංක 6 සිට 66) සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි (69 වන පිටුව) විස්තර කර ඇත.

**වර්ෂය පිළිබඳ මෙහෙයුම් සමාලෝචනය**

වර්ෂය තුළ සංස්ථාවේ කටයුතු සම්බන්ධයෙන් සවිස්තරාත්මක සමාලෝචනයක් මේ යටතේ දක්වා ඇත.

**පිරිවැටුම**

2012 වර්ෂයේ පිරිවැටුම වූ රුපියල් මිලියන 2,174 ට සාපේක්ෂව 2013 වර්ෂයේ පිරිවැටුම රුපියල් මිලියන 1,478 කි. මෙය ප්‍රධාන වශයෙන් මුහුදු වැලි විකිණීම පහත වැටීම සහ ඉදිකිරීම් ව්‍යාපෘති වලින් ලැබූ ආදායම පහළ යෑම හේතුවෙන් සිදු වී ඇත.මේ අතර භාණ්ඩාගාර අරමුදල් ලැබූ ගංවතුර වැළැක්වීමේ ව්‍යාපෘති සඳහා අපගේ කාර්යමණ්ඩලය ශක්තිය සහ සියළු සම්පත් පූර්ණ වශයෙන් යොදවා ඇත.

**ලාභය**

සංස්ථාවේ 2012 වර්ෂයේ ලාභය වන රුපියල් මිලියන 32 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී සංස්ථාවේ බදු හා අයකිරීම්වලට පෙර ලාභය රුපියල් මිලියන 118 කි. පසුගිය වර්ෂයේදී බදු හා අයකිරීම්වලට පසු අලාභය වන රුපියල් මිලියන 68 හා සැසඳීමේදී 2013 වර්ෂයේ බදු පසු ලාභය රුපියල් මිලියන 104 කි.

**කටයුතුවල තත්ත්වය**

සංස්ථාවේ කටයුතුවල තත්ත්වය මූල්‍ය තත්ත්ව වාර්තාවේ පෙන්නුම් කර ඇති පරිදි වේ.

**දේපළ, පිරියත හා උපකරණ**

වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ පිළබඳ සිදු වූ සංසරණය ගිණුම් හා සම්බන්ධ සටහන් 9 හි දක්වා ඇත.

## බදු ගෙවීම

**ආදායම් බදු**

2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත සහ එහි සංශෝධන ප්‍රකාර බදු ගෙවීම් සඳහා කරන ගැළපුම් අනුව වර්ෂයේ ලාභය පදනම් කර ගෙන ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසනු ලැබේ.

**විලම්භිත බදු**

බැරකම් ක්‍රමය මත විලම්භිත බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර විලම්භිත බදුකරණ ගිණුමේ ශේෂය මඟින්;

i) ක්ෂය දීමනා අයකරගනු ලබන වත්කම්වල බදුකරණ අභිමතාර්ථය සඳහා ලියාහල අගය සහ එවැනි වත්කම්වල ශුද්ධ පොත් අගයෙහි වෙනස සඳහා අදාල කරගත හැකි ආදායම් බදු

ii) විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් මඟින් පැනනඟින කාල වෙනස සඳහා අදාල කරගත හැකි ආදායම් බදුනියෝජනය වේ.

## අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව (ඉදිරියට..)

**කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ බැඳියාව**

මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 19 හි අනාවරණය කර ඇති පරිදි හැර සංස්ථාවේ පවතින හෝ යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට ඍජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

**අඛණ්ඩ පැවැත්ම**

අඛණ්ඩ පැවැත්මක් ලෙසින් ඉදිරියටත් පැවතීමේ හැකියාව සංස්ථාව සතු වන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සිය විශ්වාසය පළ කර සිටී.

**ව්‍යවස්ථාපිත ගෙවීම්**

ඔවුන්ගේ දැනුවත් වීම සහ විශ්වාසය අනුව රජය සහ සේවකයින් සම්බන්ධයෙන් සිදු කළ සියළු විමධ්‍යගත ගෙවීම් නියමිත කලට වේලාවට සිදු කළ බවට අධ්‍යක්ෂවරුන් සෑහීමට පත් වේ.

**සේවක මණ්ඩලය**

2013 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට පුද්ගලයින් 1,315 දෙනෙකු සංස්ථාවේ සේවයේ නියුතුව ඇත.

**ශේෂ පත්‍රයේ දිනයට පසු සිදුවීම්**

ශේෂ පත්‍රයේ දිනට පසු සිදු වී ඇති වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන අවශ්‍ය අවස්ථාවලදී ගිණුම්වල ගැළපීම් සිදු කර ඇත.

**අති විශේෂිත අයිතමයන්**

වෙනම වාර්තා කළ යුතු අසාමාන්‍ය/ අති විශේෂිත ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ සටහන් මගින් වාර්තා කර ඇත.

**විගණකවරු**

2013 වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කරනු ලබනවා ඇත.

**මණ්ඩලයේ අණ පරිදි**

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව වෙනුවට

ලේකම්

26.02.2014

මගේ අංකය / எனது இல. / My No. ඩීඊ-2/ඊ/එස්එල්එල්ආර්ඩීසී/1/13/24 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2015 පෙබරවාරි 16 දින

සභාපති

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

**ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ එහි පරිපාලිතෙයහි සමාගමේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ එහි පරිපාලිතයෙහි 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා ( සංශෝධිත) පනත මඟින් සංශෝධිත 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩල පනතේ 17(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනය එම පරිපාලිත සමාගමේ සාමාජිකයින් විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් සිදුකරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සංස්ථාවේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

-------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---------------

2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය

------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

තත්ත්වාගණනය කළ මතය- සංස්ථාව

-----------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------

2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන

-------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන, සංස්ථාවේ පරිපාලිතය වූ සීමාසහිත ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (පුද්ගලික) සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර තිබුණි. පරිපාලිත සමාගම සම්බන්ධයෙන් සංස්ථාවේ හිමිකාරිත්වය පරිපාලිත සමාගමේ නිකුත් කරන ලද කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 80 ක් නියෝජනය විය.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලංගිප්‍ර)

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------------------------------------

(i) සමහර වියදම් විෂයයන්, අදාළ වියදම් සමඟ ඍජුවම සම්බන්ධ නොවූ ආදායම් හා අනෙකුත් මූලාශ්‍ර වලට එරෙහිව හිලව් කර විස්තීරණ ආදායම් ප්‍රකාශනයෙහි අනුචිත ලෙස පෙන්වා තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. මේ ආකාරයට රු.1,232,948 ක් වූ මෝටර් වාහන අළුත් වැඩියා හා නඩත්තු වියදම් සහ රු.25,239,000 ක් වූ විකුණුම් වියදම්, රක්ෂණ වන්දි ලැබීම් සහ බොල් සහ අඩමාන ණය ප්‍රතිපාදනවලට එරෙහිව පිළිවෙලින් හිලව් කර තිබුණි.

(ii) සංස්ථාවේ රු.85,872,486 ක් වටිනා ස්ථාවර තැන්පතු, සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව විසින් විවෘත කර තිබුණු ණයවර ලිපි සම්බන්ධ ආරක්ෂිත ඇප වශයෙන් තබා තිබුණු අතර එය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 02 - තොග

-------------------------------------

විගණනය වෙත ලැබී තිබුණු තොරතුරු අනුව, ඉදිකිරීම් කේෂ්ත්‍රයේ පැවති පහළ මට්ටමේ ඉල්ලුම හේතුවෙන් ඉකුත් වර්ෂ කිහිපයක් තුළ මුහුදු වැලි අලෙවිය අඛණ්ඩව පහළ ගොස් තිබුණි. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා තිබුණු රු.1,975,225,000 ක් වූ මුහුදු වැලි කියුබික් මීටර් 2,431,922 ක ශුද්ධ උපලබ්ධි වටිනාකම එම තොගයේ පිරිවැයට වඩා බෙහෙවින් පහළ මට්ටමක් විය හැක. කෙසේ වෙතත් මෙම තොගයේ තථ්‍ය ශුද්ධ උපලබ්ධි අගය නිගමනය කර ඒ අනුව ගිණුම් වලට ගැනීමට සංස්ථාව විසින් පියවර ගෙන නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ දෝෂ**

---

සේවාදායක කොන්ත්‍රාත් මත පමණක් නොව රජයේ අරමුදල් සපයන කොන්ත්‍රාත් මත පොදු කාර්ය වියදම් අයකිරීම සඳහා වූ පොදු කාර්ය පිරිවැය සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්තිය , සංස්ථාව විසින් වෙනස් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඒ මත රු.200,396,000 ක ආදායමක් උපයා තිබුණු නමුත් මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රතිඵලයට වූ බලපෑම මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 - දේපල පිරියත හා උපකරණ**

---

(i) සමාලෝචිත වර්ෂයේ අවසානයට පාවිච්චි කළ හැකි තත්ත්වයේ පැවති පිළිවෙලින් රු.55,569,805 ක් , රු.492,344,796 ක් හා රු.79,802,986 ක් වූ පිරිවැයකට ප්‍රසම්පාදනය කර තිබුණු ගොඩනැඟිලි, යන්ත්‍රෝපකරණ සහ මෝටර් රථ වැනි සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම්වල සත්‍ය ඵලදායී ජීවිත කාලය තීරණය කර ප්‍රත්‍යාගණනය කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්වා තිබුණු දේපල, පිරියත හා උපකරණවල පිරිවැය හා ඒ මත ක්ෂයවීම් සැලකිය යුතු අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) අදාළ ශේෂයන්ගේ ස්වභාවය විශ්ලේෂණය කිරීමකින් තොරව "වැඩ සම්පූර්ණ ව්‍යාපෘති " වශයෙන් රු.815,419,000 ක ශේෂයක මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ අඛණ්ඩව පෙන්වා තිබුණි. ඒ අනුව එම ශේෂවලින් නියෝජනය වූ වත්කම්වල වටිනාකම සහ ඒ මත ක්ෂයවීම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 - ආදායම්**

---

ඉදිරි වර්ෂ 28 කට වැඩි කාල සීමාවකදී සුදු නෙළුම්පුර නිවාස යෝජනා ක්‍රමයේ කුලී නිවැසියන්ගෙන් අයකර ගත යුතුව පවතින රු.47,836,982 ක් වූ කුලී ආදායම සහ ඉහත නිවාස යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් ඉදිරි වර්ෂ 30 ක කාල සීමාවකදී පරිපාලිත සමාගමෙන් අයකර ගත යුතුව පවතින රු.17,508,851 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 21 - විදේශ විනිමය අනුපාත වෙනස්වීම් වල බලපෑම

මුහුදු වැලි හැරීමේ ව්‍යාපෘතිය පවරා තිබූ සිටි කොන්ත්‍රාත්කරුවෙකු වෙත 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව පැවති රු.84,768,000 කට සමාන යුරෝ 575,000 ක මුදල, 2013 දෙසැම්බර් 31 දින සාවද්‍ය ලෙස විදේශ මුදල් පරිවර්තනය කිරීම හේතුවෙන් රු.18,992,015 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රු.287,353,000 පිරිවැයකට අත් කර ගෙන තිබුණු ඉඩමක්, එහි ප්‍රාග්ධන ස්වරූපය සැලකිල්ලට නොගෙන ඉන්වෙන්ට්‍රි විෂයයක් වශයෙන් ජංගම වත්කම් යටතේ පෙන්වා තිබුණි.

(ආ) පරිචයක් වශයෙන් , සංස්ථාව තොග සමීක්ෂණයක් මගින් වර්ෂය අවසානයට වූ අතැති තොගයේ වටිනාකම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රසම්පාදනය කර තිබුණු රු.8,133,000 ක් වූ තොග සහ වෙනත් පාරිභෝගික භාණ්ඩ විෂයයන් වල මුළු පිරිවැය සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියා හැර තිබුණි. මෙවැනි තොග විෂයයන්ගේ පිරිවැය සංස්ථාවේ ආදායමට එරෙහිව ලියාහැර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට පිරිවැය රු.1,170,572 වූ තොග හා පාරිභෝගික භාණ්ඩ විෂයයන් සංස්ථාවේ ගබඩා තුළ පැවති බව නිරීක්ෂණය විය.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාල විශ්ලේෂණය අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.431,950,843 ක් වූ මුළු ණය ගැති ශේෂය තුළ රු.29,815,591 ක් වූ වර්ෂ 2 සිට 5 කට වැඩි කාලයක් හිඟව පවතින ණය ගැති ශේෂද ඇතුළත්ව තිබුණි. තවද වර්ෂ 5 කට වැඩි කාලයක් හිඟව පවතින රු.15,208,384 ක් වූ ණය ගැති ශේෂද ඊට ඇතුළත් විය.

(ආ) ඉඩම විකිණීම් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන්ගෙන් සංස්ථාව වෙත 2013 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු විකුණුම් අත්තිකාරම් එකතුව වූ රු.517,471,282 ක් අතුරින් රු.489,683,191 ක් වූ අත්තිකාරම් වර්ෂ 05 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි. තවද, එකතුව රු.1,035,242 ක් වූ වෙනත් අත්තිකාරම් වර්ෂ 1 සිට 5 කට වැඩි කාලයක් තුළ නිරවුල් කර නොතිබුණි. සම්බන්ධිත පාර්ශ්වයක් වෙත ගෙවිය යුතු රු.3,000,000 ක මුදලක් 2012 වර්ෂයේ සිට නිරවුල් කර නොතිබුණි.

(ඇ) ඉඩම් විකිණීම මත ගෙවිය යුතු රු.44,538,761 ක් වූ පුරස්කා සඳහා වෙන්කිරීම් , මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමෙන් තොරව 1999 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල පැවතුණි.

(ඈ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් මත පෞද්ගලික සමාගමකින් ලැබී තිබුණු රු.50,000,000 ක් වූ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වර්ෂ 04 කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(ඉ) වර්ෂ 04 කට වැඩි කාලයක් හිඟව පැවති රු.1,912,544 ක් වූ හර ශේෂයක් ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පිළිබඳ ණය හිමි ශේෂ වලට එරෙහිව හිලව් කර තිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

විදේශ පුහුණුව සඳහා ලබාගත් රු.3,259,714 ක් වූ අත්තිකාරම් මුදලක් සම්බන්ධයෙන් විදේශ ගමන් බලපත්‍ර ( අදාළ පිටුවල සහතික කළ පිටපත් ), බිල්පත් සහ වෙනත් විස්තර සහ ආපසු ගෙවන ලද මුදල යනාදි සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

### 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ (සංශෝධිත ) පනතේ අංක 2(අ)(4) වගන්තිය | අනවසර ඉඩම් ගොඩකිරීම් සම්බන්ධයෙන් නීතිමය පියවර නොගත් අවස්ථා කිහිපයක් විය. |

(ආ) 1951 අංක 14 දරන මෝටර් රථ ප්‍රවාහන පාලන පනත

(i) 203 අධිකාරයේ 2(i) වගන්තිය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමෙන් තොරව දියත උයන පරිශ්‍රයේ මගී ප්‍රවාහනය සඳහා විදුලි මෝටර් රථ තුනක් පාවිච්චි කර තිබුණි.

(ii) 99 වගන්තිය

අදාළ විදුලි මෝටර් රථ සඳහා තෙවන පාර්ශ්ව රක්ෂණ ආවරණයක් හෝ ලබාගෙන නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

(i) 9.14 ඡේදය

මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු නිරාකරණය කර ගැනීමට මහ පෙන්වීමක් වශයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන යොදා ගැනීමට හැකි නොවන්නේ නම් මානව සම්පත් කළමනාකරණය සඳහා පරිච්ඡේදයක් ඇතුළත් කර පරිපාටි අත්පොතක් සෑම සංස්ථාවක් විසින්ම පිළියෙල කළ යුතුය. කෙසේ වුවද සංස්ථාව ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) 8.3.9 ඡේදය

සංස්ථාව, සේවකයින් 05 දෙනෙකු බාහිර ආයතනයන් වෙත මුදා හැර තිබුණු අතර චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළදී ඔවුන් වෙනුවෙන් රු.2,521,873 ක මුදලක් වැටුප් හා දීමනා වශයෙන් වැය කර තිබුණි. තවද, සංස්ථාවට අයත් වාහනයක් රේගීය අමාත්‍යාංශය වෙත මුදාහැර සමාලෝචිත වර්ෂය තුළදී රු.495,435 ක මුදලක් ධාවන පිරිවැය සඳහා

දරා තිබුණි. අදාල ආයතන වලින් වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.

**(ඈ) 2007 දෙසැම්බර් 05 දිනැති ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ අභ්‍යන්තර චක්‍රලේඛය**

(i) 2.7 ඡේදය

භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම සඳහා අත්තිකාරම් ඉල්ලුම් කරන අවස්ථාවලදී ඒ පිළිබඳ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් එවැනි ඇස්තමේන්තුවක් නොමැතිව අවස්ථා කිහිපයකදී අත්තිකාරම් නිදහස් කර තිබුණි.

(ii) 3.1 ඡේදය

නියමිත කාලය තුළ නිරවුල් කිරීම ප්‍රමාද වන්නේ නම් අත්තිකාරම් මුදල මත සියයට 25 ක දඩ මුදලක් පැනවිය යුතුය. කෙසේ වෙතත් එවැනි අවස්ථාවන් පිළිබඳ රු.1,045,625 ක් වූ දඩ මුදල් පනවා නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ සහ සංස්ථාවේ මෙහෙයුම්වල ප්‍රතිඵලය පිළිවෙලින් රු.140,945,000 ක හා රු.118,295,000 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර එය ඉකුත් වර්ෂයේ ශුද්ධ පාඩුව වූ පිළිවෙලින් රු.15,933,000 ක් හා රු.42,527,000 ක් සමඟ සැසඳීමේදී සමූහයේ හා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.156,878,000 ක හා 160,822,000 ක වැඩිවීමක් පෙන්නුම් කර තිබුණි. මුහුදු වැලි විකිණීම සම්බන්ධයෙන් මිල වැඩිවීම සඳහා වූ ඉල්ලීම මත බාහිර පාර්ශ්වයකින් රු.78,600,000 ක් ලැබීම, භාණ්ඩාගාර අරමුදල්

ව්‍යාපෘති සඳහා පොදු කාර්ය වියදම් අයකර ගැනීම හේතුවෙන් රු.200,396,000 කින් ආදායම වැඩිවීම සහ දියත උයනේ කටයුතුවලින් රු.27,678,000 ක ලාභයක් ඉපැයීම සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වාණිජ කටයුතුවලින් වූ ලාභදායිත්වය

ලැබී තිබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව විසින් සම්බන්ධ වී තිබුණු වාණිජ කටයුතු කිහිපයක් පිළිබඳ මූල්‍ය ප්‍රතිඵල ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| කාර්යය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යයන් වලින් ලාභය / (පාඩුව) | |
|---|---|---|
| | 2013 | 2012 |
| | රු.000 | රු.000 |
| ඉඩම් විකිණීම | 50,457 | 89,270 |
| මුහුදු වැලි විකිණීම | (8,865) | 134,316 |
| ඉදිකිරීම් කොන්ත්‍රාත්තු | 23,757 | 58,395 |
| උපදේශක සේවා | 5,532 | 14,776 |
| ගොඩකිරීම් කටයුතු | 15,505 | 9,043 |
| හාරා ගොඩදැමීම් කටයුතු (Dredging) | 13,475 | 53,649 |
| විවිධ ව්‍යාපෘති | (11,370) | 55,771 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

ඉහත තොරතුරු අනුව, ගොඩකිරීම් කටයුතු වලින් හැර සියළුම කටයුතු වලින් සංස්ථාවේ ලාභය සමාලෝචිත වර්ෂය තුළදී පහත වැටී තිබුණි.

3.3.2 සංස්ථාවේ ස්ථාවරත්වය

---

සංස්ථාවේ අනාගත ස්ථාවරත්වය සම්බන්ධයෙන් පහත විස්තර කරනු ලබන කරුණුවලින් සැලකිය යුතු බලපෑමක් සිදුකර තිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුළදී පිළිවෙලින් රු.64,818,000 ක හා රු.163,288,000 ක අඛණ්ඩ මෙහෙයුම් පාඩුවක් දරා තිබීම.

(ආ) ඉකුත් වර්ෂයේ අවසානයට රු.1,190,044,000 ක් වූ ස්ථාවර හා ඒක්ෂණ තැන්පතුවලින් සමාලෝචිත වර්ෂයේදී රු.564,861,139 ක ස්ථාවර තැන්පතු ආපසු ගැනීම. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ ස්ථාවර හා ඒක්ෂණ තැන්පතුවල වටිනාකම රු.626,604,000 ක් දක්වා පහළ ගොස් තිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 වන විට වගකීම රු.535,231,216 ක් වුවද සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු.793,045,000 ක් වූ අත්පත් කර ගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි මුදල් සහ පාරිතෝෂික ප්‍රතිපාදන ගෙවීම සඳහා වෙනත් ආයෝජන ආපසු ගැනීම.

3.3 නෛතික කටයුතු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) බාහිර පාර්ශ්වයන් විසින් සංස්ථාවට එරෙහිව ගෙන තිබුණු නෛතික කාර්යයන් 37 ක් පිළිබඳ තීරණ අපේක්ෂාවෙන් පැවති බව නිරීක්ෂණය විය. තවද , සංස්ථාව විසින් බාහිර පාර්ශ්වයන්ට එරෙහිව ගන්නා ලද නෛතික කාර්යයන් 38 ක් ද 2013 දෙසැම්බර් 31 දින වන විට නොවිසඳී පැවතුණි.

(ආ) අවස්ථා කිහිපයකදී සංස්ථාවට අයත් වූ ඉඩම් බලෙන් අල්ලාගත් පුද්ගලයන්ට එරෙහිව නිකුත් කරන ලද උසාවි නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

4.1 කාර්ය සාධනය
-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දිවයිනේ අනවසර ඉඩම් ගොඩකිරීමේ පාලනය කිරීමට සහ වලක්වාලීමට 2006 අංක 35 දරන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථා (සංශෝධිත) පනතෙන් සංශෝධනය කරන ලද 1968 අංක 15 දරන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩල පනතේ 2(අ)(1) වගන්තියෙන් සංස්ථාව වෙත බලය පැවරී තිබේ. ඒ අනුව සංස්ථාව විසින් ශ්‍රී ලංකාවේ සියළුම පළාත්වල පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් විශේෂයෙන් හඳුනා ගෙන ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. කෙසේ වෙතත් බස්නාහිර හා දකුණු පළාත්වල එම ඉඩම් හඳුනා ගෙන තිබුණු අතර දිවයිනේ අනෙකුත් ප්‍රදේශවල සංස්ථාවේ එම වගකීම් ඉටුකිරීම සඳහා සංස්ථාව විසින් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ සංස්ථාවේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු.833,600,000 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැයකට ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත්, සැලසුම් කළ පරිදි එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) හම්බන්තොට ප්‍රදේශයේ වෙළඳසැල් ඉදිකිරීම හා මාදිවෙල ප්‍රදේශයේ කාණු පද්ධතිය වැඩිදියුණු කිරීම යන ව්‍යාපෘති දෙකක කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී ආරම්භ කර තිබුණු අතර ඒ සඳහා පිළිවෙලින් රු.11,700,000 ක් හා රු.2,840,000 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් එම ව්‍යාපෘති නිසි හේතුවකින් තොරව පසුව අත්හිටුවා තිබුණි.

(ඈ) මෙම වාර්තාවේ 2.3.1 (ආ) ඡේදයේ සඳහන් කරන ලද පරිදි, ඉකුත් වර්ෂවලදී මුහුදු වැලි සඳහා වූ ඉල්ලුම ක්‍රමයෙන් පහත වැටී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉකුත් වර්ෂයේ දී මුහුදු වැලි විකිණීමෙන් උපයාගත් රු.782,550,000 ක ආදායම සමාලෝචිත වර්ෂය තුළදී රු.77,674,000 ක් දක්වා පහත වැටී තිබුණි. කෙසේ වෙතත් ඉදිකිරීම් කටයුතු සඳහා මුහුදු වැලි යොදා ගැනීම සම්බන්ධයෙන් විශේෂඥ සහතික ලබාගැනීම සඳහා සහ ඉදිකිරීම් සඳහා මුහුදු වැලි යොදා ගැනීම පිළිබඳව ජනතාව අතර පවතින සාවද්‍ය මතයක් බැහැර කිරීම සඳහා මහජනතාවට සන්නිවේදනය කිරීමට සංස්ථාව විසින් කඩිනම් පියවර ගෙන නොතිබුණි.

4.2 මූල්‍ය පාලන

-------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීම සඳහා ලබාදෙන ලද විශේෂ අත්තිකාරම් පිළිබඳ මූල්‍ය පාලනයන් සංස්ථාව විසින් සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. විගණනයේදී නිරීක්ෂණය වූ එවැනි අවස්ථා පහත විස්තර කරනු ලැබේ.

(i) සංස්ථාව අවස්ථා 512 කදී එකතුව රු.11,468,867 ක් වූ විශේෂ අත්තිකාරම් ලබාදී තිබුණු අතර ඒ අතුරින් අවස්ථා තුනකදී අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව මුළු අත්තිකාරම් මුදලම ආපසු ගෙවා තිබුණි. තවද , අවස්ථා 14 කදී රු.10,000 හෝ ඊට වැඩි මුදලක් ආපසු ගෙවා තිබුණි. ඉන් පෙනී යන්නේ අත්තිකාරම් ගෙවනු ලැබූ මුල් අවස්ථාවේදී නිසි ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බවත් පොදු අරමුදල් අවභාවිතය සඳහා ඉඩකඩ සලසා තිබුණු බවත්ය.

(ii) ඉහත කරුණට අමතරව ලබාගත් අත්තිකාරම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රසම්පාදන නිලධාරින් විසින් අවස්ථා 19 කදී රු.20,000 සිට රු.80,000 දක්වා වූ වියදම් සිය පෞද්ගලික අරමුදල්වලින් දරා තිබුණු අතර සංස්ථාව විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ආ) විශ්‍රාම පාරිතෝෂික සඳහා රු.206,880,216 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනය කර තිබුණු නමුත් ඒ සඳහා වෙනම ආයෝජනයන් සිදුකර නොතිබුණි.

4.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවට අයත් ඉඩමක නිවාස යෝජනා ක්‍රමයක් සංවර්ධනය කර මහජනතාවට විකිණීම සඳහා පෞද්ගලික අංශයේ ආයෝජකයෙකු සමඟ 2007 ජුනි 27 දින සංස්ථාව විසින් ගිවිසුමකට එළඹ තිබුණි. මේ සඳහා රු.489,683,191 ක අත්තිකාරම් මුදලක් සංස්ථාව විසින් ලබාගෙන තිබුණි. කෙසේ වෙතත් ගිවිසුම් දිනයේ සිට වර්ෂ 07 ක් ගතවී තිබුණු නමුත් ආයෝජක විසින් එකඟ වූ පරිදි වැඩ ආරම්භ කර නොතිබුණි. තවද,

සංස්ථාව ගිවිසුම අවලංගු කිරීමෙන් දින 14 ක් තුළ අත්තිකාරම් මුදල ආපසු ගෙවීමට එකඟ වී තිබීම හේතුවෙන් ගිවිසුම අවලංගු කිරීම හා ඉඩමේ අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් සංස්ථාව අවදානමකට මුහුණදී තිබුණි. ඒ අනුව ගිවිසුම අවලංගු කිරීමට හෝ ගිවිසුම නැවත වලංගු කිරීමෙන් සංවර්ධන කටයුතු සඳහා ආයෝජකයා බල ගැන්වීමට කටයුතු කිරීමෙන් තොරව විශාල වාණිජ වටිනාකමක් සහිත ඉඩම වර්ෂ 07 කට වැඩි කාලයක් නිශ්කාර්යව පැවතුණි.

(ආ) රු.5,160,183 පිරිවැයකට අන්තර් ජාල පහසුකම් සහිත සන්නිවේදන ජාල පද්ධතියක් (Intranet System) ප්‍රසම්පාදනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය අංශ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් නිකුත් කළ උපදෙස් සංස්ථාව අනුගමනය කර නොතිබුණි. ඒ අනුව තුන්වැනි ඉහළ මිල කියුම ඉදිරිපත් කළ සැපයුම්කරු තෝරා ගෙන තිබුණි. පද්ධතිය සඳහා සැපයුම්කරු වර්ෂ පහක වගකීමක් ඉදිරිපත් කර තිබුණු නමුත් ඉකුත් වර්ෂවල අඛණ්ඩව පාඩු ලැබීම හේතුවෙන් සැපයුම්කරුගේ ව්‍යාපාරික මෙහෙයුම් හැකියාව සැකසහිත විය. තවද, සැපයුම්කරුගේ ද්‍රවශීලතා අනුපාත අනුව විශාල කාරක ප්‍රාග්ධන දුෂ්කරතාවලට ඔහු මුහුණදී තිබෙන බව නිරීක්ෂණය විය. ඊට අමතරව , අභ්‍යන්තර පරිගණක පද්ධතිය සඳහා ආරක්ෂක පද්ධතියක අවශ්‍යතාවය ආරම්භක අදියරේදීම හඳුනාගෙන නොතිබුණු බැවින් එම සැපයුම්කරු වෙතින්ම ආරක්ෂක මෘදුකාංග ප්‍රසම්පාදනය කිරීම සඳහා රු.610,612 (බදු සමඟ ) ක මුදලක් වැයකර තිබුණි.

(ඇ) සංස්ථාව 2013 අගෝස්තු 24 දින දියත උයනේ පිහිටි දූපත් ප්‍රදේශ හතරක් සඳහා රු.11,863,600 ක පිරිවැයකට සූර්ය බල ශක්ති උත්පාදන පද්ධති ප්‍රසම්පාදනය කර තිබුණි. අදාළ සූර්ය බල ශක්ති ඒකකවල තථ්‍ය අවශ්‍යතාවය තීරණය කිරීමට පදනම් කරගත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. පසුව, දුර්වල කාර්ය සාධනය හේතුවෙන් සංස්ථාව මෙම පද්ධතින් ප්‍රතික්ෂේප කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2014 ජූලි 17 දින සැපයුම්කරු රු.7,944,375 ක මුදලක් පමණක් ආපසු ගෙවා තිබුණි. මේ තත්ත්වය මත ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කිරීමෙන් තොරව 2013 දෙසැම්බර් 31 දින සංස්ථාව නැවත ටෙන්ඩර් කැඳවීමක් සිදුකර කොන්ත්‍රාත්තුව රු.17,478,400 ක පිරිවැයකට වෙනත් පාර්ශවයකට ප්‍රදානය කර තිබුණි.

(ඇ) වෙනත් පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කර තිබුණු මිල කියුම් නොසලකා දියත උයන පරිශ්‍රයේ දිය මලක් ඉදිකිරීම පිළිබඳ කොන්ත්‍රාත්තුව රු.16,950,000 ක පිරිවැයකට ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් සංස්ථාවේ එකඟත්වය ලබාගැනීමෙන් තොරව ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් මෙම කාර්යය බාහිර පාර්ශවයකට පවරා තිබුණි. තවද වැඩ සැලස්මක් අනුමත කිරීමෙන් තොරව අදාළ කාර්යය ආරම්භ කර තිබුණු අතර අදාළ වැඩ සැලැස්ම සංස්ථාව විසින් අනුමත කර තිබුණේ පළමු අතුරු ගෙවීම සිදුකරනු ලැබූ අවස්ථාවේදීය.

### 4.4 ඵල රහිත ගනුදෙනු

---------------------

2013 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබුණු රු.15,349,908 ක් වූ බදු මුදල් අයකර ගැනීමෙන් තොරව 2013 දෙසැම්බර් 31 දින වන විට හිඟව පැවතුණු බව නිරීක්ෂණය විය.

### 4.5 මතභේදයට තුඩුදෙන කරුණු

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව, වාහන ආනයනය කිරීම සඳහා ලියාපදිංචි නොවූ පෞද්ගලික සමාගමකින් රු.11,245,000 පිරිවැයකට විදුලි මෝටර් රථ තුනක් සංස්ථාව ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වෙතත් , ලබාගත හැකි වූ තොරතුරු අනුව, පිරිවැය රක්ෂණ හා නැව් ගාස්තු (CIF Value) සහ දේශීය බදු ඇතුළත්ව රථවල මුළු පිරිවැය රු.4,765,096 ක් විය. ඒ අනුව සැපයුම්කරුගේ දළ ලාභ ආන්තිකය රු.6,479,905 ක් විය. තවද කාර් රථ වල වැසි අංක විගණනය සඳහා ඉදිරිපත් කළ ලේඛනවල ඇතුළත් වූ අංක සමඟ එකඟ නොවූන බව අනාවරණය විය.

(ආ) මහ කොළඹ ජල ගැලීම් පාලන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය, රාගම, මයුරාපුර පිහිටි කළු ඔය ව්‍යාපෘතිය සහ හම්බන්තොට පිහිටි ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ලැබී තිබුණු එකතුව රු.722,769,000 ක් වූ උපයෝජනය නොකළ භාණ්ඩාගාර ප්‍රදානයන් වහාම මහා භාණ්ඩාගාරය වෙත ආපසු යැවීමට කටයුතු කිරීමෙන් තොරව සංස්ථාවේ ගිණුම්වල වර්ෂ කිහිපයක් තුළ පැවතුණි.

(ඈ) සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු දායක මුදල් ගණනය කිරීමේදී අදාළ පනත් සහ චක්‍රලේඛවල නියම කර ඇති රීති හා රෙගුලාසි වලට සංස්ථාව බොහෝ අවස්ථාවල අනුකූල වී නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව අමතර ගෙවීම් සහ ඒ මත පොලී ප්‍රමාණයක් ගෙවිය යුතු වීම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ඈ) 1950 අංක 09 දරන ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය ප්‍රකාර සංවර්ධන කාර්යයන් සඳහා අත්පත් කර ගත් ඉඩම් සම්බන්ධයෙන් වන්දි සහ ඒ මත පොලී මුදල වූ රු.287,214,101 ක මුදලක් 1979 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින වන තෙක් පරිශේෂව පැවතුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව 2012 වර්ෂයේ සිට "මෝටර් ප්‍රොන්ට් ඩිවලොප්මන්ට් කම්පැනි" නැමති පරිපාලිතයෙන් රු.77,706 ක මුදලක් අයවිය යුතු ලෙස දක්වා තිබුණි. කෙසේ නමුත් එවැනි නමක් යටතේ සමාගමක් ක්‍රියාකාරීව නොපවතින බව නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී දියත උයනේ පරිශ්‍රයන් කුලියට ලබාදීමෙන් රු.37,815,000 ක ආදායමක් සංස්ථාව උපයා ගෙන තිබුණි. කෙසේ වෙතත් අදාළ ඉඩමේ නීතිමය හිමිකාරිත්වය සංස්ථාව වෙත පවරා ගෙන නොතිබුණු බැවින් දියත උයනේ පිහිටි දේපල ආදායම් ජනනය කරන වත්කම් වශයෙන් හඳුනාගෙන නොතිබුණි.

## 4.6 දූෂ්‍ය වංචනික ගනුදෙනු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී බර වාහන රියදුරෙකු විසින් ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කිරීමෙන් රු.34,620 ක මුදලක් අයථා ලෙස පරිහරණය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද මෝටර් වාහන අමතර කොටස් හා වෙනත් උපාංග අනවසරයෙන් බැහැර කර තිබුණු අවස්ථා 05 ක් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව පස් ප්‍රවාහනය කිරීම සඳහා රු.6,000,000 ක පිරිවැයකට කොන්ත්‍රාත්තුව සඳහා ඉදිරිපත් වූ එකම ලංසුකරු වූ කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද එම සැපයුම්කරු කොන්ත්‍රාත්තුව සඳහා ලංසු කැඳවීමට පෙර ලංසු ලියකියවිලි ඉදිරිපත් කර තිබුණු බැවින් මෙම ගනුදෙනුවේ වංචනික ස්වභාවය දෘශ්‍යමාන විය.

## 4.7 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

රු.89,114,981 ක් වූ විවිධ වර්ග යටතේ වූ තොග විෂයයන් සෙමින් චලනය වෙමින් පැවතුණු බව අනාවරණය වූ අතර ඒ අතුරින් රු.33,681,466 ක් වටිනා තොග විෂයයන් වර්ෂ 05 කට වැඩි කාලයක් ගබඩාවල පැවතුණි.

## 4.8 හඳුනාගත් පාඩු

නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 14 ක නියෝජනයක් වූ ආශ්‍රිත සමාගමක ආයෝජනය කළ රු.2,000,000 ක කොටස් ප්‍රාග්ධනයෙන් එම සමාගම ඈවර කරමින් පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු මූල්‍ය ප්‍රතිලාභයක් ලැබී නොතිබුණු අතර ආයෝජනය ලියා හැරීම සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදනයන් කර තිබුණි.

## 4.9 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 1,525 කින් සමන්විත විය යුතු වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 1,317 දෙනෙකු පමණක් විය. ඒ අනුව 2013 දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩු 208 ක් පිරවීමට සංස්ථාව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. තවද, එම දිනට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 45 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අතරතුර සමාලෝචිත වර්ෂය තුළදී සඳහා තාවකාලික පදනම මත පරිපාලිතයේ සේවකයින් සංස්ථාවේ කටයුතු සඳහා සේවයේ යොදවා තිබුණු අතර ඔවුන්ට රු.793,689 ක දිරිදීමනා සෘජුවම ගෙවා තිබුණි.

## 5. ගිණුම්කටයුතු භාවය සහ යහ පාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

දිවයින පුරා පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම සංස්ථාව වෙත පවරා තිබෙන කාර්යයන් වේ. කෙසේ වෙතත් කාර්ය අදාළ පැවරුම් යටතේ සිදුකළ යුතු කාර්යයන් 2013-2017 සංයුක්ත සැලැස්මේ හෝ 2013 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2012 වර්ෂයේ ආරම්භ කර තිබුණු ව්‍යාපෘති 10 ක් ඇතුළත්ව ව්‍යාපෘති 78 ක් යටතේ ක්‍රියාත්මක කළ යුතු කටයුතු සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව වාර්ෂික පදනමින් සිදුකළ යුතු කටයුතු ක්‍රියාකාරී සැලසුම් මඟින් ඵලදායී ලෙස හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය වේ.

### 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

සංස්ථාවේ මූල්‍ය හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව පාලනය කිරීමට හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම යටතේ හඳුනාගත් කටයුතු පිළිබඳ ප්‍රගතිය 2006 මාර්තු 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

### 5.4 අභ්‍යන්තර පාලනය

කළමනාකරණය විසින් නිවැරදි කළ යුතු ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මඟ පෙන්වීම් සඳහා වැදගත් උපකරණයක් ලෙස අභ්‍යන්තර විගණනය යොදා ගත යුතු වුවත් මහා පරිමාණ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු ලෙස සංස්ථාවේ කාර්යයන් පුළුල් වීමත් සමඟ අර්ථාන්විත ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය බලගැන්වීම සඳහා සංස්ථාව විසින් නිසි අවධානයක් යොමු කර නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

------------------------------

හාරා ගොඩ දැමීම් කටයුතු මුහුදු වැලි විකිණීම, උපදේශක සේවා සහ දඩ මුදල් මත ආදායම් සහ හාරා ගොඩ දැමීම් කටයුතු මත වියදම් විවිධ වියදම් යනාදිය සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයන් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5.6 ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද විසඳී නොමැති කරුණු

---------------------------------------------------------------------------

ඉකුත් විගණන වාර්තාවලින් පෙන්වා දෙන ලද පහත සඳහන් කරුණු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නොවිසඳී පැවතුණි.

(අ) අදාළ පාර්ශ්වයන්ගෙන් අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සංස්ථාව විසින් කාර්ය මණ්ඩලය වෙත වෘත්තීය දීමනා ගෙවීම අඛණ්ඩව සිදුකර තිබුණි.

(ආ) සංස්ථාවේ අදාළ නිලධාරීන් වෙත වාහන ණය මත පොළිය අඛණ්ඩව ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ඇ) සංස්ථාව විසින් රු.මිලියන 30.2 ක පිරිවැයක් දරා සංවර්ධනය කරන ලද අක්කර 3.5 ක් වූ ඉඩමක, ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ සහයෝගය මත කෝවිලක් ඉදිකළ පාර්ශ්වයකට එරෙහිව නීතිමය පියවර කඩිනමින් ගන්නා ලෙස 2012 නොවැම්බර් 31 දින පැවැත්වූ රැස්වීමේදී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණි. කෙසේ වෙතත් , අදාළ නියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා සංස්ථාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

5.7 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

-----------------------------------------

දිවයින පුරා සිදුකරනු ලබන අනවසර ඉඩම් ගොඩකිරීම් මගින් බොහෝ පාරිසරික හා සමාජ ප්‍රශ්න නිර්මාණය කර තිබුණු අතර ඒවා අනාගත පරම්පරාවන් වෙතද බලපානු ඇත. කෙසේ වෙතත් , සංස්ථාව ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට සහ එවැනි අනවසර ඉඩම් ගොඩකිරීම් වැළැක්වීමට සංස්ථාවට පැවරී ඇති බලතල සංස්ථාව විසින් යොදා ගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ප්‍රසම්පාදන

(ආ) වන්දි ගෙවීම්

(ඇ) •ගිණුම්කරණය

(ඇ) අත්තිකාරම් නිරවුල් කිරීම

**ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න**

**විගණකාධිපති (වැඩබලන)**

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

**2013.01.01 සිට 2013.12.31 දින දක්වා වූ වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා**

| | සටහන | | 2013 | 2012 |
|---|---|---|---|---|
| | | | **Rs.000** | Rs.000 |
| ආදායම | 1 | | **1,478,028** | 2,173,919 |
| විකුණුම් පිරිවැය | 2 | | **1,166,777** | 1,681,228 |
| **දළ ලාභය** | | | **311,251** | 492,691 |
| ලැබුනු මුළු භාණ්ඩාගාර අරමුදල් | | **1,024,999** | | 926,390 |
| දරන ලද මුළු පිරිවැය | | **(1,024,999)** | **-** | (1,069,284) |
| | | | | (142,894) |
| වෙනත් මෙහෙයුම් ආදායම් | 3 | | **54,162** | 60,533 |
| පරිපාලන වියදම් | 4 | **(430,058)** | | (445,421) |
| වෙනත් මෙහෙයුම් වියදම් | 5 | **(200,569)** | | (128,197) |
| | | **(630,627)** | | (573,618) |
| භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති සඳහා පොදු කාර්ය පිරිවැය | | **200,396** | | - |
| | | | **(430,231)** | (573,618) |
| **මෙහෙයුම් වලින් ගත් ලාභ/(අලාභ)** | | | **(64,818)** | (163,288) |
| මූල්‍ය පිරිවැය | 6 | | **(13,754)** | (21,032) |
| මෙහෙයුම් නොවන ආදායම් | 7 | | **196,867** | 216,791 |
| **බදු සහ අයකිරීම් පෙර ලාභය/(අලාභ)** | | | **118,295** | 32,471 |
| ඒකාබද්ධ අරමුදලට අයකිරීම් | | | **-** | (75,000) |
| **බදු පෙර ලාභ/(අලාභ)** | | | **118,295** | (42,529) |
| බදුකරණය සඳහා ප්‍රතිපාදන | 8 | | **(14,396)** | (25,646) |
| **වර්ෂය සඳහා බදු පසු ලාභය/(අලාභය)** | | | **103,899** | (68,175) |

වරහන් තුල ඇති අගයන් අඩු කිරීම් පෙන්නුම් කෙරේ.

පිටු අංක 77 සිට 93 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

## සම අයිතියේ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය

**2013.01.01 සිට 2013.12.31 දින දක්වා වූ වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා**

| | දායක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිතය | ආදායම් සංචිතය | එකතුව |
|---|---|---|---|---|
| | **රු.000** | **රු.000** | **රු.000** | **රු.000** |
| 2012.01.01 දිනට ශේෂය | 1,000 | 13,461 | 2,056,136 | 2,070,597 |
| වර්ෂය සඳහා ලාභ/(අලාභ) | - | - | (68,175) | (68,175) |
| 2012.12.31 දිනට ශේෂය | 1,000 | 13,461 | 1,987,961 | 2,002,422 |
| 2013.01.01 දිනය ශේෂය | 1,000 | 13,461 | 1,987,961 | 2,002,422 |
| වර්ෂය සඳහා ලාභ/(අලාභ) | - | - | 103,899 | 103,899 |
| 2013.12.31 දිනට ශේෂය | 1,000 | 13,461 | 2,091,860 | 2,106,321 |

පිටු අංක 77 සිට 93 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
**දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වාර්තාකරණ කාලපරිච්ඡේදයට**

| | සටහන් | 2013<br>රු.000 | 2012<br>රු.000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත සහ උපකරණ | 9 | **704,214** | 398,956 |
| දේපල ආයෝජන | 10 | **501,354** | 501,354 |
| අනුබද්ධිත ආයතන වල ආයෝජන | 11 | **2,000** | 2,000 |
| වෙනත් ආයෝජන | 12 | **-** | 793,045 |
| | | **1,207,568** | 1,695,355 |
| **ජංගම වත්කම්** | | | |
| ඉන්වෙන්ටරි | 13 | **3,630,170** | 3,007,366 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් | 14 | **616,265** | 509,039 |
| තැන්පතු හා පූර්ව ගෙවීම් | | **10,484** | 8,197 |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් | | **41,381** | 45,537 |
| මුදල් හා මුදල්වලට සමාන දේ | 15 | **863,613** | 396,999 |
| **මුළු ජංගම වත්කම්** | | **5,161,913** | 3,967,138 |
| **මුළු වත්කම්** | | **6,369,481** | 5,662,493 |
| **සම කොටස් හා බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය හා සංචිත** | | | |
| දායක ප්‍රාග්ධනය | | **1,000** | 1,000 |
| ප්‍රාග්ධන සංචිතය | | **13,461** | 13,461 |
| ආදායම් සංචිතය | | **2,091,860** | 1,987,961 |
| **මුළු ප්‍රාග්ධනය හා සංචිත** | | **2,106,321** | 2,002,422 |
| **ජංගම නොවන බැරකම්** | | | |
| ඉඩම් සඳහා වන්දි | | **328,351** | 580,305 |
| වෙනත් ජංගම නොවන බැරකම් | 16 | **772,764** | 470,817 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | **209,469** | 273,605 |
| විලම්භිත බදු | | **(60,393)** | (56,341) |
| **ජංගම නොවන මුළු බැරකම්** | | **1,250,191** | 1,268,386 |

## මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ඉදිරියට..)

**දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වාර්තාකරණ කාලපරිච්ඡේදයට**

| | සටහන | **2013**<br>**රු.000** | 2012<br>රු.000 |
|---|---|---|---|
| **ජංගම බැරකම්** | | | |
| විශේෂ ව්‍යාපෘති පිළිබඳ බැරකම් | 17 | **1,146,384** | 733,960 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් | 18 | **1,872,674** | 1,634,572 |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් | | **26,713** | 37,931 |
| බදු ගෙවීම් | | **(33,996)** | (14,778) |
| බැංකු අයිරා | 15 | **1,194** | - |
| **මුළු ජංගම බැරකම්** | | **3,012,969** | 2,391,685 |
| **මුළු සම කොටස් සහ බැරකම්** | | **6,369,481** | 5,662,493 |

අධ්‍යක්ෂ මණ්ඩල සඳහා සහ වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

සභාපති　　　　සාමාන්‍යාධිකාරී　　　　නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය)

26.02.2014

# මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය
දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2013<br>රු.000 | 2012<br>රු.000 |
|---|---|---|
| **ක්‍රියාකාරී කටයුතු වලින් අරමුදල් ලැබීම** | | |
| බදු පෙර මෙහෙයුම් ලාභය / (පාඩුව) | **118,295** | (42,530) |
| පසුගිය වර්ෂ සඳහා වෙනත් ගැලපීම් | - | 60,718 |
| | **118,295** | 18,188 |
| <u>ගැලපීම් (පහත සඳහන් දේ සඳහා)</u> | | |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **(57,629)** | 17,550 |
| ක්ෂය සඳහා ප්‍රතිපාදන | **79,916** | 70,468 |
| ණය හිලව්- බදු ඉඩම් | **24** | 24 |
| විකිණූ ඉඩම් වන්දි සඳහා ප්‍රතිපාදන | **2,369** | 4,933 |
| සෙමෙන් සංසරණය වන ඉන්වෙන්ට්‍රි සඳහා ප්‍රතිපාදන | **3,686** | 996 |
| අවිනිශ්චිත ණයගැතියන් සඳහා ප්‍රතිපාදන | **(11,775)** | (80,894) |
| කපා හල බොල් ණය | - | 28,192 |
| REEL හි ආයෝජන සඳහා ප්‍රතිපාදන | - | 2,000 |
| පොළී ආදායම | **(94,579)** | (152,606) |
| ස්ථාවර වත්කම් සහ අළුත්වැඩියා කල නොහැකි භාණ්ඩ විකිණීමෙන් ලත් ලාභය | **(2,440)** | (892) |
| බදු සඳහා වැඩිපුර වෙන්කිරීම් | - | (1,515) |
| | **37,866** | (93,556) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් කටයුතු වලින් ලැබුණු ලාභය** | | |
| ඉන්වෙන්ට්‍රි (වැඩිවීම) / අඩුවීම | **(650,812)** | (363,601) |
| කෙරීගෙන යන වැඩ - ස්වකීය ව්‍යාපෘති සංවර්ධනය (වැඩිවීම) / අඩුවීම | **(73,141)** | 6,574 |
| කෙරීගෙන යන වැඩ - සේවා ලාභීන්ගේ ව්‍යාපෘති සංවර්ධනය (වැඩිවීම) / අඩුවීම | **(137,464)** | 38,213 |
| අනෙකුත් ව්‍යාපෘති පිරිවැය මත නිම කල වැඩ (වැඩිවීම)/ අඩුවීම | **8,778** | 1,519 |
| තැන්පතු සහ පූර්ව ගෙවීම් - (වැඩිවීම) / අඩුවීම | **(2,287)** | 969 |
| සේවයේ යෙදවීම වෙනුවෙන් ගෙවූ අත්තිකාරම් - (වැඩිවීම) / අඩුවීම | **(25,884)** | 98,733 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල් - (වැඩිවීම) / අඩුවීම | **(53,587)** | (103,656) |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම) | **4,156** | 55,653 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම) | **643,912** | (1,905,119) |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් - වැඩිවීම / (අඩුවීම) | **(11,219)** | 35,077 |
| **මෙහෙයුම් වලින් උත්පාදිත/(යෙදවූ) මුදල්** | **(259,682)** | (2,229,194) |
| ගෙවන ලද පාරිතෝෂික | **(6,507)** | (10,047) |
| ගෙවන ලද ආදායම් බදු | **(37,658)** | (21,367) |
| මෙහෙයුම් වලින් උත්පාදිත/(භාවිතා කල) ශුද්ධ මුදල් | **(303,847)** | (2,260,608) |

## මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය (ඉදිරියට.,)

දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

| | 2013<br>රු.000 | 2012<br>රු.000 |
|---|---|---|
| **ආයෝජන කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම | **(76,627)** | (164,733) |
| විලම්භිත බැරකම් සඳහා ආයෝජන | **793,045** | (15,561) |
| ලැබුණු පොලී ආදායම | **78,598** | 125,366 |
| ස්ථාවර වත්කම් සහ අළුත්වැඩියා කළ නොහැකි භාණ්ඩ විකිණීමෙන් ලත් මුදල් | **2,502** | 1,047 |
| **ආයෝජන කටයුතු වලින්/(යෙදවූ) ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය** | **797,518** | (53,881) |
| **මූල්‍ය කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහය** | | |
| ගෙවන ලද පොළී සහ වන්දි | **(28,251)** | (10,955) |
| | | - |
| **මූල්‍ය කටයුතු වලින් ලත්/(යෙදවූ) ශුද්ධ මුදල** | **(28,251)** | (10,955) |
| වර්ෂය තුල මුදල් සහ මුදල් හා සමාන ද්‍රව්‍යයන්හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | **465,420** | (2,325,444) |
| වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් සමාන අයිතම | **396,999** | 2,722,443 |
| වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් සමාන අයිතම (A - සටහන) | **862,419** | 396,999 |

A - සටහන

| | | |
|---|---|---|
| අතේ සහ බැංකුවේ ඇති මුදල් | **36,975** | 46,741 |
| ස්ථාවර තැන්පතු | **826,638** | 200,000 |
| තාවකාලික අතිරික්ත භාරය | - | 150,258 |
| Repo | - | - |
| | **863,613** | 396,999 |
| බැංකු අයිරාව | **(1,194)** | - |
| | **862,419** | 396,999 |

පිටු අංක 77 සිට 93 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඒකාබද්ධ කොටසකි.

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

### 1. ගිණුම්ගත කිරීමේ පදනම

පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය මගින් පනවා ඇති 2011 SLFRS/LKAS ගිණුම් ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කර ඇත. උද්ධමනකාරී තත්ත්වය මත ගිණුම්වලට ඇති වන බලපෑම් වෙනුවෙන් ගැළපීම් කර නැත. මෙහි පසුව දැක්වෙන සටහන් මගින් අවශ්‍ය පරිදි වැදගත් ගිණුම් ප්‍රතිපත්ති විස්තර කර ඇත.
සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති නිත්‍ය වශයෙන් යොදාගෙන ඇති අතර ඒවා පසුගිය වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ ස්ථාවර වන අතර වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම් හා අනුකූල වන පරිදි පසුගිය වර්ෂයේ සංඛ්‍යා අවශ්‍ය තැන්වලදී ප්‍රතිසංවිධානය කර ඇත.

<u>ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම</u>

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශය එයට අනුබද්ධිත ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ (පෞද්.) සමාගමෙන් සමන්විත වේ.

සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති නිත්‍ය වශයෙන් යොදාගෙන ඇති අතර ඒවා පසුගිය වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ ස්ථාවර වන අතර වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම් හා අනුකූල වන පරිදි පසුගිය වර්ෂයේ සංඛ්‍යා අවශ්‍ය තැන්වලදී ප්‍රතිසංවිධානය කර ඇත.

සංස්ථාව සහ සමූහය විසින් යොදා ගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පසුගිය වර්ෂය හා ස්ථාවර වේ.

එක හා සමාන තත්ත්වයන් තුළදී සමාන ගනුදෙනු/අවස්ථා සඳහා සමාන ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කරමින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති අතර අවශ්‍ය තැන්වලදී මූල්‍ය ප්‍රකාශන වල යෝග්‍ය ගැලපීම් සිදු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත. වරහන් තුල ඇති සංඛ්‍යා වලින් අඩුකිරීම් පෙන්නුම් කෙරේ.

සංස්ථාව සහ එහි අනුබද්ධිත ආයතනයට දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් පවතී.

### 2. වත්කම් සහ ඒවා තක්සේරු කිරීමේ පදනම

#### 2.1 දේපළ පිරියත සහ උපකරණ

දේපළ පිරියත සහ උපකරණවල ගැණුම් මිලෙන් හෝ ඉදි කිරීමේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩුකර දක්වා ඇත. මිලදී ගැනීමේ හෝ ඉදි කිරීමේ පිරිවැයට අදාළ වත්කම් අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කළ හැකි තත්ත්වයට ඒවා ගෙන ඒම සඳහා ආදේශ කළ හැකි යම් පිරිවැයක් වේ නම් එයද ඇතුළත් වේ.
මහ කොළඹ ගංවතුර වැළැක්වීමේ හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති යටතේ ලැබුනු ගොඩනැගිලි, පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, දේපළ පිරියත සහ උපකරණ යටතේ ඇති වෙනම අයිතමයක් වශයෙන් දක්වා ඇත.
ලුනාව පරිසර වැඩි දියුණු කිරීමේ සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය සහ කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලැබුණු වතකම් දේපළ පිරියත සහ උපකරණ යටතේ වෙනම ගිණුම්ගත කර ඇත.

අමාත්‍යාංශ වලින් නොමිලේ ලැබුනු වාහන තක්සේරු කර වෙනමම ගිණුම්ගත කර ඇත.

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

**2.2** ක්ෂය වීම

අනෙක් සියලුම ස්ථාවර වත්කම් සඳහා ඒවායේ අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලය සඳහා සෘජු රේඛා පදනම මත ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ. මේ සඳහා භාවිතා කෙරුණු වාර්ෂික අනුපාත ප්‍රමාණයන් මෙසේය:

| | |
|---|---|
| ස්ථිර ගොඩනැගිලි | 5% |
| අර්ධ ස්ථිර ගොඩනැගිලි | 10% |
| ගෘහ භාණ්ඩ සහ උපකරණ | 10% |
| කාර්යාලීය උපකරණ | 12.5% |
| පිරියත සහ යන්ත්‍ර සූත්‍ර, වාහන සහ උපකරණ | 25% |
| සන්නිවේදන උපකරණ | 25% |
| බයිසිකල් සහ කුඩා කම්හල් උපකරණ | 50% |
| කන්ටේනර් නිවාස | 10% |

ඉඩම්වල පිරිවැය කපා හැරීම සඳහා ක්ෂය කිරීම් සපයා නොමැත.

වර්ෂය තුළ මිලට ගත් වත්කම් සඳහා ද පහත පෙන්වා ඇති පදනම මත ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදනය කර ඇත.

(1) මාර්තු 31 දිනට පෙර මිලදී ගෙන ඇත්නම් - සම්පූර්ණ වාර්ෂික ක්ෂය කිරීම්
(2) අප්‍රේල් 01 සහ ජුනි 30 අතර මිලදී ගෙන ඇත්නම් - සම්පූර්ණ වාර්ෂික ක්ෂය කිරීම්වලින් ¾ක්
(3) ජූලි 01 සහ සැප්. 30 අතර මිලදී ගෙන ඇත්නම් - සම්පූර්ණ වාර්ෂික ක්ෂය කිරීම්වලින් ½ක්
(4) ඔක්. 01 සහ දෙසැ. 31 අතර මිලදී ගෙන ඇත්නම් - සම්පූර්ණ වාර්ෂික ක්ෂය කිරීම්වලින් ¼ක්

අපහරණ වර්ෂය තුළ ක්ෂය කිරීම් කිසිවක් අය නොකෙරේ.

**2.3** ඉන්වෙන්ටරි (තොග)

සාමාන්‍ය තොග ප්‍රකාශ කර ඇත්තේ ‘පෙර පිවිසි පෙර නිකුත්’ (FIFO) පදනම මත පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමින් අඩු අගයට වේ. යල් පිනු සහ මන්දගාමී තොග සඳහා අවශ්‍ය අවස්ථාවලදී විධිවිධාන සලසා ඇත.

අපතේ යෑම සඳහා යම් ප්‍රතිශතයක් ඇතුලත්ව හැරීමේ පිරිවැය පමණක් සැලකිල්ලට ගෙන මුහුදු වැලි තොගය තක්සේරු කර ඇත.

**2.4** දැනට කෙරෙමින් පවතින කාර්යයන්

ශේෂ පත්‍රයේ දිනට ක්‍රියාත්මක වන දිගු කාලීන ව්‍යාපෘති හා සම්බන්ධ වැඩ කටයුතු මීට අයත් වේ. ඒවා තක්සේරු කර ඇත්තේ ඒ යටතේ දරා ඇති සෘජු වියදම් හා එම ව්‍යාපෘති හා සම්බන්ධ ඇස්තමේන්තුගත පොදු පිරිවැය ගාස්තුවලින් සමන්විත පිරිවැය අනුවය.

**2.5** පිරිවැයට නිම කර ඇති කාර්යයන්

ශේෂ පත්‍රයේ දිනට සැබවින්ම වාගේ නිම කර ඇති වැඩ මේවායින් නියෝජනය වන්නේය. ව්‍යාපෘතියේ ඉහළ වටිනාකම හේතුවෙන් මුතුරාජවෙල වැලි පිරවීමේ ව්‍යාපෘතිය යටතේ නිම කරන ලද කාර්යයන් වල පිරිවැය වෙනම අයිතමයක් වශයෙන් දක්වා ඇත.

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

**2.6** වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්

ණය ගැතියන් සම්බන්ධයෙන් දක්වා ඇත්තේ ඔවුන්ගේ ලැබිය යුතු යැයි ඇස්තමේන්තු කර ඇති මුදල් ප්‍රමාණය වේ. එක් වර්ෂයකට වඩා වැඩි කාලයක් තිස්සේ පවතින බොල් සහ අවිනිශ්චිත ණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ගිණුම්වල සලසා තිබේ.

**2.7** මුදල් හා මුදල් සමාන දේ

මුදල් හා මුදල් සමාන දේ අර්ථ නිරූපණය කර ඇත්තේ අත ඇති මුදල් ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ක්ෂණිකවම මුදල් කළ හැකි වුවද වටිනාකම් වෙනස්කම් සම්බන්ධයෙන් නොසැලකිය යුතු තරම් සුළු අවදානමට යටත් වන්නා වූ ද ද්‍රවශීල ආයෝජන වශයෙනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් හා මුදල්වලට සමාන දේ සමන්විත වන්නේ අත ඇති මුදල්, රෙපෝ සහ භාණ්ඩාගාර බිල්පත් ඇතුලත් වන බැංකු තැන්පතු සහ බැංකු අයිරාවල ශුද්ධ අගය වේ.

**2.8** රජයේ අධාර මුදල්

දීර්ඝ කාලීන වත්කම් අකාරයෙන් ලැබුනු රජයේ ආධාර විලම්භිත අදායම් ලෙස හඳුනාගෙන ඇති අතර වත්කමෙහි ප්‍රයෝජ්‍ය ජීව කාලය මතින් ලැබෙන ආදායමක් ලෙස වාර්ෂිකව හඳුනාගෙන ඇත. සම්පත් පැවරීමක ආකාරයෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලැබුනු රජයේ ආධාර (දීර්ඝ කාලීන වත්කම් හැර) විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සම්පූර්ණයෙන් හඳුනාගෙන ඇත. රජයේ අධාර හා බැඳුනු කොන්දේසි හා අවිනිශ්චිතා සලකා බලනු ලබන අතර අනාවරණය කරනු ඇත.

## 3. බැරකම් සහ ප්‍රතිපාදන

**3.1** අර්ථ දැක්වූ ප්‍රතිලාභ සැලසුම්

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු ඉවත්ව යාමේ ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ගිණුම්වල සලසා ඇත. සංස්ථාවේ අවුරුදු 05ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් මෙම ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබන අතර පළමු සේවා වර්ෂයේ පටන් ඒ සඳහා හිමිකම් ලබයි. මෙම බැරකම් සඳහා බාහිර ප්‍රතිපාදන නොලැබේ. පාරිතෝෂික සඳහා වෙන්කිරීම 2013 වර්ෂයේදී ආයුගණක ලෙස අගය කර ඇත.

### 3.1.1 අර්ථ දැක්වූ දායකත්ව සැලසුම

(අ) **සේවක අර්ථසාධක අරමුදල**
සේවක අර්ථසාධක අරමුදල සඳහා සංස්ථාව 12% කින් සහ සේවකයින් 10% කින්ද දායක වේ. ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් මේ සඳහා වියදම් වශයෙන් හඳුනාගෙන ඇති මුළු මුදල රු.මි. 84.87 කි.

(ආ) **සේවක භාරකාර අරමුදල**
ඉහත අරමුදල සඳහා සංස්ථාව 3% කින් දායක වේ. ප්‍රවර්ථන වර්ෂය සඳහා මේ වෙනුවෙන් වැය වේ යැයි හඳුනා ගෙන ඇති මුදල රු.මි. 11.57 කි.

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

### 3.2 විගණන ගාස්තු

2012 වර්ෂය සඳහා විගණන ගාස්තු මත පදනම්ව 2013 වර්ෂය සඳහා විගණන ගාස්තු සකසා ඇත.

### 3.3 (i) ආදායම් බදු

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත සහ එහි සංශෝධනවල ප්‍රතිපාදනවලට අනුකූලව බදු ගෙවීම සඳහා ගළපා ඇති අවුරුද්දේ ලාභය පදනම් කර ගෙන ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

### 3.3 (ii) විලම්භිත බදු

බැරකම් ක්‍රමය මත විලම්භිත බදු සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර විලම්භිත බදු ගිණුමේ ශේෂයෙන් මඟින්:

i) ක්ෂය දීමනා අයකරගනු ලබන වත්කම්වල බදුකරණ අභිමතාර්ථය සඳහා ලියාහල අගය සහ එවැනි වත්කම්වල ශුද්ධ පොත් අගයෙහි වෙනස සඳහා අදාල කරගත හැකි ආදායම් බදු

ii) විශ්‍රාම ප්‍රතිලාභ සඳහා වෙන්කිරීම් මඟින් පැනනඟින කාල වෙනස සඳහා අදාල කරගත හැකි ආදායම් බදු

නියෝජනය වේ.

### 3.4 පොදු කාර්යය පිරිවැය

2013 වර්ෂය සඳහා සංස්ථාව බොහෝවිට භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති සිදු කර ඇති ඇත. එබැවින්, භාණ්ඩාගාර අරමුදල් ලැබූ ව්‍යාපෘති සඳහා පොදු කාර්යය පිරිවැයෙන් 30% කට සමාන මුදලක් අයකර ඇත.

## 4. ආදායම් ප්‍රකාශනය

### 4.1 පිරිවැටුම

පිරිවැටුම මගින් ඉන්වොයිස් අගය / වර්ෂය තුළදී සිදු කරන ලද සහතික කල කාර්යයන් නියෝජනය කරනු ලබන නමුත් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ වන ව්‍යාපෘතිවලට ලබා දුන් සේවාවන් මෙයට ඇතුළත් නොවේ.

පහත සඳහන් මාර්ග තුළින් ලැබෙන ආදායම්වලින් පිරිවැටුම සමන්විත වේ:

(1) සංවර්ධනය කළ ස්වකීය ඉඩම් විකිණීමෙන්
(2) සේවාලාභීන් සඳහා සිදු කරන ඉඩම් ගොඩකිරීමේ කාර්යයන්ගෙන්
(3) හෑරීම් කටයුතු
(4) ඉදිකිරීම්වලින්
(5) ඉඩම් බදු දීමෙන්
(6) මුහුදු වැලි විකිණීමෙන්
(7) ඉඩම් නිරවුල් සහතික නිකුත් කිරීමෙන්
(8) උපදේශන සේවාවන්ගෙන්
(9) විවිධ ව්‍යාපෘතිවලින්

සාමාන්‍යයෙන් ආදායම් ගිණුම්ගත කරනුයේ උපචිත පදනම මතය.

## වැදගත් ගිණුම් ප්‍රතිපත්ති (ඉදිරියට.,)

**4.2** ඉඩම් අලෙවියෙන් ලැබෙන ආදායම් සැලකිල්ලට ගැනීම

ප්‍රසිද්ධ වෙන්දේසි මගින් ඉඩම් විකුණන විට මුළු අලෙවි මිලම ආදායම් ලෙස සලකනු ලබයි. ශේෂ පත්‍ර දිනයට පසු හෝ කලක් යනතුරු ගෙවීම් සිදු කර නැති අවස්ථාවල හා ඒවා නිරවුල් කිරීම පිළිබඳ සැක සහිත අවස්ථාවල හැර අනෙක් සෑම විටම ගැණුම්කරු විසින් ගෙවිය යුතු ශේෂය ඔහුගෙන් ලැබිය යුතු මුදලක් ලෙස සලකනු ලැබේ.

ටෙන්ඩර් මගින් හෝ වෙනත් මඟකින් ඉඩම අලෙවි කිරීමේදී සාමාන්‍යයෙන් පැවරීමේ ඔප්පුව අත්සන් කරන අවස්ථාවේදී නැතහොත් සම්පූර්ණ අළෙවි මුදල් ලැබී ඇති අතර පැවරුම් ඔප්පුව මගින් අළෙවි කිරීම ක්‍රියාත්මක නොවන බවක් දක්නට නැති අවස්ථාවේදී ඉඩමේ විකුණුම් මිල ආදායම ලෙස සලකනු ලැබේ.

**4.3** **ඉදිකිරීම් කොන්ත්‍රාත්තු**

<u>**ආදායම හඳුනා ගැනීම**</u>

කොන්ත්‍රාත්තුවකින් ලැබෙන ප්‍රතිඵලය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට, ශේෂ පත්‍ර දිනට නිම කර ඇති කොන්ත්‍රාත්තුවේ අදියර අනුව කොන්ත්‍රාත් ආදායම හඳුනා ගනු ලැබේ. සහතික කරන ලද සියලුම කාර්යයන් ආදායම් වාර්තාවට ඇතුළත් කර ඇත.

<u>**වියදම හඳුනා ගැනීම**</u>

වර්ෂය තුළ සිදු කරන ලද එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා වූ මුළු පිරිවැය, සහතික කරන ලද කාර්යයන් සේ සැලකූ විට විකුණුම් සඳහා වූ පිරිවැය යටතේ දක්වා ඇත.

කොන්ත්‍රාත්තුවකින් ලැබෙන ප්‍රතිඵලය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට ශේෂ පත්‍ර දිනට නිම කරන ලද කොන්ත්‍රාත්තුවේ අදියර අනුව කොන්ත්‍රාත් වියදම හඳුනා ගනු ලැබේ.

**5.** අති විශේෂ අයිතමයන්

ගිණුම්වලට සම්බන්ධිත සටහන් මගින් අදාල සියළු විස්තර දක්වා ඇත.

**6.** ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසු වැදගත් සිදුවීම් සැලකිල්ලට ගෙන ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී ගිණුම් ප්‍රකාශයේ අදාළ සටහන්වල අවශ්‍ය ගැළපීම් හෝ අනාවරණයන් සිදු කොට ඇත.

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන්

| | 2013<br>රු.000 | 2012<br>රු.000 |
|---|---|---|
| **1 ආදායම** | | |
| ඉඩම් විකිණීම් | **67,139** | 110,843 |
| ගොඩකිරීම් | **51,393** | 39,505 |
| විවිධ ව්‍යාපෘති | **46,362** | 102,736 |
| හෑරීම් | **385,656** | 106,617 |
| ඉදිකිරීම් | **611,375** | 939,421 |
| මුහුදු වැලි | **77,674** | 782,550 |
| මුහුදු වැලි සඳහා මිල ගණන් ඉහළ යෑම | **78,600** | - |
| ඉඩම් කල් බදු දීම | **68,297** | 64,296 |
| උපදේශන සේවා | **5,532** | 14,776 |
| ඉඩම් නිරවුල් කිරීම | **5,251** | 8,846 |
| දියත උයන ව්‍යාපෘතිය | **37,815** | 4,329 |
| සුදුනෙළුම්පුර නිවාස ව්‍යාපෘතිය | **42,934** | - |
| | **1,478,028** | 2,173,919 |
| **2 විකුණුම් පිරිවැය** | | |
| විකුණු ඉඩම් පිරිවැය | **16,682** | 21,573 |
| ගොඩකිරීම් පිරිවැය | **35,888** | 30,462 |
| විවිධ ව්‍යාපෘති පිරිවැය | **57,732** | 46,965 |
| හෑරීම පිරිවැය | **372,181** | 52,968 |
| ඉදිකිරීම් පිරිවැය | **587,618** | 881,026 |
| මුහුදු වැලි පිරිවැය | **86,539** | 648,234 |
| දියත උයන ව්‍යාපෘතියේ පිරිවැය | **10,137** | - |
| | **1,166,777** | 1,681,228 |
| **3 වෙනත් මෙහෙයුම් ආදායම්** | | |
| සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම | **784** | 1,699 |
| දඩ සහ අධිභාර | **678** | 969 |
| විවිධ ආදායම් | **50,210** | 52,128 |
| ස්ථාවර වත්කම් සහ අළුත්වැඩියා කල නොහැකි දෑ විකිණීමෙන් ලත් ලාභ | **2,440** | 893 |
| උපයාගත් විනිමය | **50** | 4,844 |
| | **54,162** | 60,533 |

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන් (ඉදිරියට.,)

| | **2013** | 2012 |
|---|---|---|
| | **රු.000** | රු.000 |
| **4 පරිපාලන වියදම්** | | |
| අධ්‍යක්ෂ ගාස්තු | **891** | 810 |
| වැටුප් හා වේතන | **356,612** | 322,740 |
| කාර්ය මණ්ඩල සුභසාධනය | **12,903** | 12,999 |
| මුද්‍රණය සහ ලිපි ද්‍රව්‍ය | **8,133** | 7,838 |
| දුරකථන හා තැපැල් ගාස්තු | **4,265** | 3,924 |
| වාර සඟරා සහ ප්‍රකාශන | **905** | 332 |
| ගමන් වියදම් සහ යැපීම් | **306** | 370 |
| මෝටර් රථ මෙහෙයුම් නඩත්තු වියදම් | **51,289** | 39,344 |
| කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ සවිකිරීම් නඩත්තුව | **2,628** | 2,798 |
| සාමාන්‍ය වියදම් | **4,498** | 2,218 |
| වෘත්තීය ගාස්තු | **2,656** | 2,495 |
| වෛද්‍ය වියදම් | **15,778** | 15,393 |
| පුහුණු පර්යේෂණ අධ්‍යයනය හා සංවර්ධනය | **4,873** | 1,980 |
| විගණන ගාස්තු | **150** | 450 |
| ප්‍රසාද මුදල් | **16,500** | 13,143 |
| පාරිතෝෂික සහ සේවක වන්දි ප්රතිපාදන | **(57,629)** | 17,550 |
| අත්තිඩිය විකුණු ඉඩම සඳහා වන්දි | **1,614** | 41 |
| හෙමින් සංසරණය වන තොග සඳහා ප්‍රතිපාදන | **3,686** | 996 |
| | **430,058** | 445,421 |

## 5 වෙනත් මෙහෙයුම් ආදායම්

### 5.1 ආයතනික වියදම්

| | | |
|---|---|---|
| ගෙවල් කුලී සහ වරිපනම් | **636** | 1,693 |
| ගොඩනැගිලි නඩත්තු | **5,236** | 9,820 |
| විදුලිය සහ ජලය | **9,794** | 8,610 |
| රක්ෂණ | **5,108** | 4,214 |
| | **20,774** | 24,337 |

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන් (ඉදිරියට.,)

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු.000 | රු.000 |
| 5.2 | **ක්ෂය වීම්** | | |
| | ගොඩනැගිලි | 3,515 | 2,414 |
| | මෝටර් වාහන | 20,281 | 17,327 |
| | මෝටර් වාහන - අමාත්‍යාංශය | 1,000 | 500 |
| | විදුලි මෝටර් රථය | - | 297 |
| | පරිගණක සහ උපාංග | 4,261 | 2,728 |
| | කාර්යාලීය උපකරණ | 1,374 | 1,091 |
| | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 1,241 | 900 |
| | සුහසාධන උපකරණ | 220 | 145 |
| | මැණුම් උපකරණ | 545 | 356 |
| | පාපැදි | 11 | 18 |
| | පරිගණක සහ උපාංග ( වේරුස් ගංගා ව්‍යාපෘතිය) | 57 | 484 |
| | සුහසාධන උපකරණ (වේරුස් ගංගා ව්‍යාපෘතිය) | 2 | 2 |
| | සුහසාධන උපකරණ (MCUDP) | 6 | - |
| | කාර්යාලීය උපකරණ (MCUDP) | 52 | 47 |
| | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් (MCUDP) | 60 | 64 |
| | පරිගණක සහ උපාංග (MCUDP) | 484 | 43 |
| | ලුනාව ප.වැ. හා ප්‍ර.සං.ව. යටතේ වන වත්කම් | 50,896 | 65,442 |
| | MCUDP යටතේ වන වත්කම් | 50,394 | - |
| | | 134,399 | 91,858 |
| 5.3 | **විකුණුම් වියදම්** | | |
| | බොල් ණය සහ අවිනිශ්චිත ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන | (31,773) | (80,894) |
| | බොල් ණය කපා හැරීම් | - | 28,192 |
| | බොල් ණය සහ අවිනිශ්චිත ණය ගැතියන් සඳහා ප්‍රතිපාදන -සුදුනෙළුම්පුර | 19,998 | - |
| | ප්‍රචාරක හා ප්‍රවර්ධන වියදම් | 984 | 3,015 |
| | ප්‍රදර්ශන වියදම් | 4,257 | 6,847 |
| | | (6,534) | (42,840) |
| 5.4 | **වෙනත්** | | |
| | ව්‍යාපෘති සඳහා පොදු කාර්ය වියදම් | (7,004) | (234) |
| | පිරියත සහ යන්ත්‍රෝපකරණ අංශය ශුද්ධ හිඟය/ අතිරික්තය | 21,651 | 36,088 |
| | කොළඹ පුරවර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 37,283 | 18,988 |
| | | 51,930 | 54,842 |
| | | 200,569 | 128,197 |
| 6 | **මූල්‍ය ගාස්තු** | | |
| | බැංකු ගාස්තු | 307 | 219 |
| | විකිණූ ඉඩම් වල වන්දි සඳහා පොළිය | 1,263 | 1,386 |
| | මුද්දර ගාස්තු | 23 | 11 |
| | බදු ඉඩම් සඳහා ණය හිලව් කිරීම | 24 | 24 |
| | ඉදිකිරීම් ගාස්තු | 4,227 | 2,721 |
| | කල්පිත ලාභාංශ බදු | - | 11,351 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 7,910 | 5,320 |
| | | 13,754 | 21,032 |

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන් (ඉදිරියට.,)

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | | රු.000 | රු.000 |
| **7** | **මෙහෙයුම් නොවන ආදායම්** | | |
| **7.1** | පොළී ආදායම් | | |
| | භාණ්ඩාගාර බිල්පත් ආදායම | - | 15,264 |
| | ආයෝජන ආදායම් | **66,177** | 95,049 |
| | Repo පොලී ආදායම | **28,402** | 42,293 |
| | | **94,579** | 152,606 |
| **7.2** | වත්කම් ක්‍රමක්ෂය කිරීම | | |
| | ලුනාව වත්කම් ක්‍රමක්ෂය කිරීම | **50,895** | 65,442 |
| | MCUDP යටතේ වන වත්කම් ක්‍රමක්ෂය කිරීම | **50,393** | - |
| | විදුලි මෝටර් රථය ක්‍රමක්ෂය කිරීම | - | 243 |
| | මෝටර් වාහන - අමාත්‍යාංශය ක්‍රමක්ෂය කිරීම | **1,000** | 500 |
| | | **102,288** | 66,185 |
| 7.3 | REEL හි ආයෝජන සඳහා වෙන්කිරීම් | - | (2,000) |
| | | **196,867** | 216,791 |
| **8** | **බදු වියදම්** | | |
| | ආදායම් බදු සඳහා වෙන්කිරීම් | **18,448** | - |
| | විලම්භිත බදු | **(4,052)** | 25,646 |
| | | **14,396** | 25,646 |
| **8.1** | **ගිණුම්කරණ ආදායම සහ ආදායම් බදු සැසඳීම** | | |
| | බදු පෙර ලාභය /(අලාභය) | **118,295** | (42,529) |
| | පසුගිය වර්ෂයේ ගැලපීම් | - | - |
| | එකතු කලා: අනුමතකල නොහැකි වියදම් | **134,416** | 180,183 |
| | | **252,711** | 137,655 |
| | අඩුකලා: අනුමත කලහැකි වියදම් | **(539,748)** | (437,287) |
| | වෙළඳ ලාභය/(අලාභය) | **(287,037)** | (299,632) |
| | පොළී ආදායම් | **101,365** | 153,810 |
| | 2010/2011 කපා හල අලාභය | **(35,478)** | - |
| | බදුකරණ ආදායම/(අලාභය) | **65,887** | (145,821) |
| | ඒ මත ගෙවිය යුතු අදායම් බදු | **18,448** | |
| | සඵල බදු අනුපාතය | **52%** | 0% |

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන් (ඉදිරියට.,)

### 9 (අ) දේපල, පිරියත හා උපකරණ

| | ඉඩම් සහ ගොඩනැගිලි රු.000 | පිරියත හා යන්ත්‍ර සූත්‍ර රු.000 | රථ වාහන රු.000 | උපකරණ රු.000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 132,091 | 228,311 | 101,644 | 96,417 | 558,463 |
| එකතු කිරීම් | 8,684 | 20,970 | 12,459 | 22,165 | 64,278 |
| බැහැර කිරීම් | - | (1,640) | (210) | (2,904) | (4,754) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 140,775 | 247,641 | 113,893 | 115,678 | 617,987 |
| ක්ෂය වීම් | | | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 73,578 | 154,002 | 40,927 | 43,548 | 312,055 |
| වර්ෂය සඳහා ගාස්තුව | 3,738 | 35,005 | 28,281 | 9,778 | 76,802 |
| බැහැර කිරීම් | - | (2,364) | (210) | (2,005) | (4,579) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 77,316 | 186,643 | 68,998 | 51,321 | 384,278 |
| **ශුද්ධ පොත් අගය** | **63,459** | **60,998** | **44,895** | **64,357** | **233,709** |
| **තක්සේරු කරමින් පවතින මෙවලම්** | | | | | **39,903** |
| **සටහන් අංක 9 (ඇ) ට ගෙන යන ලදී** | | | | | **273,612** |

### 9 (ආ) දේපල, පිරියත හා උපකරණ - GCFC&EIP

| | ඉඩම් සහ ගොඩනැගිලි රු.000 | පිරියත හා යන්ත්‍ර සූත්‍ර රු.000 | රථ වාහන රු.000 | උපකරණ රු.000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 47,605 | 555,811 | 38,327 | 51,419 | 693,162 |
| එකතු කිරීම් | - | - | - | - | - |
| බැහැර කිරීම් | - | (837) | (210) | (13,209) | (14,256) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 47,605 | 554,974 | 38,117 | 38,210 | 678,906 |
| ක්ෂය වීම් | | | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 28,800 | 555,810 | 38,327 | 51,418 | 674,355 |
| වර්ෂය සඳහා ගාස්තුව | 2,380 | - | - | - | 2,380 |
| බැහැර කිරීම් | - | (836) | (210) | (13,209) | (14,255) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 31,180 | 554,974 | 38,117 | 38,209 | 662,480 |
| **ශුද්ධ පොත් අගය** | **16,425** | - | - | **1** | **16,426** |

## 9 (ඇ) දේපල, පිරියත හා උපකරණ – LEI&CDP

| | ඉඩම් සහ ගොඩනැගිලි රු.000 | පිරියත හා යන්ත්‍ර සූත්‍ර රු.000 | රථ වාහන රු.000 | උපකරණ රු.000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 56,125 | 218,427 | 34,228 | 2,879 | 311,659 |
| එකතු කිරීම් | - | - | - | 2,831 | 2,831 |
| බැහැර කිරීම් | - | - | (3,000) | (5) | (3,005) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 56,125 | 218,427 | 31,228 | 5,705 | 311,485 |
| **ක්ෂය වීම්** | | | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | 1,403 | 178,510 | 27,641 | 1,892 | 209,446 |
| වර්ෂය සඳහා ගාස්තුව | 2,806 | 39,917 | 5,294 | 3,094 | 51,111 |
| බැහැර කිරීම් | - | - | (2,812) | (2) | (2,814) |
| ගැලපීම් | - | - | - | (157) | (157) |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 4,209 | 218,427 | 30,123 | 4,827 | 257,586 |
| **තක්සේරු කරමින් පවතින මෙවලම්** | **51,916** | - | **1,105** | **878** | **53,899** |

## 9 (ඇ) දේපල, පිරියත හා උපකරණ - MCUDP

| | ඉඩම් සහ ගොඩනැගිලි රු.000 | පිරියත හා යන්ත්‍ර සූත්‍ර රු.000 | රථ වාහන රු.000 | උපකරණ රු.000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | - | - | - | - | - |
| එකතු කිරීම් | - | 410,650 | - | - | 410,650 |
| බැහැර කිරීම් | - | - | - | - | - |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | | 410,650 | | | 410,650 |
| **ක්ෂය වීම්** | | | | | |
| ඉදිරියට ගෙන ආ ශේෂය | - | - | - | - | - |
| වර්ෂය සඳහා ගාස්තුව | - | 50,394 | - | - | 50,394 |
| බැහැර කිරීම් | - | - | - | - | |
| ගැලපීම් | - | - | - | - | |
| ඉදිරියට ගෙන ගිය ශේෂය | | 50,394 | | | 50,394 |
| **ශුද්ධ පොත් අගය** | - | **360,256** | - | - | **360,256** |
| **තක්සේරු කරමින් පවතින මෙවලම්** | | | | | **21** |
| **සටහන 9 (අ)** | | | | | **273,612** |
| **සටහන 9 (ආ)** | | | | | **16,426** |
| **සටහන 9 (ඇ)** | | | | | **53,899** |
| | | | | | **704,214** |

## මූල ප්‍රකාශන සඳහා සටහන් (ඉදිරියට.,)

## 10. දේපල ආයෝජන

### බදු ඉඩම් (දීර්ඝ කාලීන පදනම)

මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි දීර්ඝ කාලීන පදනම යටතේ ඉඩම් බදු දීමට සංස්ථාව කටයුතු කොට ඇත. සාමාන්‍යයෙන් සම්පූර්ණ කාලච්ඡේදය සඳහාම වන බදු මුදල කලින් ගෙවා ඇත. එබැවින් සම්පූර්ණ බදු මුදල බදු දී ඇති වසර ගණනින් බෙදීමෙන්, වසරට අදාළ බදු මුදල ගණනය කරනු ලැබේ.

ඒ අනුව, පවත්නා වර්ෂයට සම්බන්ධ ආදායම ආදායම් ප්‍රකාශයේ බැර කොට ඉතිරිය ශේෂ පත්‍රයේ බැරකමක් වශයෙන් දක්වා ඇත.

රු. 501,354,118.73 ක් වන දිගු කාලීන කල්බදු හා සම්බන්ධ ඉඩම්වල වටිනාකම වෙනම අයිතමයක් වශයෙන් කල්බදු ඉඩම් යටතේ ශේෂ පත්‍රයේ දක්වා ඇත.

<u>බදු දී ඇති ඉඩම්වල වටිනාකම</u>

| බදුලාභියාගේ නම | පිහිටීම | ප්‍රමාණය අක්. | රූඩ් | පර්. | කාලය වසර | ඉඩමේ සම්පූර්ණ වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|
| ඒෂියා සියාකා වෙයාර්හවුසිං (පුද්.) සමාගම | මුතුරාජවෙල | 6 | 1 | 28 | 50 | 45,540,400.00 |
| ෂෙල් ටර්මිනල් ලිමිටඩ් | මුතුරාජවෙල | 26 | 0 | 0 | 50 | 184,288.000.00 |
| කලම්බු ජැපනීස් ස්කූල් | ලේක් ඩ්‍රයිව් | 1 | 0 | 12 | 30 | 1,596,100.33 |
| සෙන්චරි ප්‍රොපර්ටි ලිමිටඩ් | වෙදමුල්ල | 3 | 0 | 0 | 50 | 40,913,908.80 |
| ඒ.බී.ඩෙවලප්මන්ට් | වෙදමුල්ල | 1 | 0 | 0 | 50 | 13,637,969.60 |
| පාරාස් ඉන්ඩස්ට්‍රීස් (පුද්.) සමාගම | මුතුරාජවෙල | 3 | 2 | 2 | 50 | 24,896,600.00 |
| ෆෝබ්ස් ඇන්ඩ් වෝකර්ස් වෙයාර් හවුසින්(පුද්.) සමාගම | මුතුරාජවෙල | 4 | 0 | 0 | 50 | 28,352,000.00 |
| ඇකෝ ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් | මුතුරාජවෙල | 4 | 0 | 0 | 50 | 28,352,000.00 |
| ජෝන් කීල්ස් වෙයාර් හවුසින් ලිමිටඩ් | මුතුරාජවෙල | 6 | 0 | 30 | 50 | 43,857,000.00 |
| පිරමිඩ් ලංකා | මුතුරාජවෙල | 6 | 0 | 2 | 50 | 42,616,600.00 |
| ශ්‍රී වාරාග් ලංකා (පුද්.) සමාගම | මුතුරාජවෙල | 4 | 2 | 11 | 50 | 32,383,300.00 |
| ලංකා විදුලිබල මණ්ඩලය | මුතුරාජවෙල | 0 | 0 | 176.8 | 30 | 7,832,240.00 |
| ටෙස් ඇග්‍රෝ ලිමිටඩ් | මුතුරාජවෙල | 1 | 0 | 0 | 30 | <u>7,088,000.00</u> |
| | | | | | | <u>501,354,118.73</u> |

## විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා සටහන් (ඉදිරියට.,)

| | | | 2013 | 2012 |
|---|---|---|---|---|
| | | | රු.000 | රු.000 |
| **11** | **පරිපාලිත සමාගම් වල ආයෝජන** | | | |
